## පළමුවැනි පරිශිෂ්ටය

( අ ) ලංකා පාර්ලිමේන්තුව විසින් 1968 දී පනවන ලද, ප්‍රධාන නීති වලින් උපුටා ගත් මහ බැංකුවේ සහ බැංකු ආයතන කටයුතු හා ගනුදෙනු වලට අදාළ කොටස්.

( ආ ) 1968 දී මුදල් මණ්ඩලය විසින් සකස් කර ගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන.

## (අ) කොටස.

### 1968 අංක 5 දරණ මුදල් නීති (සංශෝධන) පනත

මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා පනතකි.

( අනුමැතිය ලද දිනය : 1968 පෙබරවාරි 28 දින. )

1. මෙම පනත 1968 අංක 5 දරණ මුදල් නීති සංශෝධන පනත යනුවෙන් හැඳින්විය හැක.

2. මුදල් නීති පනතේ 59 වෙනි වගන්තිය අවසන්වනවාත් සමගම පහත සඳහන් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය පනතේ 59 (අ) වගන්තිය සේ ක්‍රියාකාරි වනු ඇත.

59 (අ) (1) යම් අධිකරණයක කිසියම් නඩු විභාගයකදී කාසියක්, නැතහොත් වලංගු කාසියක් යයි සැලකෙන භාණ්ඩයක් එම කාසියේ නැතහොත් වලංගු කාසියේ අනුකරණයක් දැයි තීරණය කළ යුතු වුවහොත්, මහ බැංකුවේ අධිපති විසින් හෝ මහ බැංකුවේ අධිපති තාවකාලිකව රාජකාරි කටයුතු සඳහා නොපැමිණෙන නැතහොත් තාවකාලිකව තමන්ගේ රාජකාරි කටයුතු කිරීමට නොහැකි අවස්ථාවන්හි, මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් එතැන්හි කටයුතු කරන නියෝජ්‍ය අධිපති විසින්, එම භාණ්ඩය කාසියක නැතහොත් වලංගු කාසියක අනුකරණයක් බවත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කොට ඇති නැතහොත් නිකුත් කොට ඇතැයි සැලකෙන කාසියක් නැතහොත් වලංගු කාසියක් නොවන බවත් සඳහන් කරමින් නිකුත් කෙරෙන සහතිකයක්, එම භාණ්ඩය, කාසියක නැතහොත් වලංගු කාසියක අනුකරණයකැයි සනාථ කිරීමට තීරණාත්මක සාක්ෂියක් වශයෙන් එම නඩු විභාගයේදී පිළි ගැනෙනු ඇත.

(2) මෙම වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිගෙන් නැතහොත් නියෝජ්‍ය අධිපතිගෙන් එම සහතිකය සම්බන්ධයෙන් විමසීමට හෝ හරස් ප්‍රශ්න ඇසීමට හෝ නොහැක.

(3) මෙම වගන්තිය යටතේ නිකුත් කෙරෙන සෑම සහතිකයක්ම පහත සඳහන් ආකාරයට විය යුතුය.

3. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති/*ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි තැන ලෙස දැනට ක්‍රියා කරන නියෝජ්‍ය අධිපති වන.............................................. වන මවිසින්, අංක..................දරණ නඩුව සම්බන්ධයෙන් අංක.............. දරණ ලිපිය සමග............................විසින් එවා ඇති මුද්‍රාපිත පාර්සලයෙහි අඩංගු වූ භාණ්ඩය පරීක්ෂා කරන ලද බවත්, එම භාණ්ඩය............................සඳහන් විටිනාකම ඇති කාසියක* වලංගු කාසියක ස්වභාවය ඇත්තක් වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නැතහොත් නිකුත් කළා යැයි සැලකෙන කාසියක* වලංගු කාසියක අනුකරණයක් බවත්, එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නැතහොත් නිකුත් කොට ඇතැයි සැලකෙන කාසියක්*වලංගු කාසියක් නොවන බවත් මෙයින් සහතික කරමි.

අත්සන : ..............................................

දිනය : ..............................................

* නොගැලපෙන වචන කපා හරින්න.

4. මෙම ඡේදය,

(අ) 1967 අගෝස්තු මස 15 දිනට ප්‍රථම සහ ඉන්පසු කරන ලද වැරදි සම්බන්ධ නඩු විභාග, සහ

(ආ) 1967 අගෝස්තු මස 15 දිනට ප්‍රථම විභාගයට පත්වෙමින් තිබී හා එදිනට ප්‍රථම විමර්ශනයට හෝ විභාගයට පත්වීමට ඇති නඩු සම්බන්ධයෙන් බලපානු ඇත.

## 1968 අංක 7 දරණ භාරකාර ( සංශෝධන ) පනත

**භාරකාර ආඥා පනත, සංශෝධනය කිරීම සඳහා පනතකි.**

**( අනුමැතිය ලැබූ දිනය : 1968 පෙබරවාරි මස 28 දින. )**

1. මෙම පනත 1968 අංක 7 දරණ භාරකාර ( සංශෝධන ) පනත යනුවෙන් හැඳින්විය හැකිය.

2. භාරකාර ආඥා පනතෙහි 21 වගන්තියෙහි "කිනම් අවස්ථාවකදී හෝ වැළැක්වීමට" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියළුම වචන වෙනුවට, "භාරකාර මුදල්, ( ලංකා ඉතිරි කිරීමේ බැංකුව ඇතුළු ) ආණ්ඩුවේ ඉතිරි කිරීමේ බැංකුවක තැන්පත් කිරීම වළක්වාලීමට " යන වචන ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මේ මගින් සංශෝධනය වෙයි.

---

## 1968 වර්ෂයේ අංක 21 දරණ මුදල් නීති ( සංශෝධන ) පනත

**මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා පනතකි.**

**( අනුමැතිය ලැබූ දිනය : 1968 ජූනි මස 11 දින. )**

1. මෙම පනත 1968 වර්ෂයේ අංක 21 දරණ මුදල් නීති ( සංශෝධන ) පනත ලෙස හැඳින්විය හැක.

2. 1963 අංක 11 දරණ පනතින් සංශෝධිත ( මෙහි මින්මතු ප්‍රධාන පනත යනුවෙන් හැඳින්වෙන) මුදල් නීති පනතේ 88 (අ) වගන්තිය, පහත සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය වනු ඇත :—

(1) එම වගන්තියෙහි (1) උප වගන්තියේ (ආ) කොටසෙහි, " පොරොන්දුවක් වශයෙන්" යනුවෙන් පටන් ගෙන එම කොටසෙහි අවසානය දක්වා ඇති සියළුම වචන සහ අංක වෙනුවට පහත සඳහන් සේ යෙදීමෙන් :—

> එවැනි කාර්යයක් නැතහොත් කාර්යයන් සම්බන්ධයෙන් එවැනි ආයතනයකට එහි ණයකරුවන්ගෙන් අයවිය යුතු වූ ණය මුදල් ඇප වශයෙන්, සහ

(2) එම වගන්තියෙහි (3) වෙනි උප වගන්තියේ පෙන්නුම් කොට ඇති පැවරුම් පෝර්ම යෙහි,

(අ) " මෙයත් සමග ඇති උප ලේඛනයෙහි සඳහන් වන උකස් යටතේ උකස් හිමියන් වශයෙන් අප හට ඇති අයිතිවාසිකම්, සහ " යන වචන අත් හැරීමෙන්; සහ

(ආ) එම පෝර්මයට අයත් උප ලේඛනයෙහි පහත සඳහන් දෑ අතහැරලීමෙන් :—

" උකස් ඔප්පු අංකය " සහ

එම වගන්තියෙහි (3) වෙනි උප වගන්තියේ " සහ අයිතිවාසිකම් " යන වචන අතහැරලීමෙන්,

3. ප්‍රධාන පනතේ 88(ඉ) වෙනි වගන්තිය පහත සඳහන් අයුරු සංශෝධනය වනු ඇත.

(1) එම වගන්තියෙහි (2) වෙනි උප වගන්තිය ඉවත් කොට එය වෙනුවට පහත සඳහන් අළුත් උප වගන්තිය යෙදීමෙන් :—

(2) (අ) පනතේ මෙම කොටස යටතේ පැවරී ඇති කටයුතු ඉටු කිරීමෙහිලා අවශ්‍ය යැයි හැඟෙන මුදල් ප්‍රමාණ බැංකුවේ සංචිත වලින් විටින් විට අරමුදල වෙත පැවරීමට මුදල් මණ්ඩලයට හැක.

(ආ) ජාත්‍යන්තර මුදල් ආයතන වලින් බැංකුව වෙත ලැබෙන ණය මුදල් ප්‍රමාණ බැංකුව විසින් අරමුදලට ගෙවිය හැක.

(2) මෙම වගන්තියෙහි (3) වෙනි උප වගන්තියේ,

(අ) එම උප වගන්තියෙහි (අ ) කොටසේ ''මෙම පනත; සහ '' යන වචන වෙනුවට '' මෙම පනත '' යන වචන යෙදීමෙන් ;

(ආ) එම උප වගන්තියෙහි (ඈ) කොටසේ '' බැංකුවේ සංචිත '' යන වචන වෙනුවට '' බැංකුවේ සංචිත සහ '' යනුවෙන් යෙදීමෙන්, සහ

(ඇ) එම උප වගන්තියෙහි (ඈ) කොටස අවසන් වනවාත් සමගම පහත සඳහන් අළුත් කොටස ඇතුළත් කිරීමෙන් —

(ඇ) ජාත්‍යන්තර මුදල් ආයතන විසින් බැංකුව වෙත දෙන ලද ණය මුදල් අරමුදලට ගෙවා ඇතිනම් එම ණය මුදල්වල ආපසු ගෙවීම වශයෙන් එම ජාත්‍යන්තර මුදල් ආයතනවලට ගෙවිය යුතු වූ සියළුම මුදල් ප්‍රමාණ ; සහ

(3) එම වගන්තියෙහි (4) වෙනි උප වගන්තියේ '' අරමුදල වෙතට '' යනුවෙන් පටන් ගෙන එම උප වගන්තියේ අවසානය දක්වා ඇති සියළුම වචන සහ අකුරු වෙනුවට පහත සඳහන් ලෙස යෙදීමෙන් :—

'' පනතේ මෙම කොටස යටතේ බැංකුව විසින් ණය දෙන ආයතන වෙත දී ඇති ණය මුදල් සහ අත්තිකාරම් ආපසු ගෙවීම වශයෙන් බැංකුව වෙත ගෙවන ලද නැතහොත් බැංකුව විසින් අය කර ගන්නා ලද සියළුම මුදල් ප්‍රමාණ බැංකුව වෙතට ''

---

## 1968 අංක 28 දරණ විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර පනත

**ලංකා රජය විසින් එහි නියෝජිතයා වූ ලංකා මහා බැංකුව මගින් විදේශ විනිමය හිමිකම් සහතික යෝජනා ක්‍රමයක් පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල විධිවිධාන සැලැස්වීම පිණිස හා එයට සම්බන්ධ හෝ ආනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**( අනුමැතිය ලද දිනය : 1968 ජූනි මස 22 වැනි දින )**

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමැතිය අනුව හා ඇතිව, එහි ම බලය ප්‍රකාර, අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජනිය විසින් මෙසේ පනවනු ලැබේ :—

1. (1) මේ පනත 1968 අංක 28 දරන විදේශ විනිමය හිමිකම් සහතික පනත යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය.

(2) මේ පනතෙහි විධිවිධාන 1968 මැයි මස 6 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය යන් සඳහා සැලකිය යුතු ය.

2. විදේශ විනිමය හිමිකම් සහතික නිකුත් කිරීම, මිලට ගැනීම, විකිණීම, භාරදීම හෝ වෙන යම් ආකාරයකින් ඒ පිළිබඳ ව ක්‍රියා කිරීම කළ හැකිවනු පිණිස වූ යෝජනා ක්‍රමයක් මේ පනතෙහි විධිවිධාන යටතේ සහ ඒවාට අනුකූල ව පිහිටුවීමට හා ක්‍රියාත්මක කිරීමට රජයට මෙයින් බලය පවරනු ලැබේ. ඒ යෝජනා ක්‍රමය මේ පනතෙහි '' යෝජනා ක්‍රමය '' යනුවෙන් සඳහන් කරනු ලැබේ.

3. 2 වන වගන්තියෙන් රජය වෙත පැවරුණු බලය රජයෙහි නියෝජිතයා වශයෙන් මහා බැංකුව විසින් ක්‍රියාවෙහි යෙදවිය යුතු අතර ඒ අනු ව, යෝජනා ක්‍රමය පිහිටුවීමේ හා ක්‍රියාත්

මක කිරීමේ ද මේ පනතෙහි ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවට නැංවීමෙහි හා එලගැන්වීමෙහි ද කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි සියලු බලතල, කාර්යයන් හා යුතුකම් ක්‍රියාවේ යෙදවීම ද, කිරීම ද, ඉටු කිරීම ද, මුදල් ඇමතිවරයා විසින් ඒ සම්බන්ධයෙන් කලින් කල නිකුත් කළ හැකි විධානවලට යටත් ව ඒ බැංකුව විසින්, එකී නියෝජිතයා වශයෙන් කළ හැකි ය.

4. (1) මුදල් ඇමතිවරයා විසින් කලින් කල අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය හැකි නියමයන්ට යටත්ව, කෙලින්ම බැංකුව විසින් හෝ බැංකුව වෙනුවෙන් යම් වානිජ බැංකුවක් මගින් හෝ කලින් කල සහතික නිකුත් කිරීමට මහා බැංකුවට මෙයින් බලය පවරනු ලැබේ. ඒ සහතිකවල ආකෘතිය, සැලැස්ම, වාක්‍යපාඨය, දිග පළල සහ අනිකුත් ලක්ෂණ මහා බැංකුව විසින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

(2) සෑම සහතිකයක් —

(අ) මහා බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ ප්‍රතිරූප අත්සන, සහ විධාන මගින් නිශ්චය කරනු ලැබිය හැකි ගණනක් අත් අත්සන් දැරිය යුතු ය ;

(ආ) මහා බැංකුව විසින්, හෝ සඳහා, හා වෙනුවෙන් නිකුත් කරන ලද බවට එහි මුහුණතෙහි කළ සඳහනක් සහිත විය යුතුය.

(ඇ) එහි නිශ්චිත ව සඳහන් කළ යුතු කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය ; තවද

(ඈ) ලංකාවේ රුපියල් ගණනින් ප්‍රකාශිත මුදල් ප්‍රමාණයක් එහි මුහුණතෙහි දැරිය යුතු ය.

5. වලංගු සහතිකයක් බලය ලත් ගණුදෙනුකරුවකුට භාර දෙනු ලැබූ විට, රජය විසින් කලින් කල අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය හැකි කාර්යයන් සඳහා සහ නියමයනට යටත්ව විදේශ විනිමය මිලට ගැනීමට ඒ සහතිකය දරන්නාට හිමිකම් ලැබිය යුතුය.

6. (1) මහා බැංකුවේ බලය නොමැති ව, —

(අ) යම් සහතිකයක් කපන, සිදුරු කරන, හෝ වෙන කුමන ආකාරයකින් හෝ විකෘති කරන ; හෝ

(ආ) යම් සහතිකයක් මත යම් කිසිවක් මුද්‍රණය කරන, මුද්‍රා තබන, හෝ අඳින හෝ යම් සහතිකයකට හෝ සහතිකයක් මත යම් මුද්‍රාවක් තබන හෝ මුද්දරයක් අලවන ; හෝ

(ඇ) ප්‍රසිද්ධ දැන්වීමක ස්වභාවය හෝ ආකෘතිය දරන යම් කිසිවක් යම් සහතික යකට හෝ සහතිකයක් මත අමුණන හෝ අලවන

යම් තැනැත්තකු මේ පනත යටතෙහි වරදකට වරදකරු විය යුතු ය.

(2) යම් සහතිකයක් හොරට තනන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

7. මේ පනත ක්‍රියාවෙහි යෙදවීමේ පරිපාලනයෙහි ලා දරනු ලබන සියලු වියදම් හා, විශේෂයෙන් එහෙත් මේ වගන්තියෙහි ඉහත දැක්වුණු විධිවිධානවල සාමාන්‍යත්වයට හානියක් නොමැති ව, යෝජනා ක්‍රමය පිහිටුවීමෙහි හා ක්‍රියාත්මක කිරීමෙහි ද සහතික මුද්‍රණය කිරීමෙහි ද මහා බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කොමිස් මුදල් හෝ ගාස්තු වාණිජ බැංකුවලට ගෙවීමෙහි ද ලා දරනු ලබන සියලු වියදම් ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු ය.

8. (1) මේ පනතෙහි කාර්යයන් සඳහා '' විදේශ විනිමය හිමිකම් සහතික ගිණුම '' යනුවෙන් හැඳින්වෙන, මේ පනතෙහි '' ගිණුම '' යනුවෙන් සඳහන් කරනු ලබන ගිණුමක් රජයේ නමින් මහා බැංකුවෙහි ආරම්භ කොට පවත්වාගෙන යා යුතුය.

(2) ගිණුමට බැර කිරීමේ කාර්යය සඳහා ඒකාබද්ධ අරමුදලෙන් කලින් කල ඉවත් කර ගනු ලැබිය හැකි සියලු මුදල් හා මේ පනත ක්‍රියාවෙහි යෙදවීමේ පරිපාලනය ගෙන යාමෙහි දී රජය සඳහා, හා වෙනුවෙන් මහා බැංකුවට ලැබෙන වෙනත් සියලු මුදල්, ගිණුමට බැර කළ යුතු ය.

(3) 7 වන වගන්තියෙහි සඳහන් සියලු වියදම් ගිණුමෙන් ගෙවිය යුතු ය.

(4) ගිණුමෙහි ඇති මුදල් කිසිවක් මුදල් ඇමතිවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි කලින් කල ඒකාබද්ධ අරමුදලට මාරු කරනු ලැබිය හැකි ය.

9. (1) මේ පනතෙහි ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවට නැංවීමේ හෝ ඵලගැන්වීමේ කාර්යය සඳහා වාණිජ බැංකු, බලය ලත් ගණුදෙනුකරුවන්, පිළිගත් භාර ගන්නන් හෝ වෙනත් තැනැත්තන් වෙත මහා බැංකුව විසින් විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් එහෙත් (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතලවල සාමාන්‍යත්‍වයට හානියක් නොමැති ව, පහත සඳහන් සියලු ම කරුණු හෝ ඉන් යම් කරුණක් සඳහා හෝ වම්බන්ධයෙන් මහා බැංකුව විසින් වාණිජ බැංකු, බලය ලත් ගණුදෙනු කරුවන්, පිළිගත් භාරගන්නන් හෝ වෙනත් තැනැත්තන් වෙත විධාන නිකුත් කළ හැකි ය :—

(අ) විධාන නිකුත් කිරීමට මේ පනත මගින් බලය පවරා ඇති යම් කරුණක් ;

(ආ) යෝජනා ක්‍රමය පිහිටුවීමට හා ක්‍රියාත්මක කිරීමට අදාළ වූත් මේ පනතෙහි විධිවිධාන පරිපූරණය කිරීම අවශ්‍ය කරුණක් වූත් යම් කරුණක් ; සහ

(ඇ) ඉහත කී කරුණු අතුරින් යමකට සම්බන්ධ හෝ ආනුෂංගික යම් කරුණක්.

(3) මේ පනත යටතේ මහා බැංකුව විසින් නිකුත් කරනු ලබන යම් විධානයක් කඩ කරන හෝ ඒ අනු ව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

10. (1) මේ පනත යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තකු සුළු අපරාධ විනිශ්චය කරුවකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වැරදිකරු කරනු ලැබූ විට අවුරුදු දහයකට නො වැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් දහදහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම යටත් විය යුතුය.

(2) මේ පනත යටතේ යම් වරදක් කිරීමට තැත් කරන හෝ එවැනි වරදක් කිරීමට ප්‍රාරම්භ වශයෙන් වූ යම් ක්‍රියාවක් කරන යම් තැනැත්තකු ඒ වරදට වරදකරු ලෙස සැලකිය යුතු ය.

11. මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ තැනැත්තකු පුද්ගල මණ්ඩලයක් වන අවස්ථාවක :—

(අ) ඒ මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් ඒ වරද කළ අවස්ථාවේ දී ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල් කරුවකුව සිටි සෑම තැනැත්තකු ; හෝ

(ආ) ඒ මණ්ඩලය නීතිගත සංස්ථාවක් නම්, ඒ වරද කළ අවස්ථාවේ දී ඒ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂවරයකුව හෝ වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තකු,

වරද සිදු කරන ලද්දේ තම දැනීම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වළක්වාලීම පිණිස නිසි සියලු උද්යෝගයකින් තමා ක්‍රියා කළ බව ඔප්පු කරනහොත් මිස, ඒ වරදට වරදකරු විය යුතුය.

12. මේ පනත යටතේ වූ වැරදි අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි අර්ථානුකූලව හා එහි කාර්යයන් සඳහා සංඥේය වැරදි විය යුතු ය.

13. මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් මහා බැංකුවේ අධිපති විසින් හෝ ඔහුගේ ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම නඩු පැවරීමක් නොකළ යුතු ය.

14. මේ පනත යටතේ මහා බැංකුවේ බලතල, යුතුකම් හා කාර්යයන් මුදල් මණ්ඩලය වෙත පැවරිය යුතු අතර, ඒ අනුව මුදල් මණ්ඩලය විසින් ඒ බලය, යුතුකම් හෝ කාර්ය ක්‍රියාවෙහි යෙදවීම, කිරීම හා ඉටුකිරීම කළ හැකි ය.

15. 14 වන වගන්තියෙන් මුදල් මණ්ඩලය වෙත පවරනු ලැබූ වාවූ මේ පනත යටතේ මහ බැංකුවේ සතු වූද යම් බලයක්, යුතුකමක් හෝ කාර්යයක් මහ බැංකුවේ අධිපති විසින් හෝ මහ බැංකුවේ අධිපතිගේ සාමාන්‍ය හෝ විශේෂ විධාන යටතේ ක්‍රියා කරන ඒ බැංකුවේ යම් නිලධරයකු විසින් එය වෙනුවෙන් ක්‍රියා වෙහි යෙදවීම, කිරීම හෝ ඉටු කිරීම කළ හැකිය.

16. මේ පනත යටතේ වරදක් සිදු කරන ලද්දේ ය යි හේතු සහිත ව සැක කරනු ලැබූ යම් තැනැත්තකු වෙත බැංකුවේ අධිපති විසින් තැපැලෙන් යවනු ලබන හෝ වෙනත් ආකාරය-කින් ඔහුට භාර දෙනු ලබන දැන්වීමක නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි රුපියල් ලක්ෂයකට නො වැඩි යම් මුදලක් ඒ දැන්වීමේ දිනයට පසු දින දහහතරක් ගත වීමට පෙර ඒ තැනැත්තා විසින් භාර දෙන්නේ නම් එසේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ මුදල, හෝ එසේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ මුදල හා බැංකුවේ අධිපති විසින් නිශ්චය කරනු ලැබිය හැකි එසේ නිශ්චිත ව සඳහන් කරනු ලැබූ මුදලින් සියයට දහයකට නො වැඩි අතිරේක මුදලක් ඒ දැන්වීමේ දිනයට පසු විසිඅට දිනක් ගතවීමට පෙර ඒ තැනැත්තා විසින් භාර දෙන්නේ නම්, එසේ නිශ්චිත ව සඳහන් කරනු ලැබූ මුදල හා බැංකුවේ අධිපති විසින් නිශ්චය කරන ලද අතිරේක මුදල කරන ලද්දේ යයි සැලකෙන වරද සඳහා බේරුම් අනුපාතය වශයෙන් මහා බැංකුවේ අධිපති විසින් භාර ගත හැකි ය. බැංකුවේ අධිපති විසින් එසේ භාර ගනු ලබන යම් මුදලක් ඔහු විසින් ගිණුමට බැර කළ යුතු ය.

17. (1) විදේශ විනිමය හිමිකම් සහතිකයක් යයි අදහස් කෙරෙන ලේඛනයක් එබඳු සහතිකයක අනුකරණයක් ද යන බව යම් අධිකරණයක යම් නීති කෘත්‍යයක දී නිශ්චය කිරීමට ඇති අවස්ථාවක, ඒ ලේඛනය ලංකාවේ මහා බැංකුව විසින් හෝ එය සඳහා, සහ වෙනුවෙන් නිකුත් කරන ලද විදේශ විනිමය හිමිකම් සහතිකයක අනුකරණයක් ය යන බවට මහා බැංකුවේ අධිපතිගේ අත්සන යටතේ වූ සහතිකයක්, හෝ බැංකුවේ අධිපති තාවකාලිකව රාජකාරියට නො පැමිණ සිටින්නේ නම් හෝ තම කාර්යයන් හා යුතුකම් ඉටු කිරීමට තාවකාලික ව නො-හැකි ව සිටින්නේ නම් මහා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් තත් කාලයෙහි ක්‍රියා කරන බැංකුවේ නියෝජ්‍ය අධිපතිගේ අත්සන යටතේ වූ සහතිකයක් ඒ ලේඛනය විදේශ විනිමය හිමිකම් සහතිකයක අනුකරණයක් බවට තීරණාත්මක සාක්ෂිය වශයෙන් ඒ නීති කෘත්‍යවලදී පිළිගනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන මහා බැංකුවේ අධිපති හෝ නියෝජ්‍ය අධිපති ඒ සහතිකය සම්බන්ධයෙන් පරීක්ෂණයට භාජන නො කළ යුතු ය. නැතහොත් ඔවුන් ගෙන් හරස් ප්‍රශ්න නො ඇසිය යුතුය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම සහතිකයක් ම පහත සඳහන් ආකෘති යෙහි විය යුතු ය :—

ලංකාවේ මහා බැංකුවේ අධිපති, */ලංකාවේ මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් තත් කාලයෙහි ක්‍රියා කරන නියෝජ්‍ය අධිපති, . . . . . . . . . .වන මම,. . . . . . . . . . . මුදලක් සඳහා නිකුත් කරන ලද අංක. . . . . . . . . . . . . . .සහ. . . . . . . . . . . . .දින දරන විදේශ විනිමය හිමිකම් සහතිකයක් ය යි අදහස් කෙරෙන. . . . . . . . . . . . .වශයෙන් ලකුණු කර ඇති ලේඛනය මා විසින් පරීක්ෂා කර බලන ලද බවත් ඒ ලේඛනය විදේශ විනිමය හිමිකම් සහතිකයක අනුකරණයක් වන අතර ලංකාවේ මහා බැංකුව විසින් හෝ එය සඳහා, සහ වෙනුවෙන් නිකුත් කරන ලද විදේශ විනිමය හිමිකම් සහතිකයක් නො වන බවත් මෙයින් සහතික කරමි.

අත්සන :..............................................

දිනය :..............................................

(* අනවශ්‍ය වචන කපා දමන්න. )

18. විනිමය පාලන පනත යටතේ විනිමය පාලක විසින් දෙන ලද යම් අවසරයක්, අනු-මැතියක් හෝ බලයක් යම් විදේශ විනිමය හිමිකම් සහතිකයක් හෝ සහතික භාර දීමේ කොන්දේසිය පිට විය හැකි ය.

19. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍යවුවහොත් මිස මේ පනතෙහි —

" පිළිගත් භාරගන්නා " යන්නෙන් විදේශ විනිමය භාර ගැනීමට විනිමය පාලක විසින් බලය දෙනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ ;

" බලය ලත් ගනුදෙනුකරු " යන්නෙන් විනිමය පාලන පනතේ 4 වන වගන්තිය යටතේ තත් කාලයෙහි බලය දෙනු ලැබූ වාණිජ බැංකුවක් අදහස් වේ ;

" මහා බැංකුව " යන්නෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ලංකාවේ මහා බැංකුව අදහස් වේ ;

" සහතිකය " යන්නෙන් විදේශ විනිමය හිමිකම් සහතිකයක් අදහස් වේ ;

" මහා බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී " යන්නට තත් කාලයෙහි මහා බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස ක්‍රියා කරන තැනැත්තා ඇතුළත් වේ ;

" වාණිජ බැංකුව " යන්නට මුදල් නීති පනතේ 127 (1) වගන්තියෙහි එයට දී ඇති අර්ථයම ඇත ;

"විදේශ විනිමය හිමිකම් සහතිකය " යන්නෙන් මේ පනත යටතේ මහා බැංකුව විසින් හෝ එය සඳහා සහ වෙනුවෙන් නිකුත් කරනු ලැබුවා වූ ද, සහතිකය දරන්නා විසින් එය වලංගු කාලය තුළ දී යම් බලයලත් ගනුදෙනුකරුවකුට එය භාරදෙනු ලැබූ විට, රජය විසින් කලින් කල අනුමත කොට ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය හැකි කාර්යයන් සඳහා සහ නියමයනට යටත්ව විදේශ විනිමය මිලයට ගැනීමට දරන්නාට බලය ලබා දෙන්නාවූ ද විදේශ විනිමය හිමිකම් සහතිකයක් අදහස් වේ ;

" බැංකුවේ අධිපති " යන්නෙන් මහා බැංකුවේ අධිපති අදහස් වන අතර තත් කාලයෙහි එම බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස ක්‍රියා කරන නියෝජ්‍ය අධිපති ද ඊට ඇතුළත් වේ ;

" නියමයන් " යන්නට කොන්දේසි ද ඇතුළත් වේ ;

" මේ පනත " යන්නට ඒ යටතේ නිකුත් කරනු ලබන යම් විධාන ද ඇතුළත් වේ ;

" වලංගු සහතිකය " යන්නෙන් තත් කාලයෙහි වලංගු සහතිකයක් අදහස් වේ.

20. මේ පනතේ විධිවිධාන මුදල් නීති පනතේ හෝ විනිමය පාලන පනතේ විධිවිධානවලට අතිරේක ව තිබිය යුතු අතර මේ පනතේ විධිවිධානවලින් මුදල් නීති පනතේ හෝ විනිමය පාලන පනතේ විධිවිධානවල බල හීන නො විය යුතු ය;

එසේ වුව ද මේ පනතේ විධිවිධාන හා මුදල් නීති පනතේ හෝ විනිමය පාලන පනතේ විධිවිධාන අතර ගැටීමක් හෝ නොගැලපීමක් ඇති වුවහොත් මේ පනතේ විධිවිධාන ඒ ගැටීමේ හෝ නොගැලපීමේ ප්‍රමාණයට මුදල් නීති පනතේ හෝ විනිමය පාලන පනතේ විධිවිධාන අභිබවා පැවතිය යුතු ය.

## 1968 අංක. 33 දරන ලංකා රජයේ උකස් බැංකු හා මුදල් ( සංශෝධන ) පනත

**ලංකා රජයේ උකස් බැංකු ආඥාපනත සහ 1963 අංක. 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**( අනුමත කරන ලද්දේ, 1968 ජූනි 22 )**

1. (1) මේ පනත 1968 අංක 33 දරන ලංකා රජයේ උකස් බැංකු හා මුදල් ( සංශෝධන ) පනත යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

(2) මේ පනතෙහි, (3) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලබන වගන්තිවල විධිවිධාන නො වන, විධිවිධාන මේ පනත පනවනු ලබන දිනයන්හි ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ පනතෙහි 31, 42 හා 53 වන වගන්තිවල විධිවිධාන, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥාවකින් ඇමතිවරයා විසින් නියම කරනු ලබන දිනයෙක සිට ක්‍රියාත්මක විය යුතු ය.

### 1 වන කොටස

### ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතට කරනු ලබන සංශෝධන

2. මෙහි මින් මතු '' ප්‍රධාන ප්‍රඥප්තිය '' යනුවෙන් සඳහන් කරනු ලබන ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතෙහි 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) '' බැංකුව '' යන යෙදුම පිළිබඳ අර්ථකථනයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' '' කෘෂිකර්මය '' යන්නට බෝග වැවීම, උයන් වැවීම, සත්ව පාලනය, කුකුළන් ඇති කිරීම, කිරි පට්ටි පාලනය සහ මීමැසි පාලනය ඇතුළත් වේ;':

(2) '' ශාඛා මණ්ඩලය '' යන යෙදුම පිළිබඳ අර්ථකථනය අත් හැරීමෙන් ;

(3) '' මණ්ඩලය '' යන පාඨය පිළිබඳ අර්ථකථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' '' මහා බැංකුව '' යන්නෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහා බැංකුව අදහස් වේ ; ' ;

(4) ' '' අධ්‍යක්ෂ '', '' ශාඛා මණ්ඩලයක සාමාජිකයෙක් '', කළමනාකරු '' සහ සහකාර කළමනාකරු '' යන පාඨ පිළිබඳ අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' '' අධ්‍යක්ෂ '', '' සාමාන්‍යාධිකාරී '', සහ '' නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී '' යන්නෙන් ඒ තනතුරුවලට මේ ආඥා පනත යටතේ පත් කරනු ලබන තැනැත්තෝ අදහස් වෙති ; ' සහ

(5) '' නියමිත '' යන පාඨයෙහි අර්ථකථනයට පෙරාතුව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් ද වේ :—

'' ණය '' යන්නෙන් මුදලින් වූ ණයක් අදහස් කෙරෙන අතර යම් අයිරාවක්, හෝ කවර නමකින් හෝ අභිධානයකින් හඳුන්වනු ලබන වෙන යම් අනුග්‍රහ මුදලක් ද එයට ඇතුළත් වේ ;

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 3 වන වගන්තියේ " කෘෂිකර්ම " යන්නෙහි සිට " කොළඹ " යන්න දක්වා වූ සියලු වචන වෙනුවට " මේ ආඥාපනතෙහි කාර්යයන් ක්‍රියාවෙහි යෙදවීම පිණිස ලංකා රජයේ උකස් බැංකුව යන නමින් හැඳින්විය යුතු බැංකුවක් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ. —

> 5. බැංකුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා තිබිය යුතු ය. අවශ්‍ය යයි මණ්ඩලය විසින් සැලකිය හැකි බැංකුවේ ශාඛා කාර්යාල ඇමති වරයාගේ පූර්ව අනුමතිය ඇතිව කොළඹ හැර ලංකාවේ අනිකුත් ස්ථානවල පිහිටුවනු ලැබිය හැකි ය. එසේ පිහිටු වනු ලැබූ කිසිම ශාඛා කාර්යාලයක් එවැනි ම අනුමතිය ඇති ව හැර නො වැසිය යුතු ය. ".

5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

> 7. 51 වන වගන්තියෙහි නිශ්චිත ව සඳහන් විවිධ ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කිරීමට හා කරගෙන යාමට මේ ආඥාපනතෙහි විධිවිධානවලට යටත් ව බැංකුවට බලය පවරනු ලැබේ. ".

6. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ ප්‍රඥප්තියෙහි 9(අ) වන වගන්තිය ලෙස එය බලපැවැත් විය යුතු ය :—

> 9(අ) අධ්‍යක්ෂකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ අධ්‍යක්ෂ වරයකු පත් කිරීම පිළිබඳ වූ යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කෘත්‍යයක් නිර්බල නො විය යුතු ය. ".

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 15 වන වගන්තිය අගට පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

> " (3) අයහපත් සෞඛ්‍ය නිසා හෝ ලංකාවෙන් බැහැර ගොස් සිටීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා යම් අධ්‍යක්ෂවරයකු ඔහුගේ ධුරයෙහි යුතුකම් ඉටු කිරීමට තාවකාලික ව අපොහොසත් බව ඇමතිවරයාට පෙනී ගියහොත් ඒ අධ්‍යක්ෂවරයා වෙනුවෙන් ක්‍රියා කිරීමට ඇමතිවරයා විසින් වෙන යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. ".

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 16 වන වගන්තියේ අතුරු විධානයෙහි " රුපියල් දසදහසකට " යන යෙදුම වෙනුවට " රුපියල් විසිපන්දහසකට " යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි " කළමනාකරු " යන වචනය වෙනුවට " සාමාන්‍යාධිකාරී " යන වචනය ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි " සහකාර කළමනාකරුගේ " යන යෙදුම වෙනුවට " නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ " යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි " කළමනාකරු සහ සහකාර කළමනාකරු " යන යෙදුම වෙනුවට " සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී " යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි " කළමනාකරු සහ සහකාර කළමනාකර " යන යෙදුම වෙනුවට " සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී " යන යෙදුම ආදේශ කිරීමෙන් ද වේ.

10. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 19 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි —

(අ) '' කළමනාකරු '' යන වචනය එම උපවගන්තියෙහි යෙදෙන කවර ස්ථානයක වුවද ඒ වෙනුවට '' සාමාන්‍යාධිකාරී '' යන යෙදුම ආදේශ කිරීමෙන් ;
සහ

(ආ)'' ''එසේ කිරීමට, ඇමතිවරයාගේ අනුමතිය ඇතිව,'' යන යෙදුම වෙනුවට ''එසේ කිරීමට'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි —

(අ) '' සහකාර කළමනාකරු '' යන යෙදුම වෙනුවට '' නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී '' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ආ) '' කළමනාකරු '' යන වචනය එම උපවගන්තියෙහි යෙදෙන කවර ස්ථානයක වුව ද '' සාමාන්‍යාධිකාරී '' යන යෙදුම ඒ වෙනුවට ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි '' කළමනාකරුගේ සහ සහකාර කළමනාකරුගේ '' යන යෙදුම වෙනුවට '' සාමාන්‍යාධිකාරීගේ සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ '' යන යෙදුම ආදේශ කිරීමෙන් ද වේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 21 වන වගන්තියෙහි අතුරු විධානයෙහි (ආ) ඡේදයෙහි '' එසේ කිරීමට, මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ලැබ ඇමතිවරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව, '' යන යෙදුම වෙනුවට '' එසේ කිරීමට '' යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 22 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

22. මණ්ඩලය විසින් කලින් කල බැංකුවේ නීති, ආර්ථික, මුදල් කටයුතු හෝ කාර්මික උපදේශකයන් වශයෙන් ක්‍රියා කිරීමට නිසි පරිදි සුදුසුකම් ලැබූ තැනැත්තකු හෝ තැනැත්තන් පත් කරනු ලැබිය හැකි අතර නියම කරනු ලැබිය හැකි ගාස්තු පරිමානයක් අනුව එවැනි යම් තැනැත්තකුට පාරිශ්‍රමිකය ගෙවිය යුතු ය. ''.

13. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 23 වන වගන්තියට ඉක්බිතිවම ඇති '' (iII) ශාඛා මණ්ඩල '' යන උපශීර්ෂය අත් හැරීමෙන් එම ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

14. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 24 වැන්නේ සිට 30 වැන්න දක්වා වූ වගන්ති ( ඒ දෙක ම ඇතුළු ව ) මෙයින් අවලංගු කරනු ලැබේ.

15. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 31 වන වගන්තියේ '' කළමනාකරුට, සහකාර කළමනාකරුට,'' යන යෙදුම වෙනුවට '' සාමාන්‍යාධිකාරීට, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීට, '' යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

16. '' ශාඛා මණ්ඩලයක සෑම සාමාජිකයකු '' යන යෙදුම අත්හැරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 34 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

17. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 35 වන වගන්තියෙහි (අ) ඡේදයෙහි '' උකස් කිරීම්වල ඇපය පිට බැංකුව විසින් '' යන වචන වෙනුවට '' බැංකුව විසින් '' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

18. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 51 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

51 (1) මේ ආඥාපනතෙහි විධිවිධානවලට යටත් ව, මෙහි පහත නිශ්චිත ව සඳහන් විවිධ ව්‍යාපාර කටයුතු වර්ග ක්‍රියාවෙහි යෙදවීමට හා කරගෙන යාමට බැංකුවට බලය පවරනු ලැබේ. එනම් :—

(අ) (1) යම් කෘෂිකාර්මික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලැබීමට ඇති යම් ඉඩමක් මිලට ගැනීම හෝ බද්දට ගැනීම, හෝ වගා කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩිදියුණු කිරීමේ ද ;

(2) යම් කෘෂිකාර්මික ව්‍යාපාරයක් හෝ බැංකුවෙහි පරමාර්ථවලට ප්‍රතිකූල නොවන නියමිත වෙනත් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලැබීමට ඇති යම් ගොඩනැගිල්ලක්, කර්මාන්ත ශාලාවක්, මෝලක්, පතලයක්, යන්ත්‍රසූත්‍රයක් හෝ උපකරණයක් මිලට ගැනීම හෝ බද්දට ගැනීම, හෝ තැනවීම, අලුත්වැඩියා කිරීම හෝ අලුත් කිරීමේ ද ;

(3) නිවාසයක් ඉදිකිරීම සඳහා යම් ඉඩමක් මිලට ගැනීම හෝ බද්දට ගැනීමේ ද;

(4) නිවාසයක් ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හෝ විශාල කිරීමේ ද ;

(5) නිවාසයක් මිලට ගැනීම හෝ බද්දට ගැනීමේ ද ;

( ) වෙළඳපොළෙහි විකිණීම පිණිස යම් කෘෂිකාර්මික හෝ වෙනත් නියමිත නිෂ්පාදනයක් හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම හෝ පිළියෙළ කිරීමේ ද ;

(7) ඉහත දැක්වුණු අනුච්ඡේද අතුරෙන් යම් කිසිවක සඳහන් යම් කාර්යයකට ආනුෂංගික, උපාංගික හෝ අනුයාත යම් කාර්යයක් පිළිබඳ ව වූ ද ;

(8) ඉහත දැක්වුණු අනුච්ඡේද අතුරෙන් යම් කිසිවක සඳහන් යම් කාර්යයක් සඳහා දැනටමත් යම් කිසි ණයක් දී ඇතහොත් ඒ ණය ගෙවා අවසන් කිරීමේ ද

කාර්යය සඳහා පොලී ගෙවනු ලැබීමට යටත් ව, යම් තැනැත්තකුට ණය දීම ;

(ආ) යම් කෘෂිකාර්මික ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමේ කාර්ය සඳහා හෝ බැංකුවෙහි විෂය ප්‍රමාණයට ඇතුළත් කාර්යයන් සඳහා වූ ණයක් ලබාගැනීමට සමණක් කරන ලද යම් උසස් කිරීමක් යටතේ වූ ණය බේරුම් කිරීමේ කාර්ය සඳහා, පොලී ගෙවනු ලැබීමට යටත් ව, යම් තැනැත්තකුට, මුදල් ණය දීම ;

(ඇ) සම්පූර්ණයෙන් හෝ කොටසක් රජය විසින් සපයන ලද මූලධනයෙන් පිහිටුවන ලද හෝ පවත්වාගෙන යනු ලබන හා කෘෂිකර්මයෙහි නියුක්තව සිටින නීතිගත සංස්ථාවල කොටස් මූලධන සඳහා මුදල් සැපයීම, හා එහි ලා සහභාගී වීම ;

(ඈ) කෘෂිකර්ම සංවර්ධනය සඳහා මුදල් ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ යම් යෝජනා ක්‍රමයක් ක්‍රියාවෙහි යෙදවීමේ කාර්යය සඳහා යම් තැනැත්තකුට මුදල් ණය දීම ;

(ඉ) කෘෂිකර්මයෙහි පාවිච්චි කරනු ලබන කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර හා උපකරණ කුලී සින්නක්කර ක්‍රමයට සැපයීමේ ව්‍යාපාරය පවත්වාගෙන යෑම ;

(ඊ) කළමනා කිරීම, පරිපාලනය හෝ පාලනය ගෙනයෑම, හෝ කළමනා කිරීමෙහි හෝ පරිපාලනය හෝ පාලනය ගෙනයෑමෙහි ලා සහභාගිවීම බැංකුව විසින් දෙන ලද යම් ණයක් පිළිබඳ බැංකුවේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස අවශ්‍ය ය යි මණ්ඩලයට පෙනී යන අවස්ථා-වල බැංකුවේ යම් සේවා දයකයකුට අයත් යම් කෘෂි-කාර්මික හෝ වෙනත් නියමිත ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පාරිශ්‍රමිකයන් ඇති ව හෝ නැති ව කළමනා කිරීම, පාරිපාලනය හෝ පාලනය ගෙන යෑම හෝ ඒ කළමනා කිරීමෙහි හෝ පරිපාලනය හෝ පාලනය ගෙනයෑමෙහි ලා පාරිශ්‍රමිකයක් ඇති ව හෝ නැති ව එසේ සහභාගි වීම ;

(උ) බැංකුවේ යම් සේවා දයකයකුගේ යම් කෘෂිකාර්මික හෝ නියමිත වෙනත් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ යම් කරුණක් පිළිබඳව ඒ සේවා දයකයාගේ කාර්මික උපදේශක වශයෙන්, පාරිශ්‍රමිකයක් ඇති ව හෝ නැති ව ක්‍රියා කිරීම ;

(ඌ) යම් කෘෂිකාර්මික හෝ වෙනත් නියමිත ව්‍යාපාරයක යම් නිෂ්පාදනයක් විකිණීම හෝ අලෙවි කිරීම සඳහා අවශ්‍ය සංවිධාන පිහිටුවීම ;

(එ) බැංකුවේ යම් සේවා දයකයකුගේ හෝ අන් කිසි තැනැත්-තකුගේ යම් කෘෂිකාර්මික හෝ වෙනත් නියමිත ව්‍යාපාර-යකට අවශ්‍ය යම් යන්ත්‍රසූත්‍රයක් හෝ උපකරණයක් හෝ කවර වර්ගයක හෝ යම් ද්‍රව්‍යයක් මිලට ගැනීමේ කාර්ය සඳහා අවස්ථාවෝචිත පරිදි ඒ සේවා දයකයාගේ නැත-හොත් ඒ අන් තැනැත්තාගේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීම ;

(ඒ) බැංකුවේ මුදල්වල ඇති යම් අතිරික්ත මුදලක් යෙදවීමේ කාර්යය සඳහා, රජය විසින් හෝ මහා බැංකුව විසින් නිකුත් කරනු ලබන හෝ වගකියනු ලබන ස්කන්ධ, කොටස්, ණයකර, උකස්, බැඳුම්කර හෝ සුරකුම්පත් මිලට ගැනීම, විකිණීම, එහි ලා මුදල් ආයෝජනය කිරීම හෝ ඒවා සම්බන්ධ ගනුදෙනුවල යෙදීම ;

(ඔ) බැංකුවේ යම් සේවා දයකයකු විසින් බැංකු වට උකස් කරන ලද යම් දේපළක් ආරක්ෂණය කිරීම පිණිස කටයුතු පිළියෙළ කිරීම ;

(ඕ) යම් තැනැත්තකු විසින් ලංකාවෙහි පවත්වාගෙන යනු ලබන්නාවූත් පවත්වාගෙන යෑමට බැංකුවට බලය පැවරී ඇති ව්‍යාපාරයක් වූත් යම් ව්‍යාපාරයක් සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් අත්කර ගැනීම හා පවත්වාගෙන යෑම ;

(ඹ) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් ඇමතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනයෙක සිට කිසියම් කෘෂිකාර්මික, වාසික හෝ ව්‍යාපාරික භූමිභාගයක්, V (අ) පරිච්ඡේදයෙහි විධිවිධාන ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා, සම්පූර්ණ වශයෙන් හෝ එහි යම් පංගුවක් හෝ කොටසක් අත්කර ගැනීම සහ ඒ පිළිබඳ ව සුදුස්සක් කිරීම ;

(ග) පවත්වාගෙන යාමට බැංකුවට බලය පැවරී ඇති යම් ව්‍යාපාර කටයුත්තක් සම්බන්ධයෙන් අවශ්‍ය ය යි හෝ සුදුසු ය යි බැංකුව විසින් සලකනු ලැබිය හැකි හෝ බැංකුවට හිමි සුරැකුම්පත් කිසිවක මුදල් අයකර ගැනීම පහසුවීම පිණිස හෝ ඇතිවේ යයි සැක කරන යම් පාඩුවක් හෝ වගකීමක් වැළැක්වීම හෝ අඩුකිරීම පිණිස අත්කර ගැනීම අවශ්‍ය යයි හෝ ප්‍රඥාගෝචර යයි බැංකුව විසින් සලකනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් හා අයිතිවාසිකම් හෝ වරප්‍රසාද කිසිවක් මිලට ගැනීම, බද්දට ගැනීම හෝ හුවමාරු කර ගැනීම, කුලියට ගැනීම හෝ අන් ආකාරයකින් අත්කර ගැනීම ;

(ච) විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික දීමනා ද බැංකුවේ සේවකයන්ගේ සහ ඒ සේවකයන්ගෙන් යැපෙන්නන්ගේ යහපත පිණිස වේ යයි අදහස් කරනු ලබන වෙනත් අරමුදල් සහ පහසුකම් ද සැලැස්වීම පිණිස සංගම්, ආයතන, භාරකාර මණ්ඩල හෝ යෝජනා ක්‍රම පිහිටුවීම හා ඒවාට උපකාර කිරීම හෝ එසේ පිහිටුවීමෙහි හෝ උපකාර කිරීමෙහි ලා ආධාර වීම ;

(ඡ) බැංකුව විසින් දී තිබිය හැකි යම් ණයකට ඇප වශයෙන් තබා ඇති හෝ සුදුස්සක් කිරීමේ යම් බලයක් බැංකුවට තිබිය හැකි චංචල හෝ නිශ්චල යම් දෙපළක් ඇතුළත්ව බැංකුවේ සියලුම දේපළ සහ අයිතිවාසිකම් හෝ ඒ දේපළවලින් හා අයිතිවාසිකම්වලින් යම් කිසිවක් වැඩි දියුණු කිරීම, ඒ පිළිබඳ කළමනා කිරීම, එය සංවර්ධනය කිරීම, හුවමාරු කිරීම, බද්දට දීම, උකස් කිරීම, ඒ පිළිබඳ සුදුස්සක් කිරීම, එය විකිණීම, ඉන් ප්‍රයෝජන ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් අන් ආකාරයකින් ගනුදෙනු කිරීම ;

(ට) යම් ඇප සහතිකයක් හෝ වන්දි සහතිකයක් දීම, සහ බැංකුවේ යම් පරමාර්ථයකට වැඩදායක විය හැකි ය යි බැංකුවට පෙනී යා හැකි අයිතිවාසිකම්, අනුග්‍රහ හා වරප්‍රසාද කිසිවක් ලබා ගැනීම පිණිස රජය හෝ යම් ප්‍රාදේශීය බලමණ්ඩලයක් හෝ යම් නීතිගත සංස්ථාවක් හෝ අන් තැනැත්තකු සමග යම් යම් ගිවිසුම්වලට එළඹීම;

(ඩ) ණය කර නිකුත් කිරීම ;

(ණ) අන්‍යොන්‍ය වශයෙන් පාර්ශ්වයන් විසින් එකඟ වනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසි යටතේ, එහෙත් යම් අවස්ථාවක ණයට ගන්නා වූ හා තැන්පත් මුදල් වශයෙන් පිළිගන්නා වූ මුදලෙහි මුළු ගණන මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව ඇමතිවරයා විසින් නියම කරනු ලැබූ උපරිම සීමාව නො ඉක්මවන පරිදි, රජයෙන් හෝ මහා බැංකුවෙන් හෝ මහා බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඒ කාර්යය සඳහා අනුමත කරනු ලබන වෙනත් ආයතනවලින් මුදල් ණයට ගැනීම හෝ තැන්පත් මුදල් පිළිගැනීම ;

(ත) රජය හා බැංකුව හා අතර අන්‍යොන්‍ය වශයෙන් එකඟවනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසි යටතේ බැංකුවේ සංචිත අරමුදල සඳහා රජයෙන් රුපියල් පනස් ලක්ෂයකට නො වැඩි දායක මුදලක් පිළිගැනීම ;

(ද) කාර්මික, මුදල් පිළිබඳ ව හා කළමනාකාරිත්වය පිළිබඳ සේවා සැපයීම පිණිස යම් ආයතනයක් පිහිටුවීම හා පවත්වාගෙන යෑම හෝ ඒ සඳහා වූ යම් යෝජනා ක්‍රමයකට සහභාගිවීම ;

(න) ආර්ථික සමීක්ෂණ, අධ්‍යයන කටයුතු හා සංස්කරණ පන්ති පැවැත්වීම ;

(ප) බැංකුවෙහි කාර්ය මණ්ඩලයෙන් තෝරා ගත් තැනැත්තන් හා වෙනත් තැනැත්තන් ගණිත ශාස්ත්‍රය, බැංකු ව්‍යාපාර හා තක්සේරු කිරීම, අපේක්ෂිත ක්‍රම හා ණය තක්සේරු කිරීම, ඉංජිනේරු හා විද්‍යාත්මක දක්ෂතාවන් යන මේ විෂයයන්හි පුහුණු කරවීම ;

(බ) වන්දි ගෙවීම ;

(ම) බැංකුවෙහි මුදල් කෘෂිකර්මයෙහි නියුක්ත පොදු හෝ පෞද්ගලික වෙළෙඳ සමාගම් වල කොටස්වල, ණයකරවල හෝ වෙනත් සුදුසු සුරැකුම්පත්වල ආයෝජනය කිරීම ;

(ය) සාමාන්‍යයෙන්, බැංකුවෙහි ණය බලය තහවුරුවීමට හා එයට ප්‍රතිෂ්ඨා පිණිස ඉතාමත් වැඩදායක වේ ය යි බැංකුව විසින් සලකනු ලැබිය හැකි සියලු පියවර හා ක්‍රියා මාර්ග ගැනීම හෝ එසේ ගැනීමෙහි ලා එකඟ වීම සහ ඉහත දක්වුණු ඡේදවල විස්තර කරන ලද පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට හෝ බලතල ක්‍රියාවෙහි යෙදවීමට ආනුෂංගික හෝ හිතකර විය හැකි සියලු දේවල් කිරීම ; යන මේවා ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි යම් ඡේදයක සඳහන් යම් පරමාර්ථයක් හෝ කාර්යයක්, පද සම්බන්ධයෙන් එසේ ප්‍රකාශිතව ම නියම කෙරෙන අවස්ථාවක හෝ යම් සීමා කිරීමක් හෝ තහනම් කිරීමක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක හැර, එම උපවගන්තියේ අන් කිසි ඡේදයක නියමයන්ගේ හෝ එහි නිශ්චිත ව සඳහන් පරමාර්ථවල අනුසාරයෙන් හෝ ඒ නියමයන් හෝ පරමාර්ථ අනුව නිගමනය කිරීමෙන් හෝ අන් ලෙසකින් කවර ආකාරයකින් හෝ සීමා නොවිය යුතු ය ; නොහොත් තහනම් නොවිය යුතු ය.

(3) මේ වගන්තියෙහි '' බැංකුවේ සේවා දායක '' යන යෙදුමෙන් මේ ආඥාපනත යටතේ බැංකුවෙන් ආධාර ලබන තැනැත්තෙක් අදහස් වේ. ''

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තිය අවලංගු කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය 52 වන වගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ;

(3) ඒ ප්‍රඥප්තියේ නැවත අංක කරනු ලැබූ 52 වන වගන්තියෙහි '' (1) වන උප වගන්තියේ හා 3 වන වගන්තියේ කාර්යයන් සඳහා '' යන යෙදුම වෙනුවට '' 3 වන වගන්තියේ කාර්යයන් සඳහා '' යන යෙදුම ආදේශ කිරීමෙන් ; තවද

(4) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත සඳහන් අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

" ඇතැම් අවස්ථාවල දී අතිරේක ණය දීමේ බලය. "

20. 1958 අංක 17 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි 53 වන වගන්තිය පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) " මිස කිසිම ණයක් නො දිය යුතු ය. " යන වචන වෙනුවට " මිස දේපළ උකස් කිරීමක් පිට කිසි ම ණයක් නො දිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (ඇ) ඡේදයෙහි " වලංගු " යන වචනය වෙනුවට " සතුටුදායක" යන වචනය ආදේශ කිරීමෙන් ද වේ.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

54. (1) මණ්ඩලය විසින් සම්මත කරගනු ලබන යෝජනාවකින් මිස කිසිම ණයක් නො දිය යුතුය : එසේ වුව ද රුපියල් විසිපන් දහස කට වැඩි නො වන යම් මුදලක් දක්වා ණය දීමට සාමාන්‍යාධිකාරි වෙත මණ්ඩලය විසින් 19 වන වගන්තිය යටතේ බලය පැවරිය හැකි ය.

එසේ ම තවදුරටත් අධ්‍යක්ෂවරුන් තිදෙනකුට අඩු සංඛ්‍යාවකගේ අනුග්‍රාහක ඡන්දයෙන් සම්මත කරනු ලැබූ යෝජනාවකින්, රුපියල් විසිපන් දහසකට වැඩි වන කිසිම ණයක් නො දිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධාන යටතේ සාමාන්‍යාධිකාරි විසින් දෙනු ලැබූ සියලුම ණය සම්බන්ධයෙන් මණ්ඩලයේ ඊළඟ රැස්වීමේදී මණ්ඩලය වෙත වාර්තා කළ යුතු ය. "

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය අවලංගු කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) ණය —

(අ) අර්ධ වාර්ෂික වශයෙන්, ත්‍රෛමාසික වශයෙන් හෝ මාස්පතා වාර කොටස්වලින් හෝ සම කොටස් ගෙවීම්වලින් ; හෝ

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියමයන් අනුව

ආපසු ගෙවිය යුතු ය. "; තවද

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත සඳහන් අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

" ණය ආපසු ගෙවීමේ ක්‍රමය. ".

23. 60 වන වගන්තියෙහි " මණ්ඩලය " යන වචනය යෙදෙන කවර ස්ථානයක වුව ද ඒ වචනය වෙනුවට " බැංකුව " යන වචනය ආදේශ කිරීමෙන් වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

24. ප්‍රධාන ප්‍රඥප්තියෙහි " (iv) ආපසු අය කර ගැනීම " යන උප ශීර්ෂය යටතේ 61 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්ති මෙයින් ආදේශ කරනු ලබන අතර ඒවා ඒ ප්‍රඥප්තියෙහි 61 (අ) වන වගන්තිය, 61 (ආ) වගන්තිය, 61 (ඇ) වන වගන්තිය, 61 (ඈ) වන වගන්තිය සහ 61 (ඉ) වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

61 (අ). යම් ණයක් සම්බන්ධයෙන් මුල් මුදල වෙනුවෙන් හෝ පොළිය වෙනුවෙන් හෝ ඒ දෙක ම වෙනුවෙන් අය විය යුතු යම් මුදලක් ගෙවීමෙහි ලා පැහැර හැරීමක් සිදු කරනු ලැබූ කවර අවස්ථාවක වුව ද එදින දක්වා නො ගෙවන ලද ණය මුදලේ හා ඊට අදළ පොළියේ ඉතිරි සම්පූර්ණ කොටස සම්බන්ධයෙන් ඒ පැහැර හැරීම සිදුවී ඇති ලෙස සැලකිය යුතු ය; තවද මණ්ඩලය විසින් එහි අභිමතය පරිදි, 61 (ආ) වන වගන්තියෙහි හෝ 61 (ඇ) වන වගන්තියෙහි නිශ්චිතව සඳහන් පරිදි ක්‍රියා කළ හැකි ය.

එසේ වුව ද 61 (ආ) වන වගන්තිය අනුව මණ්ඩලය විසින් ක්‍රියා කර ඇති හෝ ක්‍රියා කිරීමට ආරම්භ කර ඇති අවස්ථාවක 61 (ඇ) වන වගන්තිය යටතේ වූ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් ඒ සම්බන්ධයෙන් තදනන්තර ව ක්‍රියා කිරීම නුවණට හුරුයයි හෝ අවශ්‍ය යයි මණ්ඩලය සලකන්නේ නම් මණ්ඩලය විසින් එසේ කිරීම කිසිවකින් නො වළකන්නේ ය යි සැලකිය යුතු ය.

61 (ආ). පැහැර හැරීම සිදු කර ඇත්තේ යම් ණයක් සම්බන්ධයෙන් ද ඒ ණය වෙනුවෙන් ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් නිශ්චල දේපළකට ඇතුළු වී ඒ දේපළවල ස්වාමිත්වය භාර ගැනීමට ද එය පාලනය කිරීමට හා නඩත්තු කිරීමට ද, උකස්කරු විසින් පැහැර හැරීම සිදු කරනු නොලැබුවේ නම් ඔහු විසින් ඒ දේපළ සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබිය හැකි ව තිබූ ඒ දේපළ සම්බන්ධ පාලනයෙහි හා කළමනාකාරිත්වයෙහි ලා වූ බලතල ම පාවිච්චි කිරීමට ද 61 (ඉ) වන වගන්තියේ විධිවිධානවලට යටත් ව මණ්ඩලය විසින්, ලියවිල්ලෙන් වාර්තාගත විය යුතු යෝජනාවක් මගින් ඒ යෝජනාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් තැනැත්තකු වෙත බලය පැවරිය හැකි ය.

61 (ඇ) (1) යම් දේපළක් සම්බන්ධයෙන් 61 (ආ) වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලබන යෝජනාවකින් බලය පවරනු ලබන යම් තැනැත්තකුට ඒ යෝජනාව අනු ව සාමාන්‍යයෙන් ක්‍රියා කිරීමට ද විශේෂයෙන් ම :—

(අ) ඒ දේපළෙහි පලදාව විකිණීමට ;

(ආ) ඒ දේපළ සම්බන්ධයෙන් බදු කුලී, ලාභ හෝ වෙනත් ආදයම් ලැබීමට ;

(ඇ) ඒ දේපළ සම්බන්ධ පාලනයෙහි හා කළමනාකාරිත්වයෙහි ලා දැරීමට සිදු වන වියදම් ඒ දේපළින් ලැබෙන ආදයම් වලින් ගෙවීමට ;

(ඈ) ඔහුගේ සේවාවන් සඳහා පාරිශ්‍රමිකයක් වශයෙන් නියම කිරීමට සුදුසු යයි මණ්ඩලය විසින් සැලකිය හැකි යම් මුදල් ( කිසිවක් වේනොත් ) ඒ මුදල් ඒ ආදයමෙන් ලබා ගැනීමට ;

(ඉ) ඒ දේපළ සම්බන්ධ උකස යටතේ බැංකුවට අය විය යුතු සියලු ම මුදල් සම්පූර්ණයෙන් ම ගෙවා නිම වන තුරු හෝ (2) වන උප වගන්තිය යටතේ ඒ දේපළෙහි ස්වාමිත්වය භාර දෙන ලෙස මණ්ඩලය විසින් ඔහුට විධානය කරන තුරු ඒ දේපළ පිළිබඳ ස්වාමිත්වය දැරීමට ද හිමිකම් තිබිය යුතු ය.

(2) යම් දේපළ සම්බන්ධයෙන් 61 (ආ) වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලබන යෝජනාවකින් බලය පවරනු ලැබූ සැම තැනැත්තකු විසින් ම —

(අ) මණ්ඩලය විසින් එහි අභිමතය පරිදි නියම කරනු ලැබිය හැකි යම් මුදල් ( කිසිවක් වෙතොත් ) උකස්කරුගේ නඩත්තුව සඳහා ඒ දේපළෙහි ආදායමෙන් එය ඔහුට මාස්පතා ගෙවිය යුතු ය ;

(ආ) මෙහි පෙරාතු ව බලය පවරනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසු ඒ දේපළේ ආදායමෙන් ඉතිරි වන මුදල මණ්ඩලය විසින් විධාන කළ හැකි යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට එසේ ම විධාන කළ හැකි ආකාරයට ත්‍රෛමාසික වශයෙන් හෝ මණ්ඩලය විසින් විධාන කරනු ලබන වෙන යම් ආකාරයකට ගෙවිය යුතු ය ;

(ඇ) ඒ දේපළ සම්බන්ධයෙන් තමාට ලැබුණු හා තමා විසින් ගෙවන ලද සියලු ම මුදල් පිළිබඳ පැහැදිලි වූත් නිවැරදි වූත් වාර්තා තබා මණ්ඩලය විසින් නිශ්චය කළ හැකි යම් කාල සීමාවල දී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය ;

(ඈ) ඒ දේපළ පිළිබඳ සවාමිත්වය උකස් කරුට හෝ මණ්ඩලය විසින් විධාන කළ පරිදි වෙන යම් තැනැත්තකුට භාරදීම හා මෙහි පෙරාතුව බලය පවරනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසු ඒ දේපළෙහි ආදායමෙන් තමා ළඟ ඉතිරි ව ඇති යම් මුදලක් මණ්ඩලය වෙත ගෙවීම කළ යුතු ය.

(3) උකස යටතේ බැංකුවට අය විය යුතු සියලු ම මුදල් සම්පූර්ණයෙන් ම ගෙවා ඇති විට, උකස් කරනු ලැබූ දේපළෙහි සවාමිත්වය මණ්ඩලය විසින් උකස්-කරුට ආපසු භාර දිය යුතුවාත් හැර ඒ දේපළෙන් ලැබුණු ආදායමෙන් ඉතිරි ව ඇති යම් මුදලක් ඔහුට ආපසු භාර දිය යුතු ය.

61 (ඈ) පැහැර හැරීමක් කර ඇත්තේ යම් ණයක් සම්බන්ධ-යෙන් ද ඒ ණය වෙනුවෙන් ඇප වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් නිශ්චල දේපළක් ඒ ණයෙන් නො ගෙවා ඇති සම්පූර්ණ කොටස හා විකිණීමේ දිනය දක්වා ඒ වෙනුවෙන් අය විය යුතු පොළිය ද 63 වන වගන්තිය යටතේ අය කර ගත හැකි මුදල හා වියදම් සමග ආපසු අය කර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මණ්ඩලය විසින් 61 (ඉ) වන ඡේදයේ විධිවිධානවලට යටත් ව, ලියවිල්ලෙන් වාර්තා ගත විය යුතු යෝජනාවකින් ඒ යෝජනාවේ නිශ්චිත ව සඳහන් යම් තැනැත්-තකුට බලය පැවරිය හැකි ය.

61 (ඉ) (1) 61 (ආ) සහ 61 (ඈ) වන වගන්තිවල විධිවිධාන, ණය ගැනුම්කරු මිය ගොස් ඇති හෝ ණය මුදල වෙනුවෙන් ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ දේපළෙහි අයිතිය, හිමිකම් හෝ කවර හෝ සම්බන්ධතාවයක් හෝ ස්වේච්ඡා පැවරීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් වෙන යම් තැනැත්තකු වෙත පැවරී ඇති නමුදු යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි හැර, අදාළ විය යුතුය.

(2) ණය ගැනුම්කරු මිය ගොස් සිටින හා ඔහු ගේ අන්තිම කැමැත්ත පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය හෝ ඔහුගේ බූදලය පිළිබඳ පරිපාලන බලපත්‍ර යම් තැනැත්තකු වෙත නිකුත් කර ඇති අවස්ථාවක, මණ්ඩලය විසින් ඒ වෙනුවෙන් ඉල්ලුම් කළ විට හා ඒ ඉල්ලීම පිළිබඳ දැන්වීම අධිකරණය විසින් නියම කළ හැකි යම් තැනැත්තන් ( කිසිවකු වෙතොත් ) ඒ තැනැත්තන් වෙත භාර දීමෙන් පසු කොළඹ ප්‍රදේශ අධිකරණය විසින් හෝ ණය ගැනුම්කරු විසින් බැංකුවට උකස් කරනු ලැබූ දේපළ පිහිටි දිස්ත්‍රික්කයේ ප්‍රදේශ අධිකරණය විසින්, ප්‍රොබේට් බලපත්‍ර ප්‍රදානය කිරීම හෝ පරිපාලන බලපත්‍ර නිකුත් කිරීම නුවුවමනා පරිදි පමාවන්නේ යයි සෑහීමකට පත් වන්නේ නම් මේ වගන්තියේ

කාර්යයන් සඳහා ණය ගැනුම්කරුගේ බුදලය නියෝජනය කිරීම පිණිස තැනැත්තකු පත් කළ හැකි ය ; තවද 61 (ආ) සහ 61 (ඇ) වන වගන්තිවල විධිවිධාන, ඒ ණය ගැනුම්කරුගේ බුදලය නියෝජනය කිරීම සඳහා මේ උපවගන්තිය යටතේ යම් තැනැත්තකු පත් කරනු ලැබුවේ නම් මිස හා, පත් කරනු ලබන තුරු, ඒ ණය ගැනුම්කරු විසින් කරනු ලැබූ යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් අදාළ නො විය යුතු ය.''

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) හා (2) වන උපවගන්ති අවලංගු කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය, (4) වන උපවගන්තිය, (5) වන උප-වගන්තිය, (6) වන උපවගන්තිය සහ (7) වන උපවගන්තිය ඒ වගන්තියේ පිළිවෙළින් (1) වන උපවගන්තිය, (2) වන උපවගන්තිය, (3) වන උපවගන්තිය (4) වන උපවගන්තිය හා (5) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන්;

(3) ඒ වගන්තියේ නැවත අංක කරනු ලැබූ (2) වන උපවගන්තියෙහි, —

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි '' යම් දඩ පොළියක් '' යන යෙදුම වෙනුවට '' යම් දඩ පොළියක් හෝ 103 වන වගන්තියේ අතුරු විධානය යටතේ ගෙවිය යුතු වෙනත් පොළියක් '' යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි —

(1) '' සම කොටස් ගෙවීමෙහි '' යන යෙදුම වෙනුවට '' සම කොටස් ගෙවීමෙහි හෝ වෙනයම් ගෙවීමක'' යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(2) '' යම් දඩ පොළියක් '' යන පාඨය වෙනුවට '' යම් දඩ පොළියක් හෝ 103 වන වගන්තියේ අතුරු විධානය යටතේ ගෙවිය යුතු වෙනත් පොළියක් '' යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(3) '' මණ්ඩලය විසින් '' යන යෙදුම වෙනුවට '' බැංකුව විසින් '' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(4) '' (1) වන උපවගන්තිය '' යන යෙදුම වෙනුවට '' 61(ඇ) වන වගන්තිය '' යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ නැවත අංක කරනු ලැබූ (3) උපවගන්තිය අවලංගු කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'' (3) (අ) ඒ දේපළ බැංකුවට හැර අන් තැනැත්තකුට අඩුවෙන් නො විකිණිය යුතු, අඩුම වෙන්දේසි මිල මණ්ඩලය විසින් නියම කළ හැකි ය.

(ආ) අඩුම වෙන්දේසි මිලක් නියම කිරීමෙහි දී මණ්ඩලය විසින්, ඒ දේපළවල ඇපය පිට දෙනු ලැබූ ණයෙන් ආපසු ගෙවීමට ඉතිරිව ඇති හිඟ මුදල හා ඒ දේපළ පිළිබඳ තත්කාලයෙහි පවත්නා වටිනාකම යන දෙක ම ගැන විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු ය. '' ;

(5) ඒ වගන්තියෙහි නැවත අංක කරනු ලැබූ (5) වන උප වගන්තියේ '' මේ වගන්තියෙහි '' යන යෙදුම වෙනුවට '' 61 (අ) සිට 68 දක්වා ( වගන්ති දෙක ම ඇතුළු ව ) වූ වගන්තිවල '' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(6) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත සඳහන් අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

'' විකිණීමට අදාළ විශේෂ විධිවිධාන. ''

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ (ආ) ඡේදයේ විධානය වෙනුවට පහත සඳහන් අලුත් අතුරු විධානය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' එ සේ වුව ද ඒ ඡේදය යටතේ දරනු ලබන වියදම්, මණ්ඩලය විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි ඒ ණයෙහි යම් සියයට ගණනකට නො වැඩි විය යුතු ය; තව ද ''

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියෙහි '' මණ්ඩලය '' යන වචනය යෙදෙන කවර ස්ථානයක වුව ද ඒ වෙනුවට '' බැංකුව '' යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි '' 62 වන වගන්තියෙහි විධිවිධාන අනුව විකුණනු ලැබූ ඉඩම '' යන යෙදුම වෙනුවට '' මෙම ආඥාපනතේ ඉහත සඳහන් විධිවිධාන අනුව විකුණනු ලැබූ දේපළ '' යන යෙදුම ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියෙහි, —

(අ) '' 62 වන වගන්තියෙහි විධිවිධාන අනුව '' යන යෙදුම වෙනුවට '' මෙම ආඥාපනතෙහි ඉහත සඳහන් විධිවිධාන අනුව '' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ආ) '' ඉංග්‍රීසි භාෂාවෙන් සහ සිංහල හෝ දෙමළ භාෂාවෙන් '' යන යෙදුම වෙනුවට '' සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් '' යන යෙදුම ආදේශ කිරීමෙන්.

29. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 67 වන වගන්තිය, එහි '' සියයට නවයකට '' යන යෙදුම වෙනුවට '' නියමිත ප්‍රම ණයට '' යන යෙදුම ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

30 ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය, එහි '' 62 වන වගන්තිය යටතේ '' යන යෙදුම වෙනුවට '' මෙම ආඥාපනතෙහි ඉහත සඳහන් විධිවිධාන අනු ව '' යන යෙදුම ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

31. පහත දක්වෙන අලුත් පරිච්ඡේදය V වන පරිච්ඡේදයට ඉක්බිති ව ම මෙයින් ඇතුළත් කරනු ලැබ, ප්‍රධාන ප්‍රඥප්තියෙහි V (අ) වන පරිච්ඡේදය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

## V (අ) පරිච්ඡේදය

### ඇතැම් භූමිභාග අත්කර ගැනීම සහ ඒ භූමිභාග පිළිබඳව සුදුස්සක් කිරීම

70(අ) මේ පරිච්ඡේදය පිළිබඳ පරිපාලනය ගැන බැංකුව වගකිව යුතු අතර, ඒ පරිපාලනය බැංකුව වෙත පවරනු ලැබිය යුතු ය. තව ද මේ පරිච්ඡේදය මගින් හෝ එය යටතේ බැංකුව වෙත පවරනු ලැබූ යම් බලයක් පාවිච්චි කිරීමේ දී, හෝ පනවනු ලැබූ යම් යුතුකමක් ඉටු කිරීමේ දී, හෝ භාර කරනු ලැබූ යම් කාර්යයක් කිරීමේ දී බැංකුව ඇමතිවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් විය යුතු ය.

70(ආ) (1) යම් කෘෂිකාර්මික, නේවාසික හෝ ව්‍යාපාරික භූමිභාගයක් සම්පූර්ණයෙන් හෝ එහි යම් පංගුවක් හෝ කොටසක් 1952 ජනවාරි මස පළමුවන දිනයට කලින් නො වන යම් අවස්ථාවක, –

(අ) ඒ භූමිභාගයෙහි ( මින් මතු මේ පරිච්ඡෙදයෙහි '' මුල් අයිතිකරු '' වශයෙන් හඳුන්වනු ලබන ) අයිතිකරුට විරුද්ධ ව අධිකරණයක් විසින් නිකුත් කරනු ලැබූ උකස් නඩු තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදීමේ දී විකුණනු ලැබුවේ ය යි ; හෝ

(ආ) ඒ භූමිභාගයෙහි ( මින් මතු මේ පරිච්ඡෙදයෙහි '' මුල් අයිතිකරු '' වශයෙන් හඳුන්වනු ලබන ) අයිතිකරු විසින්, මුල් අයිතිකරු-ගෙන් හෝ ඔහුට කලින් අයිතිකරුගෙන් හෝ වෙනත් තැනැත්-තකුට ලැබිය යුතු වූ ද අන්සතු කිරීමට පෙරාතුවම පැවති ඒ භූමිභාගය උකසට යටත් කිරීමකින් ආරක්ෂිත වූ ද ණයක් ගෙවා නිදහස් කිරීමක් වශයෙන් ඒ වෙනත් තැනැත්තා වෙත අන්සතු කරනු ලැබුවේ යයි ;

හෝ

(ඇ) ඒ භූමිභාගයෙහි ( මින් මතු මේ පරිච්ඡෙදයෙහි '' මුල් අයිතිකරු '' වශයෙන් හඳුන්වනු ලබන ) අයිතිකරු විසින්, ඒ ස්ථානයෙහි උකස්හිමියකුගේ ඉල්ලීම පරිදි, මුල් අයිතිකරුගෙන් හෝ ඔහුට කලින් අයිතිකරුගෙන් ඒ උකස් හිමියාට ලැබිය යුතු වූ ද අන්සතු කිරීමට පෙරාතු ව ම පැවති ඒ භූමිභාගය උකසට යටත් කිරීමකින් ආරක්ෂිත වූ ද ණයක් ගෙවා නිදහස් කිරීමක් වශයෙන් හෝ ණයකින් කොටසක් ගෙවා නිදහස් කිරීමක් වශයෙන් අන් කිසි තැනැත්තකුට පවරනු ලැබුවේ ය යි ;

හෝ

(ඈ) ඒ අන්සතු කිරීමේ ප්‍රතිෂ්ඨාව වශයෙන් යම් මුදලක් අන් කිසි තැනැත්තකුගෙන් භාර ගැනීමෙන් පසුව, සහ ( මින් මතු මේ පරිච්ඡෙදයෙහි '' මුල් අයිතිකරු '' වශයෙන් හඳුන්වනු ලබන ) අන්සතු කරන්නා විසින් පොළිය සහිතව හෝ පොළිය නොමැතිව ඒ මුදල් නියමිත කාල සීමාවක් ඇතුළත ගෙවූ විට ඒ අනෙක් තැනැත්තා විසින් ඒ භූමිභාගය මුල් අයිතිකරු වෙත යළිත් පවරනු ඇතැයි යන කොන්දේසියට යටත් ව ඒ භූමිභාගයෙහි අයිතිකරු විසින් අන් කිසි තැනැත්තකුට පවරනු ලැබුවේයයි

බැංකුව සෑහීමකට පත් වුවහොත්, ඒ භූමිභාගය සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක් අත් කර ගැනීමට, (2) වන උපවගන්තියෙහි විධි විධානවලට යටත් ව, බැංකුව මෙයින් බලය පවරනු ලැබේ.

(2) (අ) 1963 අංක 11 දරන මුදල් පනතෙහි viii වන කොටස යටතේ ඒ සඳහා වූ ඉල්ලීමක් මහජන බැංකුව වෙත කලින් ඉදිරිපත් කරන ලදුව, ඒ භූමිභාගය අතිකර නොගත යුතු යයි ඒ බැංකුව විසින් තීරණය කරනු ලැබුවේ නම් ; නැතහොත්

(ආ) ඒ භූමිභාගයෙහි මුල් අයිතිකරු විසින් හෝ ඇගේ හෝ ඔහුගේ සවාමියා,භාය්‍ර්‍යාව හෝ ළමයින් විසින් ඒ සඳහා වූ ඉල්ලීමක් බැංකුව වෙත ඉදිරිපත් නො කරනු ලැබුවේ නම් ; නැතහොත්

(ඇ) මුල් අයිතිකරුගේ සහ ඔහු ප්‍රධාන ව සිටින පවුලේ සෙසු සාමාජිකයන්ගේ ද, ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ දිනයට පෙරාතුවම වූ තක්සේරු වර්ෂ තුන සඳහා වූ ආදයම් බදු පැනවීමට අදළව පනවා ඇති නීතියේ විධිවිධානවලට

යටත් ව ගණන් බලනු ලැබූ සාමාන්‍ය ව්‍යවස්ථාපිත ආදායම රුපියල් දසදහසකට වැඩි නො වේ ය යි බැංකුව සෑහීමට පත් නො වේ නම් ; නැතහොත්

(ඇ) ඉල්ලීමට අදාළ වන භූමිභාගය ඒ භූමි භාගයේ මුල් අයිතිකරුගේ හෝ ඒ අයිතිකරුගේ පවුලේ යම් සාමාජිකයකුගේ පදිංචි ස්ථානයක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා, නැත හොත් ඒ අයිතිකරුගේ හෝ ඔහුගේ පවුලේ යම් සාමාජික යකුගේ යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, රක්ෂාවක, වෘත්තියක හෝ සේවයක කාර්යයන් සඳහා යුක්තිසහගත ව අවශ්‍ය වී ඇතැයි ද ඉල්ලීමට අදාළ වන භූමිභාගය යම් කාර්‍ය්‍යයක් සඳහා පාවිච්චි කරනු ලැබේ ද ඒ කාර්යය සඳහා පාවිච්චි කළ හැකි අන් කිසි භූමිභාගයක් ඒ අයිතිකරුට හෝ ඔහුගේ පවුලේ සාමාජිකයකුට නැතැයි ද බැංකුව සෑහීමකට පත් වුවහොත් ; නැතහොත්

(ඉ) යම් කෘෂිකාර්මික භූමිභාගයකට අදාළ වන ඉල්ලීමක දී මුල් අයිතිකරු ප්‍රමාණයෙන් අක්කර දහයකට අධික අන්කිසි කෘෂිකාර්මික භූමිභාගයක අයිතිකරු නො වේ ය යි බැංකුව සෑහීමකට පත් නො වුවහොත්

(1) වන උප වගන්තිය යටතේ කිසි ම භූමිභාගයක් අත්කර නො ගත යුතුය.

මේ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි කාර්යයන් සඳහා, යම් තැනැත්තකු සම්බන්ධයෙන් යොදනු ලබන කල " පවුලේ සාමාජිකයා " යන්නෙන් ඒ තැනැත්තාගේ අඹු හෝ සැමි, හෝ ඒ තැනැත්තාගේ දහඅට විය ඉක්ම වූ යම් පුතෙක් හෝ දුවක් අදහස් වේ.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් භූමිභාගයක් අත්කර ගැනීම සඳහා ඉල්ලීමක් බැංකුව භාර ගන්නා අවස්ථාවක, බැංකුව විසින්–

(අ) ඒ භූමිභාගයෙහි අයිතිකරු වෙත ඒ කරුණ පිළිබඳ දැන්වීම ලියාපදිංචි කළ තැපෑලෙන් යවනු ලැබීමට සැලැස්විය යුතු ය ;

(ආ) ඒ භූමිභාගයට අදාළ වන නියමිත විස්තර දක්වෙන්නා වූ ද මේ පරිච්ඡේදය යටතේ ඒ භූමිභාගය අත්කර ගනු ලැබිය හැකි ය ය යි පවසන්නා වූ ද දැන්වීමක් ලියාපදිංචි කිරීම සඳහා නිසි ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාර දෙනු ලැබීමට හෝ යවනු ලැබීමට සැලැස් විය යුතු ය.

ඉඩම් කෙරෙහි බලපාන්නා වූ හෝ ඉඩම්වලට සම්බන්ධ වූ නීත්‍යානුකූල ලේඛනයක් ලියාපදිංචි කිරීම සඳහා ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරය අනු ව (ආ) ඡේදය යටතේ වූ සෑම දැන්වීමක්ම ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කළ යුතු අතර, ඒ සෑම දැන්වීමක්ම, ඒ දැන්වීමෙහි දක්වෙන නියමිත විස්තර අදාළ වන භූමිභාගය කෙරෙහි බලපාන්නා වූ හෝ ඊට සම්බන්ධ වූ නීත්‍යානුකූල ලේඛනයක් වශයෙන් ඒ කාර්යයන් සඳහා සැලකිය යුතු ය :

එ සේ වුව ද මේ පරිච්ඡේදයෙහි කාර්යයන් සඳහා ඒ භූමිභාගය අත්කර නො ගත යුතු යයි බැංකුව තීරණය කරන අවස්ථාවක, බැංකුව විසින් ඒ දැන්වීම වහා ම අවලංගු කොට ඒ අවලංගු කිරීම ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් ඒ අවලංගු කිරීම ලියාපදිංචි කළ යුතුය.

(4) (අ) යම් භූමිභාගයක අයිතිකරුට ඒ භූමි භාගය පිළිබඳ ඉල්ලීමකට අදාළ ව (3) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් ලැබුණු අවස්ථාවක, ඒ ඉල්ලීම බැංකුව විසින් නිෂ්ප්‍රභා නො කරනු ලැබුවහොත් හෝ නිෂ්ප්‍රභා කරනු ලබන තෙක් ඒ අයිතිකරු විසින් එම භූමිභාගය විකිණීම, තෑගි කිරීම, පැවරීම, බදු දීම, උකස් කිරීම හෝ අන් ලෙසකින් අන් සතු කිරීම නො කළ යුතු ය.

(ආ) මේ උපවගන්තියෙහි (අ) ඡේදයෙහි විධිවිධාන උල්ලංඝනය කරමින් යම් භූමිභාගයක් විකිණීම, තෑගි කිරීම, පැවරීම, බදු දීම, උකස් කිරීම හෝ අන් ලෙසකින් අන්සතු කිරීම නිරර්ථක හා බලරහිත විය යුතු ය.

(5) (අ) මේ පරිච්ඡේදය යටතේ කිරීමට නියමිත යම් අත්කර ගැනීමකට අදාළව බැංකුව වෙත ඉදිරිපත් කර තිබෙන යම් කරුණක් සම්බන්ධයෙන් ; හෝ

(ආ) ඒ අත්කර ගැනීමට අදාළ ව බැංකුව විසින් අනුගමනය කරනු ලබන ක්‍රියා මාර්ගයෙහි නීත්‍යානුකූල භාවය හෝ ඒ අත්කර ගැනීමේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන්

යම් නඩුවක් කිසි ම සිවිල් අධිකරණයක් විසින් භාර නො ගත යුතු ය.

(6) මේ පරිච්ඡේදය යටතේ අත්කර ගැනීමට බැංකුවට බලය පවරනු ලැබෙන යම් භූමිභාගයක් අත්කර ගත යුතු ද නැති ද යන ප්‍රශ්නය බැංකුව විසින් නිශ්චය කළ යුතු ය. තව ද බැංකුවේ එබඳු සෑම නිශ්චය කිරීමක් ම අවසාන හා තීරණාත්මක විය යුතු අතර, කිසි ම අධිකරණයක දී ඒ පිළිබඳ ව ප්‍රශ්න නො කළ යුතු ය.

(7) මේ පරිච්ඡේදයෙහි කාර්යයන් සඳහා යම් භූමිභාගයක් අත්කර ගත යුතුය යි බැංකුව තීරණය කර ඇති විටෙක, බැංකුව විසින් :—

(අ) ඒ භූමිභාගයෙහි අයිතිකරු වෙත ඒ තීරණය දැනුම් දිය යුතු ය. තවද,

(ආ) ඒ භූමිභාගයට අදාළ වන නියමිත විස්තර දැක්වෙන්නා වූ ද මේ පරිච්ඡේදය යටතේ ඒ භූමිභාගය අත්කර ගත යුතු ව ඇතැ යි පවසන්නා වූ ද දැන්වීමක් ලියාපදිංචි කිරීම සඳහා නිසි ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාර දෙනු ලැබීමට හෝ යවනු ලැබීමට සැලැස්විය යුතු ය.

ඉඩම් කෙරෙහි බලපාන්නා වූ හෝ ඉඩම්වලට සම්බන්ධ වූ නීත්‍යානුකූල ලේඛන ලියාපදිංචි කිරීම සඳහා ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරය අනු ව (ආ) ඡේදය යටතේ වූ සෑම දැන්වීමක් ම ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කළ යුතු අතර, ඒ සෑම දැන්වීමක් ම, ඒ දැන්වීමෙහි දැක්වෙන නියමිත විස්තර අදාළ වන භූමිභාගය කෙරෙහි බලපාන්නා වූ හෝ ඊට සම්බන්ධ වූ නීත්‍යානුකූල ලේඛනයක් වශයෙන් ඒ කාර්යයන් සඳහා සැලකිය යුතුය.

70(ඈ) (1) මේ පරිච්ඡේදයෙහි කාර්යයන් සඳහා යම් භූමිභාගයක් අත්කර ගත යුතු ය යි බැංකුව තීරණය කර ඇති අවස්ථාවක, මණ්ඩලයෙහි සභාපති විසින් ඒ තීරණය ඇමතිවරයා වෙත දැනුම් දෙනු ලැබීමට සැලැස් විය යුතු ය.

(2) යම් භූමිභාගයක් සම්බන්ධයෙන් බැංකුවේ තීරණය දැනුම් දෙනු ලැබූ විට, ඒ තීරණය අදාළ වන භූමිභාගය, ආඥාවෙහි සඳහන් කළ යුතු

දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ( මේ පරිච්ඡේදයෙහි මින් මතු '' සතු කිරීමේ ආඥාවක් '' වශයෙන් හඳුන්වනු ලබන ) ආඥාවෙන් ඇමතිවරයා විසින් බැංකුව වෙත සතු කළ හැකි ය.

(3) යම් භූමිභාගයක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ වූ සතු කිරීමේ ආඥාවක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන විට, ඒ උපවගන්තිය යටතේ ආඥාවෙහි නිශ්චිත ව සඳහන් දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි , ඒ භූමිභාගය සියලු බැඳීම්වලින් තොර ව බැංකුව වෙත සම්පූර්ණයෙන් සතු විය යුතු ය.

(4) මණ්ඩලයේ සභාපති විසින් ඒ සඳහා විශේෂයෙන් හෝ සාමාන්‍ය වශයෙන් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට සතු කිරීමේ ආඥාවක් මගින් බැංකුව වෙත සතු කර ඇති යම් භූමිභාගයක සන්තකය භාර ගත හැකි ය.

(5) සතු කිරීමේ ආඥාවක් මගින් බැංකුව වෙත සතුකර ඇති යම් භූමිභාගයක සන්තකය භාර ගැනීමට (4) වන උපවගන්තිය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තා විසින්, ඒ ස්ථානයෙහි පදිංචි ව සිටින හෝ සන්තකය දරන තැනැත්තා වෙත දෙනු ලැබූ නැතහොත් ඒ භූමිභාගයෙහි හෝ එයට ආසන්න ව එක්තරා ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබූ දැන්වීමකින්, —

(අ) ඒ බලය ලත් නිලධාරියා දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් විය යුතු දිනයක දී ද එබඳු වේලාවක හා ස්ථානයක් දී ද බැංකුව සඳහා, හා බැංකුව වෙනුවෙන් ඒ භූමිභාගයෙහි සන්තකය භාර ගැනීමට අදහස් කරන බව දැනුම් දිය යුතු ය ; තවද,

(ආ) එලෙස නිශ්චිත ව සඳහන් දිනයෙහි දී ද ඒ වේලාවෙහි දී හා ස්ථානයෙහි දී ද පැමිණ සිටින ලෙසත්, බැංකුව සඳහා හා බැංකුව වෙනු වෙන් ඒ භූමිභාගයෙහි සන්තකය භාර ගැනීමට ඒ බලය ලත් නිලධරයාට ඉඩ දී ඔහුට සහාය වන ලෙසත් එයට සම්බන්ධකමක් දක්වන යම්තැනැත්තකු හෝ බලය ලත් ඔහුගේ නියෝජිතයාට නියම කළ යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දිය යුතු යයි අවශ්‍ය වන යම් දැන්වීමක් ලියාපදිංචි කළ ලිපියක මාර්ගයෙන් ඔහුට එවනු ලැබුවහොත් එය ඔහුට නිකුත් කරනු ලැබ ඇතැ යි සැලකිය යුතු ය.

(7) (අ) (5) වන උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරනු ලැබූ යම් දැන්වීමක යම් නියමයක් කඩ කරන ; හෝ

(ආ) මේ වගන්තියෙහි පූර්වෝක්ත විධිවිධාන යටතේ බැංකුව සඳහා හා බැංකුව වෙනුවෙන් යම් භූමිභාගයක සන්තකය භාර ගැනීමෙන් හෝ භාර ගැනීමේ දී අන් කිසි තැනැත්තකු —

(1) වළක්වන, එබන්දකුට අවහිර කරන හෝ විරුද්ධ වන නැතහොත්

(2) එ සේ වැළැක්වීම, අවහිර කිරීම හෝ විරුද්ධ වීම යම් තැනැත්තකු ලවා නියම ලෙස හෝ අනියම් ලෙස කරවන

සෑම තැනැත්තකු ම මේ පරිච්ඡේදය යටතේ වරදකට වරදකරු විය යුතු අතර, සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියෙහි ලඝු නඩු විභාගය

කින් පසු වරදකරු කරනු ලැබීමේ දී, එක් වර්ෂයකට නො වැඩි කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් එක් දහසකට නො වැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

70(ඈ) (1) සතු කිරීමේ ආඥාවක බලය ප්‍රකාර යම් භූමිභාගයක් බැංකුව වෙත පවරනු ලැබ ඇති වුව ද, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ( මින් මතු මේ වගන්තියෙහි '' අහිමි කිරීමේ ආඥාව '' වශයෙන් හඳුන්වනු ලබන ) පසුව නිකුත් කළ ආඥාවකින් ඇමතිවරයා විසින් ඒ සතු කිරීමේ ආඥාව යම් අවස්ථාවකදී අවලංගු කළ හැකි ය.

(2) යම් භූමිභාගයක් සම්බන්ධයෙන් වූ සතු කිරීමේ ආඥාවක් අහිමි කිරීමේ ආඥාවකින් අවලංගු කරනු ලැබූ යම් අවස්ථාවක පහත සඳහන් විධිවිධාන අදාළ විය යුතු ය :—

(අ) ඒ සතු කිරීමේ ආඥාවෙහි බලය ප්‍රකාර ඒ භූමිභාගය බැංකුව වෙත කිසි විටෙකත් සතු වී නැතැ යි සැලකිය යුතු අතර, ඒ භූමිභාගය කෙරෙහි හෝ ඒ පිළිබඳ වූ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවයක් පිළිබඳ ව පැන නැඟිය හැකි යම් ප්‍රශ්නයක් ඒ අනු ව නිශ්චය කළ යුතු ය ; තවද

(ආ) ඒ භූමිභාගය සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය පිළිබඳ ව මේ පරිච්ඡේදය යටතේ වූ සියලු හිමිකම් පෑම් සහ ඒ හිමිකම් පෑම් සම්බන්ධයෙන් ඒ සතු කිරීමේ ආඥාව අවලංගු කරනු ලැබීමට පෙර මේ පරිච්ඡේදය යටතේ පවත්වනු ලැබූ සියලු නීති කෘත්‍ය නිරර්ථක හා බර රහිත වනු ඇතැයි සැලකිය යුතු ය :

එමෙන් ම

(ඇ) ඒ සතු කිරීමේ ආඥාව අවලංගු කරනු ලැබීමට පෙරාතු ව ඒ භූමිභාගය බැංකුව වෙත යම් කාලසීමාවක් තුළ සතු කරන ලද්දේ ද ඒ කාල සීමාව සම්බන්ධයෙන් මේ පරිච්ඡේදය යටතේ වන්දියක් නො ගෙවිය යුතු ය.

(3) මේ ආඥාපනතෙහි අන් කිසි විධිවිධානයක හෝ අන් කිසි ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද මේ වගන්තියෙහි පූර්වෝක්ත විධිවිධාන වලංගු විය යුතු ය.

70(ඉ) යම් භූමිභාගයක් බැංකුව වෙත පවරනු ලැබූ විට, මණ්ඩලයෙහි සභාපති විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දැන්වීමකින් සහ ඔහු විසින් තීරණය කළ හැකි අන් කිසි ආකාරයකින්, දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් දිනයේ සිට ගණන් බලනු ලැබූ එක් මාසයක කාල සීමාවක් ඇතුළත, ඒ භූමිභාගය සම්බන්ධයෙන් මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු සම්පූර්ණ වන්දියට හෝ එහි යම් කොටසකට අයිතිය ඉල්ලීමක් ලිපියකින් ඉදිරිපත් කරන ලෙසත්, ඒ අයිතිය ඉල්ලීමෙහි පහත දැක්වෙන කරුණු නිශ්චිත ව සඳහන් කරන ලෙසත්, ඒ භූමිභාගය එලෙස පවරනු ලැබූ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ඒ භූමිභාගයට සම්බන්ධකමක් දැක් වූ සෑම තැනැත්තකුට ම නියම කළ යුතු ය. ඒ කරුණු නම් :—

(අ) ඔහුගේ නම හා ලිපිනය ;

(ආ) ඒ භූමිභාගය කෙරෙහි ඇති ඔහුගේ සම්බන්ධතාවයේ ස්වභාවය ;

(ඇ) අයිතිය ඉල්ලීමේ විස්තර ; සහ

(ඈ) ඒ වන්දියෙන් කිනම් ප්‍රමාණයකට ඔහු විසින් හිමිකම් ඉදිරිපත් කරනු ලැබේ ද යන වගත් ය.

70(ඊ) බැංකුව වෙත පවරනු ලැබූ යම් ස්ථානයක් සම්බන්ධයෙන් මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු වන්දි සඳහා 70(ඉ) වන වගන්තිය යටතේ යම් අයිතිය ඉල්ලීමක් ලැබුණු විට, මණ්ඩලයේ සභාපති විසින් ලියාපදිංචි කළ ලිපියක මාර්ගයෙන් පහත සඳහන් ලේඛන ඉල්ලුම්කරුට තැපෑලෙන් යවනු ලැබීමට සැලැස්විය යුතු ය. ඒ ලේඛන මෙසේ ය :—

(අ) ඒ වාර්තාවෙහි පිටපතක් ඉල්ලුම් කරු වෙත කලින් භාර දී නැති නම්, මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ යම් ව්‍යවස්ථාවක් යටතේ බැංකුව විසින් හෝ බැංකුවේ බලය යටතේ සකස් කර ඇත්තා වූ ද ඉහත කී ස්ථානයේ තත්ත්වයට සම්බන්ධ වූ ද යම් වාර්තාවක පිටපතක් ;

(ආ) බැංකුව විසින් හෝ බැංකුවේ බලය යටතේ කරන ලද්ද වූ ද ඉහත සඳහන් ස්ථානය සම්බන්ධයෙන් මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු වන්දිය සම්බන්ධයෙන් වූ ද යම් තක්සේරුවක පිටපතක් ;

(ඇ) දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් කාලය තුළ —

(1) ඉහත දැක්වෙන (අ) ඡේදයෙහි සඳහන් වාර්තාව සමඟ හා ඉහත දැක්වෙන (ආ) ඡේදයෙහි සඳහන් තක්සේරුව සමඟ තමා එකඟ වන්නේ ද නැති ද යන වග ද, එ සේ තමා එකඟ නො වන්නේ නම්, ඒ වාර්තාව හා තක්සේරුව පිළිබඳ ව තමාට ඇති විය හැකි යම් විරුද්ධතාවන් ද, ඒ විරුද්ධතාවන්ට හේතු වූ කරුණු ද දක්වා ඇති ලිඛිත ප්‍රකාශයක් බැංකුවට සපයන ලෙස, සහ

(2) එබඳු යම් විරුද්ධතාවයක් සනාථ කිරීම සඳහා තමා විසින් විශ්වාස තබනු ලබන සියලු ලේඛන සහ විශේෂයෙන් ඉහත කී භූමිභාගයෙහි තත්ත්වය සම්බන්ධයෙන් වූ ලේඛන ද බැංකුවට ඉදිරිපත් කරන ලෙස

ඉල්ලුම්කරුට නියම කරන දැන්වීමක් ද වේ.

70(උ) (1) මේ පරිච්ඡේදය යටතේ බැංකුව වෙත සතු කරනු ලැබූ යම් දේපළක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදලේ ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා, සවකීය ඉල්ලීම් සනාථ කිරීම් වස් ඉල්ලුම් කරුවන් විසින් සපයනු ලැබූ සියලු ලේඛන ද බැංකුව විසින් ඉල්ලුම්කරුවන් වෙත යම් ලේඛනවල පිටපත් භාර දී තිබේ නම් හෝ යවා තිබේ නම් ඒ ලේඛන සියල්ල ද සහිත ව මණ්ඩලයේ සභාපති විසින් වන්දි විනිශ්චය සභාව වෙත යොමු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන්දි විනිශ්චය සභාව වෙත කරනු ලැබූ යොමු කිරීමක් '' වන්දි ප්‍රදනයක් සඳහා යොමු කිරීමක් '' වශයෙන් මින් පසු මේ පරිච්ඡේදයෙහි සඳහන් කරනු ලැබේ.

70(ඌ) බැංකුව වෙත සතු කරනු ලැබූ යම් භූමි භාගයක් සම්බන්ධයෙන් මේ පරිච්ඡේදය යටතේ ගෙවීමට නියමිත වන්දි ප්‍රමාණය, ඒ භූමිභාගය එහි අයිතිකරු විසින් මිලයට ගන්නා ලද්දේ හෝ ඔහුට එය පවරන ලද්දේ යම් මුදලකට ද ඒ නියම මිල සහ ඒ භූමිභාගය සම්බන්ධයෙන් සතු කිරීමේ ආඥාව පළ කිරීමට පෙර ඒ භූමිභාගය හා සම්බන්ධකම් ඇති ව සිටි යම් තැනැත්තකු විසින් පසුකලෙක දී ඒ භූමිභාගයට කරන ලද යම් එක්කිරීම්වල හා වැඩි දියුණු කිරීම්වලත් සාධාරණ වටිනාකමට සමාන අතිරේක මුදලක් ද ඒ භූමිභාගයෙහි වෙළෙඳ අගය ද යන දෙකෙන් අඩු දෙය විය යුතු ය.

70(ඒ) මේ පරිච්ඡේදය යටතේ බැංකුව වෙත සතු කරනු ලැබූ යම් ස්ථානයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි ඒ ස්ථානය එලෙස සතු කරනු ලැබූ දිනයෙහි සිට එකතු වී ගෙවිය යුතු ය යි සැලකිය යුතු ය.

70(ඔ) (1) මේ පරිච්ඡේදය යටතේ බැංකුව වෙත සතු කරනු ලැබූ යම් භූමිභාගයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට ගෙවීමට නියමිත වන්දි මුදල ඒ භූමිභාගය එ සේ සතු කරනු ලැබූ දිනයෙහි ඒ භූමි භාගයෙහි ඒ තැනැත්තා සතු ව තිබුණු අයිතිවාසිකමට ප්‍රමාණානුකූල විය යුතු ය.

(2) මේ පරිච්ඡේදය යටතේ යම් භූමිභාගයක් බැංකුව වෙත සතු කරනු ලැබූ අවස්ථාවෙහි ඒ භූමිභාගය උකසට හෝ බද්දකට යටත් ව පැවති නම්, 70(ඇ) වන වගන්තියේ (3) වන උප වගන්තියෙහි විධි-විධාන ගැන නො සලකා, උකස්හිමියාගේ හෝ බදු ගැනුම්කරුගේ අයිතිවාසිකම් ඒ භූමිභාගය සම්බන්ධයෙන් මේ පරිච්ඡේදය යටතේ වන්දි වශයෙන් ගෙවනු ලබන යම් මුදලකට සීමිත විය යුතුය.

70(ඕ) මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු යම් වන්දියක් ඇතොත්, එය ගෙවිය යුතු ව එකතු වන දිනයෙහි සිට ගෙවනු ලබන දිනය තෙක්, ඇමති වරයාගේ එකහත්වය ඇති ව බැංකුව විසින් නිශ්චය කළ හැකි ප්‍රමාණයක් අනු ව වූ පොලියක් එයට එක් විය යුතු ය.

70(ක) මේ පරිච්ඡේදය යටතේ වන්දි විනිශ්චය සභාව විසින් කරනු ලැබූ ( මින් මතු මේ පරිච්ඡේදයෙහි '' වන්දි ප්‍රදානය '' වශයෙන් හඳුන්වනු ලබන ) ප්‍රදානයක් අනු ව යම් තැනැත්තකු ඒ වන්දියට හිමිකම් නො ලද හොත්, මේ පරිච්ඡේදය යටතේ බැංකුව වෙත සතු කරනු ලැබූ යම් භූමිභාගයක් සම්බන්ධයෙන් කිසි ම වන්දියක් ඒ තැනැත්තාට මේ පරිච්ඡේදය යටතේ නො ගෙවිය යුතු ය.

70(ග) බැංකුව වෙත සතු කරනු ලැබූ ස්ථානයක් සම්බන්ධයෙන් මේ පරිච්ඡේදය යටතේ යම් තැනැත්තකුට ගෙවිය යුතු යම් වන්දියක් ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබූ කල ඔහු විසින් එය නොපිළිගනු ලබන විට, නැතහොත් ඒ තැනැත්තා මිය ගොස් ඇති විට, අනලස් ව සෙවීමෙන් පසු ඔහු සොයා ගත නො හැකි විට, හෝ ඔහු කවරෙක් දැ යි නො දන්නා විට ඒ වන්දි මුදල රුපියල් හත්සිය පනහකට වැඩි වීම හෝ වැඩි නොවීම අනුව, ඒ භූමිභාගය පිහිටා ඇති ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති ප්‍රදේශ අධිකරණය වෙත හෝ සුළු විවාද අධිකරණය වෙත, ඒ සඳහා හිමිකම් ලත් තැනැත්තා හෝ තැනැත්තන් විසින් ලබා ගත හැකි වන පරිදි, ඒ වන්දිය ගෙවිය යුතුය.

70(ජ) (1) යටත් පිරිසෙයින් පස් දෙනකු අධිකරණය හෝ නීතිය පිළිබඳ පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුතු වූ ද අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු වූ ද සාමාජිකයන් දස දෙනකුගෙන් සමන්විත වන්දි විනිශ්චය සභාවක්, මේ පරිච්ඡේදයෙහි කාර්යයන් සඳහා, සංස්ථාපනය කළ යුතු ය.

(2) යම් තැනැත්තකු උත්තර මන්ත්‍රීවරයකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ මණ්ඩලයේ සාමාජිකයකු හෝ බැංකුවේ නිලධරයකු හෝ සේවක යකු වුවහොත්, ඔහු වන්දි විනිශ්චය සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ තවදුරටත් කටයුතු කරගෙන යෑමට සුදුසු නො විය යුතු ය.

(3) වන්දි විනිශ්චය සභාවේ සාමාජිකයකු වූ අධිකරණමය හෝ නීතිය පිළිබඳ පළපුරුද්දක් ඇති තැනැත්තකු එහි සභාපති වශයෙන් ද, එබඳු පළපුරුද්ද ඇති වෙනත් සාමාජිකයකු උපසභාපති වශයෙන් ද, ඇමතිවරයාගේ නිර්දේශය අනු ව අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු ය.

(4) නිලය කලින් අත් නො හළහොත් හෝ අග්‍රාණ්ඩුකාරවරයා විසින් නිලයෙන් ඉවත් නො කරනු ලැබුවහොත්, වන්දි විනිශ්චය සභාවේ සෑම සාමාජිකයකු ම අවුරුදු තුනක කාලසීමාවක් නිලය දැරිය යුතු ය. කාලය ගෙවී යාමෙන් නිලය අත් හරින වන්දි විනිශ්චය සභාවේ යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(5) වන්දි විනිශ්චය සභාවට ( මින් මතු මේ පරිච්ඡේදයෙහි '' ලේකම් '' යන්නෙන් හඳුන්වනු ලබන ) ලේකම් කෙනකු සහ විනිශ්චය සභාවේ කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් හා සේවකයන් ද පත් කළ යුතු ය.

(6) මණ්ඩලය විසින් නිශ්චය කළ හැකි ප්‍රමාණ අනුව වන්දි විනිශ්චය සභාවේ සාමාජිකයන්ට, නිලධරයන්ට හා සේවකයන්ට ගෙවීම් කළ යුතු ය.

70(ට) (1) වන්දි ප්‍රදානය කිරීම පිණිස කරනු ලබන යොමු කිරීම් සලකා බලා නිශ්චය කිරීම සඳහා, වන්දි විනිශ්චය සභාවේ සභාපතිගේ හෝ ඔහු නො පැමිණෙන විටක උපසභාපතිගේ හෝ නියමය යටතේ, ලේකම් විසින් විනිශ්චය සභාවේ රැස්වීම් කැඳවිය යුතු ය.

(2) වන්දි විනිශ්චය සභාවේ සභාපති හෝ උප සභාපති සහ සෙසු සාමාජිකයන් හතර දෙනකු ද විනිශ්චය සභාවේ රැස්වීමකට කැඳවිය යුතු ය. ඒ සෙසු සාමාජිකයන් ලේකම් විසින් කුසපත් ඇදීමෙන් තෝරා ගත යුතු ය. විනිශ්චය සභාවේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(3) වන්දි ප්‍රදානය කිරීම සඳහා කරනු ලබන වෙන් වෙන් යොමු කිරීම් ගැන සලකා බලා විනිශ්චය කිරීම පිණිස වෙන වෙන ම රැස්වීම් දෙකක් කැඳවා එක ම වේලාවක දී පැවැත් විය හැකි ය.

(4) වන්දි විනිශ්චය සභාවේ රැස්වීමකට සභාපති හෝ උපසභාපති කැඳවනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, සභාපති විසින් හෝ උපසභාපති විසින් ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය. තව ද සභාපති හෝ උපසභාපති නො පැමිණෙන අවස්ථාවක,ඒ රැස්වීමට කැඳවනු ලැබ එහි පැමිණ සිටින විනිශ්චයසභාවේ සාමාජිකයන් විසින් රැස්වීම සඳහා සභාපති කෙනකු තමන්අතුරෙන් ම තෝරා ගත යුතු ය.

(5) වන්දි ප්‍රදානයක් සඳහා වූ යොමු කිරීමක විෂය වන යම් කරුණක් ගැන සැලකිල්ල දක්වන, හෝ ඒ කරුණ හා සම්බන්ධකම් ඇති යම් තැනැත්තකු විසින් හෝ ඔහු වෙනුවෙන් ඒ කරුණ පිළිබඳ ව අධිනීතිඥයකු වශයෙන් හෝ නීතිඥයකු වශයෙන් හෝ අන් කිසි තත්ත්වයක් දරන්නකු වශයෙන් ස්වකීය අදහස් විමසනු ලැබ සිටින වන්දි විනිශ්චය සභාවේ සාමාජිකයකු ඒ යොමු කිරීම පිළිබඳ වූ විනිශ්-චය සභාවේ රැස්වීමක කටයුතුවලට සහභාගි නො විය යුතු ය.

(6) වන්දි විනිශ්චය සභාවේ රැස්වීමක් කලින් කල කල් දැමීම හෝ අඛණ්ඩ ව කල් තැබීම කළ හැකි ය.

70(ඩ) (1) වන්දි ප්‍රදානයක් සඳහා වූ සෑම යොමු කිරීමක් ම වන්දි විනිශ්චය සභාවේ රැස්වීමක දී සලකා බලා විනිශ්චය කළ යුතු ය.

(2) වන්දි ප්‍රදානයක් සඳහා වූ එක් එක් යොමු කිරීමක් වන්දි විනිශ්චය සභාව විසින් සලකා බලනු ලැබ නිශ්චය කිරීම සඳහා දිනයක්, වේලාවක් සහ ස්ථානයක් ද ලේකම් විසින් නියම කළ යුතු ය.

(3) වන්දි ප්‍රදානයක් සඳහා වූ සෑම යොමු කිරීමක් ම සම්බන්ධයෙන්, වන්දි විනිශ්චය සභාව ඉදිරියෙහි ඒ යොමු කිරීමට අදාළ ව කෙරෙන සියලු කටයුතුවල වාර්තාවක් ලේකම් විසින් තැබිය යුතුය.

70(ණ) (1) වන්දි විනිශ්චය සභාවේ සභාපතිට හෝ උපසභාපතිට ද, විනිශ්චය සභාවේ යම් රැස්වීමක මුලසුන සභාපති හෝ උපසභාපති නො දරන්නේ නම්, ඒ රැස්වීමේ සභාපතිට ද, වන්දි ප්‍රදානයක් සඳහා වූ යම් යොමු කිරීමක් ගැන සලකා බලා තීරණය කිරීමේ කාර්යයන් සඳහා —

(අ) සාක්ෂිකරුවන් කැඳවීමට හා පැමිණ සිටින ලෙස ඔවුන්ට බල කිරීමට ;

(ආ) ලේඛන ඉදිරිපත් කරන ලෙස බලකිරීමට ; සහ

(ඇ) සාක්ෂිකරුවන් ලවා යම් දිවුරුමක් හෝ සහතික ප්‍රකාශයක් කරවීමට ද

ප්‍රදේශ අධිකරණයක සියලු බලතල තිබිය යුතු ය.

(2) වන්දි විනිශ්චය සභාවේ රැස්වීමක් ඉදිරිපිට යම් කරුණක් ගැන සාක්ෂි දෙන සෑම තැනැත්තකුම ඒ කරුණ පිළිබඳ ව සත්‍යය ප්‍රකාශ කිරීමට බැඳී සිටිය යුතු ය.

(3) සාක්ෂිකරුවකු වශයෙන් වන්දි විනිශ්චය සභාවේ රැස්වීමකට පැමිණෙන සෑම තැනැත්තකුට ම ඒ රැස්වීමේ සභාපති විසින් නිශ්චය කළ හැකි මුදලක් ගමන් ගාස්තු හා වෙනත් වියදම් වශයෙන් ගෙවිය යුතු ය.

70(ත) (1) වන්දි විනිශ්චය සභාවේ රැස්වීමක දී සලකා බලනු ලැබූ යම් කරුණක් පිළිබඳ ව ඒ රැස්වීමේ දී බැස ගන්නා ලද තීරණය ඒ කරුණ සම්බන්ධව වන්දි විනිශ්චය සභාවේ තීරණය වශයෙන් සැළකිය යුතු ය.

(2) යම් කරුණක් ගැන සලකා බලන වන්දි විනිශ්චය සභාවේ සාමාජිකයන් ඒ කරුණ පිළිබඳ වූ තීරණය ගැන එකඟ නො වන විට, ඔවුන් අතුරෙන් වැඩි ගණනකගේ තීරණය ඒ කරුණ සම්බන්ධයෙන් විනිශ්චය සභාවේ තීරණය විය යුතු අතර, ස්වකීය මතය අනුව ඔවුන් සම සම ව බෙදී සිටින විට, ඒ කාරණය ගැන සලකා බැලූ රැස්වීමේ සභාපති විසින් සනාථ කරනු ලබන තීරණය ඒ කරුණ පිළිබඳ ව විනිශ්චය සභාවේ තීරණය විය යුතු ය.

(3) වන්දි විනිශ්චය සභාවේ සෑම තීරණයක ම ඒ සඳහා වූ හේතු අඩංගු විය යුතු ය.

70(ද) කාර්‍ය්‍යපටිපාටිය සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයෙහි අඩංගු විධිවිධානවලට යටත් ව, සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්‍ය්‍ය පටිපාටිය වන්දි විනිශ්චය සභාව විසින් නියම කළ හැකි ය.

70(න) වන්දි ප්‍රදානයක් සඳහා වූ කරුණක් වන්දි විනිශ්චය සභාව වෙත යොමු කරනු ලබන අවස්ථාවක, වන්දි විනිශ්චය සභාව විසින් ප්‍රදානයක් කිරීමට පෙර, තමා ම පෙනී සිට හෝ ඒ සඳහා බලය පවරනු ලැබූ නියෝජිතයකු මගින් කරුණු කියා සිටීමේ අවස්ථාවක්, බැංකුවටත් වන්දි ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති සෑම තැනැත්තකුටත් ලබා දිය යුතු ය.

70(ප) (1) මේ පරිච්ඡේදය යටතේ බැංකුව වෙත පවරනු ලැබූ යම් භූමිභාගයක තත්ත්වය පිළිබඳ ව බැංකුව විසින් හෝ බැංකුවේ බලය යටතේ සකස් කරනු ලැබූ යම් වාර්තාවක පිටපතක් ඒ භූමිභාගය හා සම්බන්ධතාවයක් ඇති යම් වන්දි ඉල්ලුම්කරුවකුට භාර දෙනු ලබන අවස්ථාවක, ඒ ඉල්ලුම්කරු සම්බන්ධයෙන් අදාළ වන පමණට, වන්දි විනිශ්චය සභාව ඉදිරියෙහි ඉල්ලුම්කරුගේ ඉල්ලීමට අදාළ වන යම්

නීති කෘත්‍යයක දී, ඒ වාර්තාව, එහි ප්‍රති විරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක්, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් මුල් බැල්මට පිළිගත යුතු ය යි හැඟෙන සාක්ෂි විය යුතු ය.

(2) යම් භූමිභාගයක් සම්බන්ධයෙන් වූ වන්දිය බැංකුව විසින් තක්සේරු කරනු ලැබ, ඒ තක්සේරුවෙහි පිටපතක් ඒ වන්දිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වී ඇති යම් ඉල්ලුම්කරුවකුට බාර දෙනු ලැබූ විට, වන්දිය විනිශ්චය සභාව ඉදිරියෙහි ඉල්ලුම් කරුගේ ඉල්ලීමට අදාළ වන යම් නීති කෘත්‍යයක දී, ඒ තක්සේරුව, එහි ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක්, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් මුල් බැල්මට පිළිගත යුතු ය යි හැඟෙන සාක්ෂි විය යුතු ය.

(3) බැංකුව වෙත පවරනු ලැබූ යම් භූමිභාගයක තත්ත්වය පිළිබඳ වාර්තාවක්, හෝ යම් වන්දියක් ගැන බැංකුවේ තක්සේරුව, වන්දි විනිශ්චය සභාව ඉදිරියෙහි වන්දි ඉල්ලීමකට අදාළ වන යම් නීති කෘත්‍යයක දී මේ වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධාන යටතේ එහි ලා ප්‍රකාශ කරනු ලබන කරුණු පිළිබඳ ව මුල් බැල්මට පිළිගත යුතු ය යි හැඟෙන සාක්ෂි වන විට, මේ පරිච්ඡේදය මගින් හෝ එය යටතේ නියම කරනු ලබන පරිදි ඒ ලේඛනය බැංකුව වෙත ඉදිරිපත් නො කරන ලද්දේ නම්, ඒ වාර්තාව ගැන හෝ තක්සේරුව ගැන යම් විරුද්ධතාවයක් සනාථ කිරීම සඳහා ලේඛනයක් ඒ නීති කෘත්‍යයේ දී ඉදිරිපත් කිරීමට ඉල්ලුම්-කරුට හිමිකම් නො ලැබිය යුතු ය.

70(ඛ) (1) බැංකුව වෙත සතු කරනු ලැබූ යම් භූමි භාගයක් සම්බන්ධයෙන් වන්දි ප්‍රදානයක් සඳහා වූ යොමු කිරීමක් වන්දි විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, විනිශ්චය සභාව විසින් ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලු කරුණු සලකා බැලීමෙන් පසුව හා එබඳු සියලු සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි විභාග කිරීමෙන් පසු ව ද, 70 (න) වන හා 70(ප) වන වගන්තිවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරී-මෙන් පසු ව ද, (2) වන උපවගන්තියෙහි අන් ලෙසකින් විධිවිධාන යොදා ඇති පරිදි හැර ,—

(අ) වන්දි ඉල්ලීමක් කර ඇති එක් එක් තැනැත්තා වන්දි ලැබීමට සුදුසුකම් ලත් තැනැත්තෙක් ද නැති ද, යන්න, සහ එ සේ ඔහු සුදුසුකම් ලත් තැනැත්තෙක් නම්, ඔහු එලෙස සුදුසුකම් ලබන්නේ කිනම් තත්ත්වයක කෙනකු වශයෙන් ද යන වග ;

(ආ) මේ පරිච්ඡේදයෙහි විධිවිධාන අනු ව ඒ භූමි භාගය සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල ; සහ

(ඇ) වන්දි ලැබීමට සුදුසු තැනැත්තන් අතර වන්දිය කොටස් කර බෙදීම

යන කරුණු තීරණය කරන ප්‍රදානයක් කළ යුතු ය ;

එසේ වුව ද වන්දි ලැබීමට සුදුසු තැනැත්තන් පිළිබඳව හෝ ඒ වන්දිය ලැබීමට සුදුසු තැනැත්තන් අතර ඒ වන්දි කොටස් කර බෙදීම පිළිබඳ ව ආරාවුලක් ඇති වූ විට, ප්‍රදානයක් කිරීම විනිශ්චය සභාව විසින් ප්‍රමාද කොට, ඒ භූමිභාගය පිහිටා ඇත්තේ යම් ප්‍රදේශ අධිකරණයක අධිකරණ සීමාව ඇතුළත ද ඒ ප්‍රදේශ අධිකරණය වෙත, ඒ ආරාවුල තීරණය කිරීම සඳහා, යොමු කළ යුතු ය. ඉක්බිති ව ඒ අධිකරණය හෝ, ආයාචනයක දී නම් ශ්‍රේෂ්ඨාධිකරණය හෝ, ඒ ආරාවුල පිළිබඳ ව ස්වකීය තීරණය දුන් පසු, ඒ තීරණය අනු ව ප්‍රදානයක් විනිශ්චය සභාව විසින් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි අතුරු විධානය යටතේ ප්‍රදේශ අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ යොමු කිරීමක දී ඒ සම්බන්ධ යෙන් ඒ අධිකරණයෙහි තීරණය ගැන සෑහීමට පත් නො වන යම්

තැනැත්තකු විසින්, සිවිල් නඩුවල දී ලැබෙන තීන්දු ප්‍රකාශයන්ට විරුද්ධ ව ආයාචනා කිරීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි විධිවිධාන යොදු ඇති කාලය ඇතුළත ඒ ආකාරයෙන්, ඒ තීරණයට විරුද්ධ ව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ආයාචනය කළ හැකි ය. මේ උප වගන්තිය යටතේ යම් ආයාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ විට ඒ පිළිබඳ ව ඒ අධිකරණයෙහි තීරණය අවසාන තීරණය විය යුතුය.

(3) බැංකුව වෙත සතු කරනු ලැබූ යම් භූමි භාගයක් සම්බන්ධයෙන් කිසි ම තැනැත්තකු වන්දි ඉල්ලීමක් ඉදිරිපත් නො කරන අවස්ථාවක, (1) වන උපවගන්තියේ (අ) සහ (ඇ) ඡේදයන්හි නිශ්චිතව සඳහන් කරුණු මේ වගන්තිය යටතේ වූ ප්‍රදානයෙහි දී නිශ්චය කිරීමත් වන්දි ඉල්ලුම් කරුවන්ට ප්‍රදානය පිළිබඳ ව දැන්වීම් නිකුත් කිරීමට අදාළ වන (4) වන උපවගන්තියෙහි විධිවිධානවලට අනුකූල ව ක්‍රියා කිරීමත් අවශ්‍ය නො විය යුතු ය.

(4) වන්දි ප්‍රදාන පිළිබඳ ලිඛිත දැන්වීම් බැංකුවටත් වන්දි ඉල්ලුම් කරුවන්ටත් නිකුත් කරනු ලැබීමට වන්දි විනිශ්චය සභාව විසින් සැලැස්විය යුතු ය.

(5) වන්දි විනිශ්චය සභාව විසින් කරනු ලැබූ ප්‍රදානයක් අවසාන ප්‍රදානය විය යුතු අතර කිසි ම අධිකරණයක දී ඒ පිළිබඳ ව ප්‍රශ්න නො කළ යුතු ය.

70(ම) ඉල්ලීම ඉදිරිපත් කිරීමට මේ පරිච්ඡේදයෙහි ඉහත සඳහන් විධිවිධාන යටතේ සුදුසුකම් ලත් යම් තැනැත්තකු විසින් යම් භූමිභාගයක් අත්කර ගැනීම සඳහා බැංකුව වෙත කරනු ලැබූ ඉල්ලීමක ප්‍රතිඵල වශයෙන් බැංකුව වෙත සතු කරනු ලැබූ යම් භූමිභාගයක් ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තා මිය ගොස් නම් ඒ තැනැත්තාගේ පුරුෂයා/භාර්යාව ජීවත් ව සිටිතහොත් ඒ පුරුෂයාට/භාර්යාවට හෝ එසේත් නැතහොත් ඒ තැනැත්තාගෙන් පැවතෙන යමෙකුට බැංකුව විසින් කුලියට දිය හැකි අතර, එය කුලියට දෙනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් කුලී වශයෙන් යම් අර්ධ වාර්ෂික ගෙවීම් ගණනක් කිරීමෙන් පසු ඔහුට ඒ භූමිභාගයෙහි අයිතිකරු වීමට හැකි වන කොන්දේසි යටතේ ඒ කුලියට දීම කළ යුතු ය.

70(ය) මේ පරිච්ඡේදය යටතේ යම් භූමිභාගයක් අත්කර ගැනීමට බැංකුවට බලය පැවරී තිබේ ද ඒ භූමිභාගය පිළිබඳ පරීක්ෂණයක්, විභාගයක් හෝ සමීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය යයි බැංකුව සලකන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් අවශ්‍ය විය හැකි තැනැත්තන්, උපකරණ, ද්‍රව්‍ය, වාහන හා සතුන් ද සහිත ව ඒ භූමිභාගයටඇතුළු වී එහි මට්ටම් ගැනීමත්, ඒ පරීක්ෂණයේ, විභාගයේ හෝ සමීක්ෂණයේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සෙසු සියලු කටයුතු කිරීමත් නිත්‍යානුකූල විය යුතු ය.

එ සේ වුව ද ඒ භූමිභාගයට ඇතුළුවීමට හෝ එහි දී එබඳු කටයුතු කිරීමට හෝ තමාට ඇති අදහස ගැන යටත් පිරිසෙයින් දින හතක ලිඛිත දැන්වීමක් ඒ ඒ භූමිභාගයෙහි අයිතිකරුට හෝ පදිංචිකරුට දී ඇති නම් මිස මේ වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධානවලින් තමා වෙත පවරනු ලැබූ බලතල අනු ව, කිසි ම තැනැත්තකු විසින් යම් භූමිභාගයකට ඇතුළුවීම හෝ එහි දී යම් ක්‍රියාවක් කිරීම නො කළ යුතු ය.

70(අඅ) (1) මණ්ඩලයේ සභාපති විසින් හෝ ඒ සභාපති විසින් ඒ සඳහා බලය පවරා දෙනු ලැබූ වෙන යම් තැනැත්තකු විසින් ලිඛිත දැන්වීමක මාර්ගයෙන්, බැංකුව වෙත හෝ ඒ දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් විය හැකි නිලධරයකු වෙත නියමිත දිනයට පෙර —

(අ) 70(ආ) වන වගන්තියෙහි සඳහන් වූ ද, ඒ තැනැත්තා අයිතිකරු වූ හෝ යම් කලෙක අයිතිකරු ව සිටියා වූ ද යම් ස්ථානයකට අදාළවන නියමිත විස්තර අඩංගු, නියමිත ආකෘතියෙන් යුත්, වාර්තාවක් ; හෝ

(ආ) ඒ තැනැත්තා විසින් සපයනු ලැබූ යම් වාර්තාවක සඳහන් යම් විස්තර සම්බන්ධයෙන් බැංකුවට වුවමනා විය හැකි තොරතුරක් හෝ විස්තරයක් ; නැතහොත්

(ඇ) ඒ තැනැත්තා විසින් සපයනු ලැබූ යම් වාර්තාවක හෝ යම් තොරතුරක සඳහන් යම් විස්තරයක් සනාථ කිරීමේ කාර්යය සඳහා බැංකුවට වුවමනා විය හැකි ලේඛන ගත හෝ වෙනත් සාක්ෂි

සපයන ලෙස යම් තැනැත්තකුට නියම කළ හැකි ය.

(2) 70(ආ) වන වගන්තියෙහි සඳහන් යම් භූමිභාගයක සැලැස්මක් යම් තැනැත්තකුට තිබෙන අවස්ථාවක, බැංකුව විසින් ඒ භූමිභාගයෙහි මායිම් හා ප්‍රමාණය සනාථ කළ හැකි වන පරිදි දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් බැංකුවේ නිලධරයා වෙත නියමිත දිනයට පෙර ඒ සැලැස්ම ඉදිරිපත් කරන ලෙස ලිපිගත දැන්වීමක මාර්ගයෙන් මණ්ඩලයෙහි සභාපති විසින් හෝ සභාපති විසින් බලය පවරා දෙනු ලැබූ වෙන යම් තැනැත්තකු විසින් මෙහි මුලින් සඳහන් ඒ තැනැත්තාට නියම කළ හැකි ය.

(3) මේ වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධාන යටතේ යම් තැනැත්තකුට දෙනු ලැබීමට නියමිත යම් දැන්වීමක් වෙතොත්, ඒ දැන්වීම —

(අ) ඔහුගේ නිවෙස වෙත හෝ ඔහුගේ ව්‍යාපාරික ස්ථානය වෙත හෝ ඔහුගේ නියෝජිතයා වෙත ලියාපදිංචි කළ ලිපියක මාර්ගයෙන් තැපෑලෙන් එවා ඇති නම් ; හෝ

(ආ) ඒ නිවසෙහි හෝ ස්ථානයෙහි ප්‍රකට ස්ථානයක සවිකර ඇති නම් ;හෝ

(ඇ) ඒ දැන්වීම නිකුත් කරන දිනයෙහි ඒ තැනැත්තා ඒ දැන්වීම අදාළ වන භූමි භාගයෙහි අයිතිකරු වූ අවස්ථාවක, ඒ භූමිභාගයෙහි පදිංචි ව සිටින්නා වෙත ලියාපදිංචි කළ ලිපියක මාර්ගයෙන් තැපෑලෙන් යවා ඇති නම් හෝ ඒ භූමිභාගයෙහි පිහිටි ගොඩනැගිල්ලක ප්‍රකට කොටසක, හෝ එහි ප්‍රකට තැනක ගසක හෝ කණුවක සවි කර ඇති නම්

ඔහු වෙත නිකුත් කරනු ලැබී ඇතැ යි සැලකිය යුතු ය.

(4) (අ) මේ වගන්තිය යටතේ තමාට දෙනු ලැබූ යම් දැන්වීමක යම් නියමයක් කඩ කරන ; හෝ

(ආ) වාර්තාවක් හෝ යම් තොරතුරක් හෝ පැහැදිලි කිරීමක් හෝ සාක්ෂියක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට, අසත්‍ය වූ යම් විස්තර ඇතුළත් වාර්තාවක් හෝ යම් අසත්‍ය තොරතුරක්, පැහැදිලි කිරීමක් හෝ සාක්ෂියක් දැන දැනම සපයන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරිපිට ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු කිරීමේ දී, රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද යටත් විය යුතු ය.

70(ආආ) (1) මේ පරිච්ඡේදයෙහි විධිවිධාන යටතේ යම් භූමි භාගයක් අත්කර ගැනීමේ අදහසින්, ඒ භූමිභාගයෙහි වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා භූමිභාගය පරීක්ෂා කිරීමට මණ්ඩලයේ සභාපති

බලය පැවරූ යම් තැනැත්තකු විසින් ඒ භූමිභාගය පරීක්ෂා කර ඇති අවස්ථාවක, ඒ භූමිභාගයට හෝ ඒ භූමිභාගයෙහි යම් වැවිල්ලකට, ගොඩනැගිල්ලකට හෝ වෙනත් ඉදි කිරීමකට අලාභයක් සිදු කිරීම හෝ අලාභයක් සිදු කිරීමට අවසර දීම, හෝ ඒ භූමිභාගයෙහි වටිනාකම අඩු කරන අන් කිසි ක්‍රියාවක් කිරීම හෝ කිරීමට අවසර දීම 70(අඅ) වන වගන්තිය යටතේ දෙනු ලබන දැන්වීමක ආකාරයට දෙනු ලබන ලිඛිත දැන්වීමක මගින්, ඒ සභාපති විසින්, ඒ භූමිභාගයෙහි අයිතිකරුට හෝ පදිංචිකරුට තහනම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට යම් භූමිභාගයක් සම්බන්ධයෙන් දැන්වීමක් දී තිබේ ද, මේ පරිච්ඡේදයෙහි විධිවිධාන යටතේ පනවනු ලැබූ සතු කිරීමේ ආඥාවකින් ඒ භූමිභාගය බැංකුව වෙත නොපැවරීමට තීරණය කර ඇති අවස්ථාවක, මණ්ඩලයේ සභාපති විසින් ඒ දැන්වීම වහා ම අවලංගු කොට එසේ අවලංගු කිරීම ගැන ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරනු ලැබූ දැන්වීමක් කඩ කරන තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියෙහි ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පන්සියයකට නො වැඩි දඩයකට යටත් විය යුතු ය.

70(ඇඇ) මේ පරිච්ඡේදය යටතේ යම් කරුණක හෝ නීතිකෘත්‍යයක ඇති වන කිසි ම අනියම් භාවයක් හෝ විධිමත් නොවීමක් හේතු කොට ගෙන මේ පරිච්ඡේදය යටතේ බැංකුව වෙත සතු කරනු ලැබූ යම් ඉඩමක අයිතිය අවලංගු නො විය යුතු ය, නැතහොත් ඒ අයිතිය කෙරෙහි බල පෑමක් සිදු නො විය යුතු ය.

70(ඇඇ) වන්දි විනිශ්චය සභාවේ සාමාජිකයන් ට, නිලධරයන්ට හා සේවකයන්ට ගෙවීමට නියමිත වේතනය ද සාක්ෂිකරුවන් වශයෙන් විනිශ්චය සභාවේ රැස්වීමකට පැමිණෙන තැනැත්තන්ට ගමන් ගාස්තු හා වෙනත් වියදම් වශයෙන් ගෙවීමට නියමිත මුදල් ද ඇතුළත් ව මේ පරිච්ඡේදය පිළිබඳ පරිපාලනය සඳහා දරනු ලබන සියලු වියදම්, බැංකුව විසින් ගෙවිය යුතු ය.

70(ඉඉ) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය නොවුවහොත් මේ පරිච්ඡේදයෙහි —

'' කෘෂිකාර්මික භූමිභාගය '' යන්නෙන්, කෘෂි කර්මයෙහි හෝ උද්‍යාන විද්‍යාවෙහි කාර්යය සඳහා, නැතහොත් ගව ආදී සතුන්, කුකුළු ආදී සතුන් හෝ මීමැස්සන් නඩත්තු කිරීම හෝ ඇති කිරීම ද, පළතුරු, එළවළු හා එබඳු දේ වගා කිරීම ද ඇතුළත් ව ගොවිකම් කිරීමේ යම් කාර්යයක් සඳහා සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කළ හැකි යම් දේපළක් හෝ ස්ථානයක් අදහස් වේ ;

'' ව්‍යාපාරික භූමිභාගය '' යන්නෙන් කෘෂිකාර්මික භූමිභාග හෝ නේවාසික භූමිභාග හැර අන් කිසි භූමිභාගයක් අදහස් වේ ;

'' වන්දි විනිශ්චය සභාව '' යන්නෙන්, මේ පරිච්ඡේදය යටතේ පිහිටුවනු ලැබූ වන්දි විනිශ්චය සභාව අදහස් වේ ;

බැංකුව වෙත සතු කරනු ලැබූ යම් භූමිභාගයක් සම්බන්ධයෙන්, '' වෙළෙඳ අගය '' යන්නෙන්, ඒ භූමිභාගය බැංකුව වෙත සතු කරනු ලැබූ දිනයෙහි ඒ භූමිභාගය විවෘත වෙළෙඳපොළේදී විකිණීමෙන් ලැබිය හැකි මිල අදහස් වේ ;

බැංකුව වෙත සතු කරනු ලැබූ යම් භූමිභාගයක් සම්බන්ධයෙන්, '' සම්බන්ධතාවයක් දැක් වූ තැනැත්තා '' යන්නෙන්, ඒ භූමිභාගය සතු කරනු ලැබූ දිනයට පෙරාතුව ම කොන්දේසි රහිත ව තමා සඳහා ම හෝ අන් කිසි තැනැත්තකු සඳහා භාරයෙහි වුව ද, අයිතිකරු වශයෙන්, හවුල්කරු වශයෙන්, උකස් හිමි වශයෙන්, බද්දකරු වශයෙන් හෝ අන් ලෙසකින් ඒ භූමිභාගය පිළිබඳ සම්බන්ධතාවක් ඇති තැනැත්තෙක් අදහස් වේ ;

'' නේවාසික භූමිභාගය '' යන්නෙන් පදිංචි ව සිටීමේ කාර්යයන් සඳහා සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් එවකට පාවිච්චි කරනු ලබන යම් භූමිභාගයක් අදහස් වේ ;

යම් තැනැත්තකු සම්බන්ධයෙන් යොදනු ලබන කල, ''ස්වාමියා/භාර්‍යාව '' යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාගේ ස්වාමි පුරුෂයා හෝ භාර්යාව අදහස් වන අතර, සිරිත් පරිදි හා ප්‍රසිද්ධිය අනුව හෝ චාරිත්‍රානුකූලව සිදුවන විවාහයක දී ඒ විවාහයට ඇතුළත් වන යම් පාර්ශ්වයක් අදහස් වේ ;

'' තක්සේරු වර්ෂය '' යන්නට 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය.

32. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 71 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

71. මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියක් අනුව සහ එසේම නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් බැංකුවෙහි ගණන් තබනු ලැබීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය. ''

33. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 72 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලැබේ.

34. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 73 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

73. මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව ඇමතිවරයා විසින් බලය පවරනු ලබන්නා වූ ද මුදල් ඇමතිවරයාගේ අත්සන සහිතව ආපසු ගෙවීම ලංකා රජය විසින් සහතික කරනු ලබන්නා වූ ද මුදලකට වැඩි වන පරිදි බැංකුවෙහි ගිණුම්වල ගණන් ඉක්මවා මුදල් ලබා නො ගත යුතු ය.

35. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 74 සිට 80 තෙක් වූ වගන්ති (වගන්ති දෙකම ඇතුළත්ව ) මෙයින් අවලංගු කරනු ලැබේ.

36. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 82 සිට 85 තෙක් වූ වගන්ති (වගන්ති දෙකම ඇතුළත්ව ) මෙයින් අවලංගු කරනු ලැබේ.

37. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 87 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලැබේ.

38. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 87(අ) වන වගන්තිය, එහි '' කළමනාකරු, ගණකාධිකාරී සහ අධ්‍යක්ෂවරුන්ගෙන් වැඩි සංඛ්‍යාවක් ''යන යෙදුම වෙනුවට ''සාමාන්‍යාධිකාරී, ගණකාධිකාරී අධ්‍යක්ෂවරුන්ගෙන් වැඩි සංඛ්‍යාවක් සහ ගණන් පරීක්ෂකවරු '' යන යෙදුම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

39. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 89 වන වගන්තිය, එහි '' සෑම ගණන් පරීක්ෂකයකුට ම අර්ධ වාර්ෂික හා වාර්ෂික ගණන් ප්‍රකාශයන් සපයා දිය යුතු අතර, ඒවාට අදාළ ගණන් සහ ලේඛනත් සමග ඔහු විසින් ඒවා පරීක්ෂා කළ යුතු ය '' යන වචන වෙනුවට '' සෑම ගණන් පරීක්ෂකයකුට ම වාර්ෂික ගණන් ප්‍රකාශය සපයා දිය යුතු අතර ඒ ප්‍රකාශය ඔහු විසින් ඒවාට අදාළ ගණන් සහ ලේඛනත් සමඟ පරීක්ෂා කළ යුතු ය '' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

40. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 92 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡෙදයෙහි '' සහ වරප්‍රසාද '' යන යෙදුම වෙනුවට '' සහ වරප්‍රසාද, ඔවුන්ට ප්‍රසාද මුදල් ගෙවීම '' යන යෙදුම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

41. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 93 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය පහත සඳහන් පරිදි, එනම් :—

(1) ඒ උපවගන්තියේ (අ) ඡෙදයෙහි, —

(අ) ''කළමනාකරුගේ හා සහකාර කළමනාකරුගේ '' යන යෙදුම වෙනුවට '' සාමාන්‍යාධිකාරීගේ හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ '' යන යෙදුම ආදේශ කිරීමෙන්; සහ

(ආ) '' සේවා කොන්දේසි '' යන යෙදුම වෙනුවට '' සේවා කොන්දේසි ඔවුන්ට ප්‍රසාද මුදල් ගෙවීම '' යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ආ) ඡෙදයෙහි '' නීති උපදේශකයන් '' යන යෙදුම වෙනුවට '' නීති හා වෙනත් උපදේශකයන් ''යන යෙදුම ආදේශ කිරීමෙන්

මෙයින් සංශෝධනය කරනු ලැබේ.

42. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 94 වන වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපවගන්තියේ (ඇ) (ii) ඡෙදයෙහි '' සහ 51 වන වගන්තිය යටතේ ණය දෙනු ලැබිය හැකි අතිරේක කාර්යයන් '' යන වචන සහ ඉලක්කම් වෙනුවට '' සහ 51 වන වගන්තිය යටතේ නියම කළ යුතු ය යි ප්‍රකාශිත හෝ නියමිත කෙරුණු '' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම උපවගන්තියේ (ඊ) ඡෙදයෙහි '' පොළී ප්‍රමාණයන් නියම කිරීම '' යන වචන වෙනුවට '' පොළී ප්‍රමාණයන් නියම කිරීම ; '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම උපවගන්තිය අගට, පහත සඳහන් අලුත් ඡෙදය ආදේශ කිරීමෙන් :—

' (උ) v (අ) වන පරිච්ඡෙදයෙහි ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා එලගැන්වීම සඳහා, සහ යම් වන්දියක් තක්සේරු කිරීම හා ගෙවීම සම්බන්ධයෙන් යම් කරුණක් විධිමත් කිරීම හෝ v (අ) වන පරිච්ඡෙදය යටතේ නියම කරනු ලැබිය යුතුයයි ප්‍රකාශිත හෝ නියමිත යම් කරුණක් සඳහා. '

43. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 98 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි '' අධ්‍යක්ෂවරයකු හෝ ශාඛා සභාවක සාමාජිකයකු '' යන වචන වෙනුවට '' අධ්‍යක්ෂවරයකු '' යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි ''අධ්‍යක්ෂවරුන්ගේ, ශාඛා සභා සාමාජිකයන්ගේ '' යන වචන වෙනුවට '' අධ්‍යක්ෂවරුන්ගේ '' යන වචන ආදේශ කිරීමෙන් ද වේ.

44. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 99 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලැබේ.

45. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 100 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (iii) වන ඡෙදයෙහි '' කළමනාකරු '' යන යෙදුම වෙනුවට '' සාමාන්‍යාධිකාරී '' යන යෙදුම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

46. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 102 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ. :—

102. (1) බැංකුවෙහි පොදු මුද්‍රාව සාමාන්‍යාධිකාරිගේ භාරයෙහි තිබිය යුතු අතර එය සාමාන්‍යාධිකාරී ඉදිරිපිට දී හෝ, ඔහු නොමැති විට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසි ම නීත්‍යානුකූල ලේඛනයක මුද්‍රාව නො තැබිය යුතුය. තමන් පැමිණ සිටි බවට සාක්ෂ්‍ය වශයෙන් ඔවුන් සියලු දෙනා ම විසින් නීත්‍යානුකූල ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

(2) බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් බැංකුවෙහි පොදු මුද්‍රාව වෙනස් කළ යුතු ය. ''

47. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 103 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) '' යම් උකස් බැඳුම්කරයකින් '' යන වචන වෙනුවට '' යම් නීත්‍යානුකූල ලේඛනයකින් '' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) '' සම කොටස් ගෙවීම '' යන වචන වෙනුවට '' සම කොටස් හෝ වෙනත් ගෙවීම් '' යන වචන ආදේශ කිරීමෙන් ;

(3) '' ගෙවීම පැහැර හැර ඇති අර්ධවර්ෂය සඳහා ණය මුදල සම්බන්ධයෙන් '' යන වචන වෙනුව ට '' ණය මුදල සම්බන්ධයෙන් '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) එම වගන්තිය අගට පහත සඳහන් අතුරුවිධානය ඇතුළත් කිරීමෙන් ද වේ :—

'' එසේ වුව ද, මෙම වගන්තියෙහි ඉහත දැක්වූ විධිවිධානවල සඳහන් කරනු ලැබූ නියමිත ප්‍රමාණය අනුව පොළිය ගෙවීම මණ්ඩලය විසින් ස්වකීය පරම අභිමතය අනුව අත්හැර ඒ වෙනුවට, ගෙවීම පැහැර හැර ඇති කොටස් මුදල සම්බන්ධයෙන්, එම කොටස් මුදල ගෙවිය යුතු වූ දිනයෙන් පටන් ගෙන එය ගෙවූ දිනයෙන් අවසාන වන කාලපරිච්ඡේදය සඳහා, ගිවිස ගනු ලැබූ ප්‍රමාණය මෙන් දෙගුණයක් දක්වා වූ පොළියක් ගෙවිය යුතු ය යි ඔහු විසින් නිශ්චය කළ හැකි ය. ''

48. '' මණ්ඩලය '' යන වචනය 104 වන වගන්තියෙහි දක්නට ලැබෙන කොතැනක වුව ද ඒ වෙනුවට '' බැංකුව '' යන වචනය ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 104 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

49. පහත සඳහන් අලුත් වගන්තිය 106 වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 106(අ) වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය :—

106(අ) ණය බේරුම් කිරීමේ ආඥාපනතෙහි සහ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි විධිවිධාන බැංකුව කෙරෙහි මෙන් ම ඒ ඒ පිළිබඳ ව අදාළ නො විය යුතු ය ; තව ද එපරිද්දෙන් ඒ විධිවිධාන මෙම වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධානවලට යටත් ව කියවා තේරුම් ගත යුතු ය. ''

50. මෙම පනතෙහි 40 වන හා 41 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරනු ලැබූ සංශෝධන, සියලු කාර්යයන් සඳහා 1948 ඔක්තෝබර් 1 වැන දින සිට ක්‍රියාත්මක වී ඇතැයි සැළකිය යුතු අතර, ඒ අනුව —

(අ) ලංකා රජයේ උකස් බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය කළමනාකරුට, සහකාර කළමනාකරුට, යටත් කාර්යමණ්ඩලයට, සහ වෙනත් නිලධරයන්ට හා සේවකයන්ට ප්‍රසාද මුදල් ගෙවීමට අදළ ව මෙතෙක් පනවන ලද ව්‍යවස්ථා ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ යථා පරිදි පනවා ඇතැයි ද මෙම පනත පනවනු ලබන දිනයට පෙරාතුව සියලු වැදගත් අවස්ථාවන්හිදී වලංගුව බලපවත්වා ඇතැයි ද සැලකිය යුතුය.

(ආ) මෙම පනත පනවනු ලබන දිනයට පෙරාතුව බැංකුව විසින් හෝ එය වෙනුවෙන් ස්වකීය කළමනාකරුට, සහකාර කළමනාකරුට, යටත් කාර්ය මණ්ඩලයට සහ වෙනත් නිලධරයනට හා සේවකයන්ට මෙතෙක් ගෙවන ලද සියලු ප්‍රසාද මුදල් ප්‍රධාන ප්‍රඥප්තිය මගින් පවරනු ලබන බලතල යටතේ යථා පරිදි ගෙවා ඇතැයි සැළකිය යුතුය ; තව ද

(ඇ) මෙම පනත පනවනු ලබන දින සිට, එකී ව්‍යවස්ථා ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ යථා පරිදි පනවනු ලැබූ ව්‍යවස්ථා වූවාක් මෙන් වලංගු විය යුතු අතර, ඒ ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන ව්‍යවස්ථා මගින් එකී ව්‍යවස්ථා සංශෝධනය කිරීම, අවලංගු කිරීම, යමක් ඊට එකතු කිරීම හෝ ඒ වෙනුවට අනෙකක් යෙදීම කළ හැකි ය.

51. (1) ලංකා රජයේ උකස් බැංකුවෙහි සහකාර කළමනාකරු යන නමින් මෙතෙක් හඳුන්වනු ලැබූ පදවියෙහි පදවි නාමය වෙනස් කිරීම ගැන නොසලකා, මෙම පනත පනවනු ලබන දිනයට පෙරාතුවමවූ දිනයෙහි ඒ කළමනාකරු වශයෙන් පදවිය දරන තැනැත්තා, ඔහු තම සාමාන්‍යාධිකාරී පදවිය අත්හරින අවස්ථාව වන තෙක් බැංකුවෙහි සාමාන්‍යාධිකාරී පදවියෙහි නොකඩවා සේවය කළ යුතු ය.

(2) ලංකා රජයේ උකස් බැංකුවෙහි සහකාර කළමනාකරු යන නමින් මෙතෙක් හඳුන්වනු ලැබූ පදවියෙහි පදවි නාමය වෙනස් කිරීම ගැන නොසලකා, මෙම පනත පනවනු ලබන දිනයට පෙරාතුවමවූ දිනයෙහි ඒ සහකාර කළමනාකරු වශයෙන් පදවිය දරන තැනැත්තා ඔහු තම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පදවිය අත්හරින අවස්ථාව වන තෙක් බැංකුවෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පදවියෙහි නො කඩවාම සේවය කළ යුතු ය.

52. ( ප්‍රධාන ප්‍රඥප්තිය හැර ) වෙන යම් ලිඛිත නීතිගත කිසි යම් විධිවිධානයක හෝ ප්‍රධාන ප්‍රඥප්තිය මගින් හෝ එය යටතේ, නැතහොත් එබඳු යම් වෙනත් නීතියක් මගින් හෝ එය යටතේ නිකුත් කරනු ලැබූ, දෙනු ලැබූ, නියම කරනු ලැබූ හෝ බලය පවරනු ලැබූ යම් දූන්වීමක්, අවසර පත්‍රයක, නිවේදනයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක කිසි යම් විධිවිධානයක, '' ලංකා රජයේ උකස් බැංකුවෙහි කළමනාකරු '' යන යෙදුම හෝ '' ලංකා රජයේ උකස් බැංකුවෙහි සහකාර කළමනාකරු '' යන යෙදුම දක්නට ලැබෙන කොතැනක වුව ද ඒ වෙනුවට, අවස්ථාවෝචිත විය හැකි පරිදි, '' ලංකා රජයේ උකස් බැංකුවෙහි සාමාන්‍යාධිකාරී'' යන යෙදුම හෝ '' ලංකා රජයේ උකස් බැංකුවෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී '' යන යෙදුම ආදේශ කළ යුතුය ;

තව ද ඒ අනුව එබඳු යම් විධිවිධානයක '' කළමනාකරු '' යන සංක්ෂිප්තය ලංකා රජයේ උකස් බැංකුවෙහි කළමනාකරු හැඳින්වීමට හෝ '' සහකාර කළමනාකරු ''යන සංක්ෂිප්තය ලංකා රජයේ උකස් බැංකුවෙහි සහකාර කළමණාකරු හැඳින්වීමට යොද ඇති කොතැනක වුව ද අවස්ථාවෝචිත විය හැකි පරිදි, ලංකා රජයේ උකස් බැංකුවෙහි සාමාන්‍යාධිකාරී ගැන හෝ ලංකා රජයේ උකස් බැංකුවෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ගැන සඳහන් කිරීමක් වශයෙන් ඒ සංක්ෂිප්තය කියවා තේරුම් ගත යුතු ය.

## II වන කොටස

## 1963 අංක 11 දරන මුදල් පනතෙහි කෙරෙන සංශෝධනය

53. පහත සඳහන් අලුත් වගන්තිය 98 වන වගන්තියට ඉක්බිතිව මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය 1963 අංක 11 දරන මුදල් පනතෙහි VIII වන කොටසෙහි (98අ) වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

98(අ) මේ පනතේ මේ කොටසෙහි වෙන යම් විධිවිධානයක ප්‍රතිවිරුද්ධව කුමක් සඳහන් වුව ද, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥාවක් මගින් ඇමතිවරයා විසින් නියම කළ හැකි දිනයෙහි හෝ ඉන් පසු ව, මේ පනතෙහි මේ කොටසෙහි 71(2) වන වගන්තිය යටතේ වූ කිසි ම ඉල්ලීමක් බැංකුව වෙත ඉදිරිපත් නොකළ යුතුය ; නැතහොත් බැංකුව විසින් භාර නො ගත යුතුය.

**1968 අංක 34 දරණ ලංකා බැංකුව (සංශෝධන) පනත**

**ලංකා බැංකුව ආඥ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**( අනුමත කළ දිනය 1968 අගෝස්තු 5 වැනිද )**

1. මෙම පනත 1968 අංක 34 දරණ ලංකා බැංකුව ( සංශෝධන ) පනත යනුවෙන් හැඳින්විය හැක.

2. ලංකා බැංකුව ආඥ පනතේ, පළමු වැනි උප ලේඛනයේ, දෙවැනි කොටසේ අංක 3 හි (ඇ) සහ (ඈ) යන කොටස් ඉවත් කිරීමෙන් එය මෙයින් සංශෝධනය වේ.

---

**1968 අංක 36 දරණ මුදල් ( සංශෝධන ) පනත**

**1961 අංක 65 දරණ මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**( අනුමත කළේ 1968 අගෝස්තු 22 වැනි ද )**

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමැතිය අනුව හා ඇතිව, එහිම බලය ප්‍රකාර, අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජිණිය විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1968 අංක 36 දරණ මුදල් ( සංශෝධන ) පනත යනුවෙන් හැඳින්විය හැකි ය.

2. මේ පනතෙහි '' ප්‍රධාන පනත '' යනුවෙන් හඳුන්වනු ලබන 1961 අංක 65 දරණ මුදල් පනතේ 22 වන වගන්තියේ (1) වන උප වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(1අ) (1) වන උප වගන්තියෙහි සඳහන් යම් තැනැත්තෙකුගේ, නීතිගත සංස්ථාවක, ව්‍යාපාරික ආයතනයක හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක නාමයෙන් පිළිගත් යම් බැංකුවක ගිණුමක් ආරම්භ කිරීම (1) වන උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් ලෙස නොසැලකිය යුතුය. ''

3. ප්‍රධාන පනතෙහි 22 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 22 අ. වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතුය :—

22අ. (1) මුදල් මණ්ඩලයේ නිර්දේශය පිට ක්‍රියා කරන ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින්, 22 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි සඳහන් යම් බැංකුවක් නොවන, ඒ ආඥාවෙහි නම නිශ්චිතව සඳහන් කරනු ලබන වෙන යම් බැංකුවක් ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් කළ යුතු යම් දිනයක සිට, මේ වගන්තියේ කාර්‍ය්‍යයන් සඳහා පිළිගත් බැංකුවක් විය යුතු යයි කලින් කල ප්‍රකාශ කළ හැකිය.

(2) මුදල් මණ්ඩලයේ නිර්දේශය පිට ක්‍රියා කරන ඇමතිවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ආඥාවකින්, (1) වන උප වගන්තිය යටතේ තමා විසින් පළ කරන ලද යම් ආඥාවක් සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැකිය.

(3) යම් පිළිගත් බැංකුවක් විසින් පිළිපැදිය යුතු නියමයන් හා කොන්දේසි මුදල් මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කළ හැකිය. මුදල් මණ්ඩලය විසින් එබඳු සෑම නිශ්චය කිරීමක් ම ඒ බැංකුව වෙත ලියවිල්ලකින් දැන්විය යුතුය.

(4) මෙම වගන්තියට අනුකූලව ඇමතිතුමා විසින් කරනු ලබන සෑම ආඥාවක්ම ගැසට් පත්‍රයෙහි පළවූ විගස, නියෝජිත මන්ත්‍රණ සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වගන්තිය යටතේ, ඇමතිතුමා විසින් කරනු ලබන ඕනෑම ආඥාවක් එම ආඥාව ගැසට් පත්‍රයෙහි පළ කොට දින හැටක් ඇතුළත යෝජනාවක් සම්මත කිරීමෙන් අවලංගු කිරීමට, නියෝජිත මන්ත්‍රණ සභාවට හැකි වන අතර, එවැනි දින හැටක කාලයක් ගණන් බැලීමේදී, නියෝජිත මන්ත්‍රණ සභාවේ සභාවාර නවත්වා ඇති හෝ එම සභාව විසුරුවා හැර ඇති කාල සීමාවන් ගණන් ගත නොහැක. කිසියම් ආඥාවක් එලෙස අවලංගු කිරීමෙන් ඊට කලින් එම ආඥාව යටතේ කොට ඇති කාර්යයන්ගේ වලංගු භාවයට හානියක් නොවනු ඇත.

(5) යම් පිළිගත් බැංකුවක් විසින්, 22 (1) වන වගන්තියෙහි සඳහන් යම් තැනැත්තකුගේ, නීතිගත සංස්ථාවක, ව්‍යාපාරික ආයතනයක හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක නාමයෙන් කවර ගිණුමක් හෝ ඒ බැංකුවෙහි ආරම්භ කළ හැකිය.

(6) 22 වන වගන්තියෙහි හා මේ වගන්තියෙහි —

(අ) " පිළිගත් බැංකුව " යන පාඨයෙන්, (1) වන උප වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පළ කරනු ලැබූ ආඥාවක් යම් බැංකුවක් සම්බන්ධයෙන් තත් කාලයෙහි වලංගුව පවතින්නේ ද ඒ බැංකුව අදහස් වේ ;

(ආ) " මුදල් මණ්ඩලය " යන පාඨයෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ මහා බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ.

---

## 1968 අංක 38 දරණ විසර්ජන පනත

1968–69 මුදල් වර්ෂයේ සේවා සඳහා ද, එවැනි සේවා සඳහා ලංකාව තුළින් හෝ පිටතින් හෝ ණය ලබා ගැනීමට බලය පැවරීම සඳහා ද, එම මුදල් වර්ෂය රජයේ සමහර කටයුතු සම්බන්ධයෙන් මුදල් වෙන් කිරීම සඳහා ද, එම මුදල් වර්ෂය එවැනි කටයුතු සඳහා වියදම් කිරීම සඳහා ද, ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජය විසින් සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ද, එම මුදල් ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවීමට ඉඩ සැළසීමට ද, ඉහත කී කටයුතු වලට සම්බන්ධිතව හෝ අමතරව හෝ ඇති කරුණු සඳහා ඉඩ සැළසීමට ද, බලය පැවරෙන පනතකි.

(අනුමත කළේ 1968 සැප්තැම්බර් 29 වැනිද)

1. මෙම පනත 1968 අංක 38 දරණ විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) කිසියම් වියදමක් සඳහා බලය පැවරෙන වෙනත් නීතියකට හානියක් නොවන පරිද්දෙන්, 1968 ඔක්තෝබර් 1 වැනි දයින් පටන් ගෙන 1969 සැප්තැම්බර් 30 වැනි දයින් අවසන් වන මුදල් වර්ෂයේ සේවාවන් සඳහා තක්සේරු කරන ලද රජයේ වියදම රුපියල් දෙසිය අනූහත් කෝටි දෙළොස් ලක්ෂ නවසිය අනූ අටකි.

(අ) මෙයින් බලය පැවරෙන ගෙවීම්, ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජයේ සුදුස්සක් කළ හැකි කිසියම් වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් ද, සහ

(ආ) ලංකාණ්ඩුව වෙනුවෙන් සඳහා හෝ ලංකාව තුළින් හෝ පිටතින් හෝ මුළු වශයෙන් රුපියල් දශ ලක්ෂ 60 කුත් එකදහසකට නොවැඩිව ලබා ගැනීමට මෙයින් බලය පැවරෙන ණය වලින් ද ලබා ගත යුතුය.

මෙහි මීන් පෙර සඳහන් රුපියල් දෙසිය අනූහත් කෝටි දෙළොස් ලක්ෂ නවසිය අනූ අට මෙම පනතෙහි පළමුවෙනි උප වගන්තියෙහි නියමිත පරිදි වියදම් කළ යුතුය.

(2) මෙම වගන්තියේ (1) වැනි උප වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේදී, රජය සඳහා හෝ රජය වෙනුවෙන් ණය ගැනීම සඳහා බලය පැවරෙන වෙනත් කුමන හෝ ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොවිය යුතුය.

3. (1) මෙම පනතෙහි දෙවැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි නියමිත, ඒ ඒ කාර්යයන් සඳහා හෝ වෙනුවෙන් 11 වගන්තියේ සඳහන් වූ මුදල් වර්ෂය තුළ රජයේ ලැබීම්, ඒ ඒ කාර්යයන් සඳහා පෙන්වූ ගිණුමට බැර කළ යුතුය. එහෙත් එසේ බැර කරනු ලැබීම්, එම ලේඛණයෙහි 111 වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව, නොඉක්ම විය යුතුය. එවැනි උපරිම සීමාව ඉක්මවා එවැනි කාර්යයන්ගෙන් ලැබෙන ලැබීම් ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(2) මෙහි 2 වැනි වගන්තියේ සඳහන් මුල් වර්ෂය තුළ, මේ පණතෙහි 2 වැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි නියමය, ඒ ඒ කාර්යය උඩ රජය විසින් කෙරුන වියදම් එම මුදල් වර්ෂය තුළ එවැනි කාර්යයන්ගෙන් රජය ලැබෙන ලැබීම් වලින් ගෙවිය යුතුය. එහෙත් එවැනි වියදම්, එම උප ලේඛනයේ II තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

(3) දෙවැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය අවසානයේ, මේ පනතේ 2 වැනි උප ලේඛණයේ I වැනි තීරුවෙහි නියමිත කුමන කාර්යයක් හෝ සම්බන්ධ ඉතිරිව ඇති හර ශේෂය උප ලේඛණයේ IV වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නොඉක්මවිය යුතුය. එසේම එම මුදල් වර්ෂය අවසානයේදී එකී කටයුතු සඳහා වූ මුළු වගකීම එම උප ලේඛණයේ V වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

4. 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ, ඕනෑම අවස්ථාවක මේ පනතේ දෙවැනි උප ලේඛණයේ I වැනි තීරුවෙහි, නියමිත කුමන හෝ කාර්යයකින් රජයට ලැබෙන ලැබීම්, එවැනි කාර්යයන් සඳහා රජයෙන් කෙරෙන වියදම් පියවීමට ප්‍රමාණවත් නොවන්නේ නම්, එවැනි වියදම් පියවීමට මුදල් අමාත්‍යවරයා අවශ්‍ය යයි සිතන ප්‍රමාණයන් විටින් විට ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජයට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතුයයි මුදල් ඇමතිට නියෝගයකින් විධාන කළ හැකිය. එහෙත් එසේ අත්තිකාරම් වශයෙන් දෙන මුළු ප්‍රමාණය එම උප ලේඛණයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම වැය ප්‍රමාණය නොඉක්මවිය යුතුය. එවැනි කාර්යයන් සඳහා අත්තිකාරම් වශයෙන් දෙන යම් මුදලක් විධාන කරන පිළිවෙලට ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතුය.

5. මෙම පණතේ පළමුවන උප ලේඛණයේ විවිධානුසාරයෙන්, අංක 3, 5, සහ 7 යන වැය ශීර්ෂවලට හැර එම උප ලේඛණයේ නියමිත අනෙක් ශීර්ෂයක් යටතේ දක්වෙන වෙනත් වැය ශීර්ෂයකට, වෙන් කෙරුන යම් මුදලක් වැය කොට නොමැති නම්, හා වැය කෙරෙන ලෙසක් නොපෙනේ නම්, භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය පවරා ඇති වෙනත් ඕනෑම නිලධාරියෙකුගේ හෝ නියෝගය අනුව, එම ශීර්ෂය යටතේ වූ වෙනත් කුමන හෝ වැය ශීර්ෂයකට පැවරිය හැකිය.

6. මෙම පනතේ දෙවැනි උප ලේඛණයේ II වැනි, III වැනි, IV වැනි හෝ V වැනි තීරුවල නියමිත උපරිම සීමාවන් රජයේ අනුමැතිය ඇතිව, 1970 අප්‍රේල් 30 වැනිදට හෝ ඉන් පෙර මුදල් ඇමති විසින් නියෝග කිරීමෙන් වෙනස් කළ හැකිය. එවැනි කුමන හෝ නියෝගයක්, එසේ ප්‍රකාශ කර ඇත්නම්, එහි නියම කළ හැකි එකී නියෝගය පැනවීමේ දිනට, පෙර දිනක සිට නියෝගය ක්‍රියත්මක වී ඇති බැව් සැළකිය යුතුය.

7. මෙම පනතෙහි දෙවැනි උප ලේඛණයේ, උචිත තීරුවලට යම් කටයුත්තක් සහ එවැනි කටයුත්තකට සම්බන්ධ සියළුම හෝ කුමන හෝ උපරිම ප්‍රමාණයන් එකතු කොට, පාර්ලිමේන්තු යෝජනා සම්මුතියකින් සංශෝධනය කළ හැකිය.

(අ) පළමුවැනි උපලේඛණය.

1968 ඔක්තෝම්බර් 1 වැනිදයින් පටන් ගෙන, 1969 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වන මුදල් වර්ෂයේ පොදු සේවාවන් සඳහා ඒ ඒ වැය ශීර්ෂ යටතේ ගෙවිය හැකි ප්‍රමාණයන් කොටස් කොට දක්වා ඇත.

මෙකී සේවා සඳහා ගෙවිය හැකි මුළු ප්‍රමාණය රුපියල් දෙසිය අනූහත් කෝටි දෙළොස් ලක්ෂ නවසිය අනූ අටක් (රු. 2,971,200,998.00) යයි ඇස්තමේන්තු කර ඇත. මේ පණත් 2 (1) වැනි වගන්තිය යටතේ පවරා ඇති බලය යටතේ මෙම මුදල වැය කළ හැකිය.

(ආ) දෙවැනි උප ලේඛණය.

එම මුදල් වර්ෂය සඳහා රජයේ යම් යම් කටයුතු සම්බන්ධයෙන් කෙරුන මූල්‍ය ප්‍රතිපාදන බෙදා දක්වීමත්, මෙකී බෙදා දක්වීමෙහි, ඒ ඒ කාර්යාල ආයතන හා දෙපාර්තමේන්තු යටතේ සහ එකී කාර්යාල ආයතන හා දෙපාර්තමේන්තුවල යම්කිසි රජයේ කාර්යයන් සම්බන්ධයෙන්, රජයේ කටයුතුවල උපරිම වියදම් සීමාව, රජයේ කටයුතු ගිණුම්වලට බැර වශයෙන් ලැබිය හැකි උපරිම සීමාව, රජයේ කටයුතුවල හර ශේෂයන් සඳහා උපරිම සීමාව, සහ රජයේ කටයුතුවල වගකීම් සඳහා උපරිම සීමාව නියම කර ඇත. මෙකී මුදල් වියදම් කිරීම හා බැර කිරීම මේ පනතේ 3 වැනි වගන්තිය යටතේ පවරා ඇති බලය යටතේ දී ඇති බෙදා දක්වීම ප්‍රකාර සිදු කළ යුතුය.

---

**1968 අංක 50 දරන මුදල් (සංශෝධන) පනත**

**1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහාවූ පනතකි.**

**(සම්මත වූ දිනය: 1968 දෙසැම්බර් 24)**

1. මේ පනත 1968 අංක 50 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය.

2. මෙහි මින් මතු '' ප්‍රධාන පනත '' යනුවෙන් සඳහන් කරනු ලබන 1963 අංක 11 දරන මුදල් පනතේ 119 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි '' ලංකාවේ යම් ස්ථානයක පවත්වාගෙන යන '' යන වචන වෙනුවට '' ලංකාවෙහි පවත්වාගෙන යන '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියෙහි '' සම්බන්ධයෙන්, යම් තක්සේරු වර්ෂයක් සඳහා, '' යන වචන වෙනුවට '' සම්බන්ධයෙන්, 1968 සැප්තැම්බර් මස 30 වන දිනයෙන් හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, '' යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන පනතේ 120 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

'' (1අ) යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලැබූ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඔහුගෙන් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් අය විය යුතු ව තිබිය දී ඒ ව්‍යාපාරයේ අයිතියෙහි වෙනසක් සිදු වූ අවස්ථාවක, (1) වන උපවගන්තියෙහි වෙනසක් සිදු වූ අවස්ථාවක, (1) වන උපවගන්තියෙහි විධිවිධාන නො සලකා, අයිතියේ වෙනස සිදු වීමට පෙරාතුව ම ඒ ව්‍යාපාරයේ අයිතිකරු ඒ අලුත් අයිතිකරු වූවාක් මෙන් ඔහුගෙන් ඒ ව්‍යාපාර පිරිවැටුම් බද්ද අය කළ යුතු ය. '' :

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි —

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි '' ව්‍යාපාරය වෙනම ම ව්‍යාපාරයක් ලෙස සැලකිය යුතු ය ; තවද '' යන වචන වෙනුවට පහත සඳහන් පාඨ ආදේශ කිරීමෙන් :—

" ව්‍යාපාරය, —

(1) 1968 සැප්තැම්බර් මස 30 වන දිනයෙන් හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වෙනම ම ව්‍යාපාරයක් ලෙස සැලකිය යුතු අතර

(2) 1968 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ ව්‍යාපාරයේ ම කොටසක් ලෙස සැලකිය යුතු ය. " ;

(ආ) ඒ වගන්තියේ (අ) ඡේදයට ඉක්බිති ව ම පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (අඅ) තැනැත්තකු විසින් සමාන ස්වභාවයෙන් යුත් ව්‍යාපාර එකම ස්ථානයක හෝ වෙනස් ස්ථානවල පවත්වාගෙන යනු ලබන අවස්ථාවක, ඔහු විසින් එසේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර, 1968 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා එක් ව්‍යාපාරයක් වශයෙන් සැලකිය යුතුය; තවද " ; එසේ ම

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය අවලංගු කර ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

(3) (අ) මේ පනතේ මේ කොටසෙහි කාර්යයන් සඳහා, 1968 සැප්තැම්බර් මස 30 වන දිනයෙන් හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වූ " ව්‍යාපාරය " යන්නට වෙළෙඳාමක් හෝ රක්ෂාවක් ඇතුළත් වන නමුදු —

(1) යම් වෘත්තියක් ;

(2) යම් කෘෂිකාර්මික ව්‍යවසායක් ;

(3) නිෂ්පාදනය කරන ලද හෝ සකස් කරන ලද යම් භාණ්ඩයක් අපනයනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායක් ;

(4) බැංකුකරුවකුගේ, ධනාධිකාරිවරයකුගේ, මුදල් ණයට දෙන්නකුගේ, උකස් ගන්නකුගේ, කොමිස් පිට බඩු සපයන්නකුගේ හෝ තැරැව්කාරයකුගේ ව්‍යාපාරයක් ;

(5) යම් රක්ෂණ ව්‍යාපාරයක් ;

(6) අධ්‍යාපනික ආයතනයක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයක් ; හා

(7) නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුමතිය ඇතිව ඇමතිවරයා විසින් පනවනු ලැබ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද ආඥාවක් මගින් පිරිවැටුම, ව්‍යාපාර පිරිවැටුම් බද්දෙන් නිදහස් කරනු ලැබිය හැකි ව්‍යාපාරයක්

ඊට ඇතුළත් නොවේ.

(ආ) මේ පනතේ මේ කොටසේ කාර්යයන් සඳහා, 1968 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වූ " ව්‍යාපාරය " යන්නට තමා විසින් කරන ලද යම් ගණුදෙනු හෝ සේවා සඳහා කොමිස් හෝ ගාස්තු ගන්නා යම් තැනැත්තකුගේ යම් වෙළෙඳාමක්, වෘත්තියක්, රක්ෂාවක් හෝ ව්‍යාපාරයක් නැතහොත් ස්වාධීන කොන්ත්‍රාත්කරුවකුගේ ව්‍යාපාරයක් ඇතුළත් වන නමුදු —

(1) නිෂ්පාදනය කරනු නො ලැබූ හෝ සකස් කරනු නො ලැබූ කෘෂිකාර්මික හෝ සත්ව ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ යම් ව්‍යවසායක් ;

(2) එළු, ගව ආදී හෝ තාරා, කුකුළු ආදී සතුන් ඇති කිරීමේ කාර්යය සඳහා වූ යම් ව්‍යවසායක් ;

(3) කොප්පරා, කඳාපු පොල්, පොල් කෙඳි, ක්‍රෙප් රබර්, ෂීට් රබර් හෝ ( තේ කලවම් කිරීම සඳහා වූ ව්‍යවසායක් නො වන ) තේ නිෂ්පාදනය සඳහා වූ යම් ව්‍යවසායක් ;

(4) නිෂ්පාදනය කරන ලද හෝ සකස් කරන ලද යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායක් ;

(5) බැංකුකරුවකුගේ, ධනාධිකාරිවරයකුගේ, මුදල් ණයට දෙන්නකුගේ හෝ උකස් ගන්නකුගේ ව්‍යාපාරයක් ;

(6) යම් රක්ෂණ ව්‍යාපාරයක් ;

(7) අධ්‍යාපනික ආයතනයක් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයක් ; හා

(8) නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුමැතිය ඇතිව ඇමතිවරයා විසින් පනවනු ලැබ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද ආඥාවක් මගින් පිරිවැටුම් ව්‍යාපාර පිරිවැටුම් බද්දෙන් නිදහස් කරනු ලැබිය හැකි ව්‍යාපාරයක්

ඊට ඇතුළත් නො වේ.

4. ප්‍රධාන පනතෙහි 122 වන වගන්තිය, ඒ වගන්තියේ අගට පහත සඳහන් උපවගන්තිය එකතු කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (4) 138 වන වගන්තිය යටතේ කරනු ලැබූ ආයාචනයක් අවසාන වශයෙන් තීරණය කිරීමේ දී (3) වන උපවගන්තිය යටතේ යම් මුදල් ප්‍රමාණයක් හෝ ප්‍රමාණ එකතු කරනු ලැබූ, යම් පැහැර හැරුණු බද්දක් අඩු කරනු ලැබූ අවස්ථාවක් වූ විට, ඒ මුදල් ප්‍රමාණය හෝ ප්‍රමාණ එසේ අඩු කරනු ලැබූ බද්ද අනුව ගණන් බැලිය යුතු ය."

5. පහත සඳහන් අලුත් වගන්තිය ප්‍රධාන පනතේ 123 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 123 (අ) වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:—

123 (අ) කොමසාරිස් විසින් කලින් කල මේ පනතේ කාර්යයන් සියල්ල හෝ ඉන් යමක් සඳහා පාවිච්චි කළ යුතු ආකෘති නියම කළ හැකි අතර එසේ නියම කරනු ලැබූ යම් ආකෘතියක් කොමසාරිස් විසින් කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම කළ හැකි ය ; නැතහොත් එසේ නියම කරනු ලැබූ යම් ආකෘතියක් වෙනුවට වෙන යම් ආකෘතියක් කොමසාරිස් විසින් යෙදිය හැකි ය. "

6. ප්‍රධාන පනතේ 125 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) 125 වන වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස ඒ වගන්තියට නැවත අංක යෙදීමෙන් ;

(ආ) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (2) යම් තක්සේරු වර්ෂයක යම් ත්‍රෛමාසිකයක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් (1) වන උප වගන්තිය යටතේ තක්සේරුවක් කරනු ලැබූ අවස්ථාවක, එසේ තක්සේරු කරනු ලැබූ මුදල ඒ ත්‍රෛමාසිකය සඳහා පැහැර හැරී ඇති ව්‍යාපාර පිරිවැටුම් බද්ද වශයෙන් සැලකිය යුතු අතර, ඒ අනුව, ඒ තැනැත්තා, 122 (2) වන වගන්තිය යටතේ ඒ ත්‍රෛමාසිකය සඳහා ඒ තැනැත්තා විසින් බද්ද ගෙවිය යුතුව තිබූ දින සිට, ඒ මුදල සම්බන්ධයෙන් 122 (3) වන වගන්තිය යටතේ වූ දණ්ඩනයට යටත් විය යුතු ය. "

7. ප්‍රධාන පනතේ 128 වන වගන්තිය, ඒ වගන්තියේ (ඇ) ඡේදයෙහි " ලැබුණු මුදල් " යන වචන වෙනුවට " ලැබුණු හෝ ලැබිය යුතු මුදල් " යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8. ප්‍රධාන පනතේ 138 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි " ඒ තක්සේරුවෙන් හෝ අතිරේක තක්සේරුවෙන් නියම කරන ලද ව්‍යාපාර පිරිවැටුම් බද්ද ගෙවිය යුතු ය. " යන වචන වෙනුවට " මෙම පනතෙහි මෙම කොටසින් තමා වෙත පවරනු ලැබූ යම් දණ්ඩනයක් සමග ඒ තක්සේරුවෙන් හෝ අතිරේක තක්සේරුවෙන් නියම කරන ලද ව්‍යාපාර පිරිවැටුම් බද්ද ගෙවිය යුතු ය :

එ සේ වුව ද ලංකාවෙන් බැහැර ව සිටීම, අසනීපය හෝ වෙනත් සාධාරණ කරුණක් හේතුකොටගෙන ඒ කාලසීමාව ඇතුළත ආයාචනා කිරීමෙන් ආයාචක වළක්වනු ලැබුවේ යයි කොමසාරිස් සෑහීමට පත් වූ විට, ආයාචනය ඉදිරිපත් කිරීම සඳහා කොමසාරිස් විසින් කාලය දීර්ඝ කිරීමක් ලබා දිය යුතු ය.";

සහ

(2) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (1අ) යම් තක්සේරුවකට විරුද්ධ ව ආයාචනා කරනු ලබන්නේ ද ඒ තක්සේරුව වාර්තාවක් නොමැති ව පිළියෙළ කර ඇති අවස්ථාවක, යථා පරිදි පිළියෙල කරන ලද වාර්තාවක් සමග ආයාචන පෙත්සම ඉදිරිපත් කළ යුතු ය.

(1ආ) ආයාචන පෙත්සමක් —

(අ) ආයාචනයක් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ දී ඇති කාල සීමාව ඉකුත් වීමෙන් පසු ඉදිරිපත් කරනු ලැබුවහොත්, හෝ

(ආ) (1අ) වන උපවගන්තියෙහි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම ආයාචක විසින් පැහැර හැර තිබේ නම්,

කොමසාරිස් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය. ".

9. 138 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන පනතෙහි 138 (අ) වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

138 (අ) (1) මණ්ඩලයේ තීරණය අවසාන තීරණය විය යුතු ය :

එ සේ වුව ද ආයාචක හෝ කොමසාරිස් හෝ විසින් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි අදහස් සඳහා මණ්ඩලය විසින් නීති ප්‍රශ්නයක් පිළිබඳ ව උපදෙස් විමසුම් නඩුවක් ඉදිරිපත් කිරීමට නියම කැරෙන ඉල්ලීමක් කළ හැකි ය. මණ්ඩලයේ තීරණයේ දිනයෙහි සිට මාසයක් ඇතුළත, රුපියල් පණහක ගාස්තුවක් සමග ඒ ඉල්ලීම ලිපියකට නග මණ්ඩලයේ ලිපිකරු වෙත භාර දුනහොත් මිස, එය පිළිනොගතයුතු ය. මණ්ඩලයේ තීරණය කොමසාරිස්ට හෝ ආයාචකට ලිපියකින් දන්වනු ලැබිය යුතු වුවහොත්, ඒ තැනැත්තන්ගෙන් යමකු විසින් උපදෙස් විමසුම් නඩුවක් ඉදිරිපත් කරනු ලැබීම සඳහා ඉල්ලනු ලබන කාල සීමාව නිශ්චය කර ගැනීමේ කාර්යයන් සඳහා, තීරණයේ දිනය තීරණය තමා වෙත දන්වනු ලබන නිවේදනයේ දිනය විය යුතු ය.

(2) කරුණු ද, මණ්ඩලයේ තීරණය ද, ආරාවුලට හේතු වූ ව්‍යාපාර පිරිවැටුම් බදු ප්‍රමාණය රුපියල් පන්දහකට වැඩි වන විට එය ද උපදෙස් විමසුම් නඩුවෙහි දැක්විය යුතු ය. තව ද එය ඉල්ලා සිටින පාර්ශ්වය විසින් එය ලැබීමෙන් පසු දින දහහතරක් ඇතුළත එය ප්‍රකාශ කිරීමෙන් හා අත්සන් කිරීමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණයට යැවිය යුතු ය.

(3) මුද්දර ආඥාපනතෙහි විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා —

(අ) මේ වගන්තිය යටතේ ප්‍රකාශ කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි උපදෙස් විමසුම් නඩුවක් පිළිබඳ ව, එබඳු නඩුවක් විභාග කිරීමට, නිශ්චය කිරීමට හෝ එබන්දකට සුදුස්සක් කිරීමට ආනුෂංගික වූ සියලු නීතිකෘත්‍ය රුපියල් පන් දහසක හෝ ආරාවුලට හේතු වූ ව්‍යාපාර පිරිවැටුම් බදු ප්‍රමාණය වශයෙන් (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් දක්විය හැකි, ඊට වැඩි මුදලක හෝ වටිනාකම ඇති, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි වූ සිවිල් නීතිකෘත්‍ය ලෙස සැලකිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් අමුණනු ලැබූ සියලු පොත්, ලේඛන හා කඩදසි සමග එබඳු සෑම උපදෙස් විමසුම් නඩුවක් ම ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි වූ සිවිල් නීතිකෘත්‍යවල එක ම ඉදිරිපත් කළ දෙය වශයෙන් සැලකිය යුතු ය ; තව ද

(ඇ) කොමසාරිස් ආයාචක වුවහොත් නිල බලයෙන් පමණක් වූ නඩුවක නඩු පවරන රජයේ නිලධරයෙකු වශයෙන් ද, ඔහු ආයාචනයෙහි වගඋත්තරකරු වුවහොත් නිල බලයෙන් පමණක් වූ නඩුවක විරුද්ධව නඩු පවරනු ලැබූ රජයේ නිලධරයකු වශයෙන් ද සැලකිය යුතු ය.

(4) උපදෙස් විමසුම් නඩුවක් ඉල්ලා සිටින පාර්ශ්වය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට උපදෙස් විමසුම් නඩුව යවන වේලාවෙහි හෝ ඊට පෙර ඔහුගේ ඉල්ලීම පරිදි උපදෙස් විමසුම් නඩුව ප්‍රකාශ කරනු ලැබූ බව සඳහන් වන ලිපිගත දැන්වීමක් අනුව පාර්ශ්වයට යැවිය යුතු අතර, ඔහු විසින් උපදෙස් විමසුම් නඩුවෙහි පිටපතක් ඒ පාර්ශ්වයට සැපයිය යුතු ය.

(5) ශ්‍රේෂ්ඨාධිකරණයෙහි යම් විනිශ්චයකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් සංශෝධනය කිරීම සඳහා උපදෙස් විමසුම් නඩුවක් ආපසු යවනු ලැබීමට සැලැස්විය යුතු අතර, එවිට ඒ අනුව උපදෙස් විමසුම් නඩුව සංශෝධනය කළ යුතු ය.

(6) උපදෙස් විමසුම් නඩුවෙන් පැන නඟින යම් නීති ප්‍රශ්නයක් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි යම් විනිශ්චයකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් විභාග කොට නිශ්චය කළ යුතු ය. තව ද ඒ ප්‍රශ්නය පිළිබඳ ව අධිකරණයෙහි තීරණය ප්‍රකාර, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ තක්සේරුව ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම ඒ විනිශ්චයකරුවන් විසින් කළ හැකි ය, නැතහොත් ඒ පිළිබඳ ව අධිකරණයෙහි අදහස් සමග උපදෙස් විමසුම් නඩුව මණ්ඩලය වෙත නැවත යැවිය හැකි ය. අධිකරණය විසින් උපදෙස් විමසුම් නඩුවක් එ සේ නැවත යවනු ලැබූ කල්හි, අධිකරණයේ අදහසට අවශ්‍ය විය හැකි පරිදි මණ්ඩලය විසින් තක්සේරුව ප්‍රතිශෝධනය කළ යුතුය.

(7) ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි මෙම වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යයක දී ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගාස්තු සම්බන්ධයෙන් ද, (1) වන උපවගන්තිය යටතේ ගෙවනු ලැබූ මුදල සම්බන්ධයෙන් ද අධිකරණයට සුදුසු යයි හැඟෙන ආඥාවක් අධිකරණය විසින් කළ හැකි ය.

(8) (6) වන උපවගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලැබූ යම් ආඥාවකට විරුද්ධව කොමසාරිස්ට හෝ වෙන යම් පාර්ශ්වයකට රාජසභාගත මහා රාජෝත්තමියට ආයාචනා කිරීමට හැකි කරවීමේ කාර්යය සඳහාත්, ( රාජාධිකරණයේ ) ආයාචනා ආඥාපනතෙහි විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහාත් —

(අ) (7) වන උපවගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලැබූ යම් ආඥාවක් සමග (6) වන උපවගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලැබූ ආඥාවක් කොමසාරිස් හා අනෙක් යම් පාර්ශ්වයක් අතර සිවිල් නඩුවක ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසාන නඩු තීන්දුවක් ලෙස සැලකිය යුතු ය ;

(ආ) ඒ සිවිල් නඩුවෙහි ආරාවුලට හේතු වූ කරුණෙහි වටිනාකම රුපියල් පන්දහසක් ලෙස සැලකිය යුතු ය :

එ සේ වුව ද ආරාවුලට හේතු වූ අයබදු වල ප්‍රමාණය වශයෙන් රුපියල් පන්දහසකට වැඩි වූ ගණනක් (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් දක්වා ඇති විටෙක, ඒ සිවිල් නඩුවෙහි ආරාවුලට හේතු වූ කරුණෙහි වටිනාකම මණ්ඩලය විසින්, එසේ දක්වනු ලැබූ වැඩි ගණන විය යුතු ය ; තවද

(ඇ) රාජසභාගත මහා රාජෝත්තමියට කොමසාරිස් විසින් කරනු ලබන ආයාචනයක දී (රාජාධිකරණයේ) ආයාචන ආඥාපනතින් හෝ එය යටතේ නියමිත යම් තැන්පත් මුදලක් තබන ලෙස හෝ යම් ගාස්තුවක් ගෙවන ලෙස හෝ යම් ඇපයක් දෙන ලෙස ඔහුට නියම නො කළ යුතු ය.''

10. ප්‍රධාන පනතේ 151 වන වගන්තිය, ඒ වගන්තියේ (5) වන උපවගන්තියෙහි, පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියෙහි (අ) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

'' (අඅ) යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලිපියක් දක්නට ලැබිය හැකි යම් භාජනයක් විවෘත කොට පරීක්ෂා කිරීම සහ එහි ලා දක්නට ලැබෙන භාණ්ඩ අතුරෙන් යමක් පිළිබඳව බඩු ලේඛනයක් සකස් කිරීම ; ''

(2) ඒ උපවගන්තියෙහි (ආ) ඡේදයෙහි '' පිටපත් ගැනීම '' යන වචන වෙනුවට '' පරීක්ෂා කොට පිටපත් ගැනීම '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ උපවගන්තියෙහි (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

'' (අඅ) ඒ ස්ථානයෙහි හෝ ගොඩනැගිල්ලෙහි දක්නට ලැබෙන මුදල් වහා ම ගැණ, එය සටහන් කර තැබීම ; ''

11. ප්‍රධාන පනතේ 152 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන්.

(2) නැවත අංක කරනු ලැබූ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් උපවගන්තිය එක් කිරීමෙන් :—

'' (2) 122 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන අනුව යම් මුදලක් ගණන් බලනු ලැබුවේ නම් ඒ මුදලට වැඩිපුර වශයෙන් ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි සඳහන් යම් මුදලක් ගෙවනු ලැබූ බව ලියවිල්ලකින් ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් කියාපෑමක් මගින් කොමසාරිස් සෑහීමට පත්වන අයුරු ඔප්පු කරනු ලබන අවස්ථාවක, ඉහත කී (3) වන උපවගන්තියෙහි සඳහන් මුදල ගෙවනු ලැබූ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ තුනක් ඇතුළත ඒ හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු ලැබුවේ නම් එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ගෙවනු ලැබීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.''

12. ප්‍රධාන පනතේ 154 වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි '' මේ පනතේ මේ කොටස යටතේ යම් යුතුකමක් ඉටු කිරීම සඳහා ඒ දෙපාර්තමේන්තුව වෙනම යම් නිලධරයකුහට දැන්වීම අවශ්‍ය වුවහොත්, '' යන වචන වෙනුවට '' මේ පනතේ මේ කොටස යටතේ හෝ ඒ වෙන යම් ලිඛිත නීතිය යටතේ යම් යුතුකමක් ඉටුකිරීම සඳහා ඒ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයකුහට දැන්වීම අවශ්‍ය වුවහොත්, '' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. (1) ප්‍රධාන පනතේ 159 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියෙහි පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) " බලයලත් නියෝජිතයා " යන්නේ අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

" බලයලත් නියෝජිතයා " යන්නෙන් —

(1) මේ පනතේ කාර්යය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තකු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබුවා වූ ත් —

(අ) යම් අවස්ථාවක් සම්බන්ධයෙන් :

(1) ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි සාමාජිකයකු,

(2) කොමසාරිස් විසින් අනුමත කරනු ලැබූ ගණකාධිකාරියකු,

(3) අධිනීතිඥයකු හෝ නීතිඥයකු, හෝ

(4) සම්බන්ධ තැනැත්තා විසින් අඛණ්ඩ ව සේවයෙහි යොදවනු ලැබූ තැනැත්තකු ද

(ආ) පුද්ගලයෙකු සම්බන්ධයෙන්, නෑයෙක් ද

(ඇ) සමාගමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයකු හෝ ලේකම් ද

(ඈ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් හවුල් කරුවකු ද

(ඉ) පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් ඒ මණ්ඩලයේ සාමාජිකයෙකු ද

වන්නාවූත් තැනැත්තෙක් ; හෝ

(2) බලය පැවරීමෙහි නිශ්චිතව සඳහන් යම් තක්සේරු වර්ෂයකට අදල කරුණු සම්බන්ධයෙන් මේ පනතේ කාර්යයන් සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තකු විසින් කලින් කල බලය පවරනු ලබන්නාවූත් සමාගම්වල ( ගණන් පරීක්ෂක ) නියෝග යටතේ ලියා පදිංචිකරනු ලැබූ පුද්ගලයකු වීම නිසා කොමසාරිස් විසින් අනුමත කරනු ලබන්නාවූත් තැනැත්තෙක්

අදහස් වේ. ' ;

(ආ) " පුද්ගල මණ්ඩලය " යන්නේ අර්ථකථනයෙහි " හා එක්ව වාසය කරන යම් හින්දු පවුලක් ඇතුළත් වේ. එහෙත් සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් එයට ඇතුලත් නො වේ. " යන වචන වෙනුවට " යම් හවුල් ව්‍යාපාරයක් හා එක්ව වාසය කරන යම් හින්දු පවුලක් ඇතුළත් වේ. " යන වචන ආදේශ කිරීමෙන් ; තවද

(ඇ) " පිරිවැටුම " යන්නේ අර්ථකථනයෙහි " ඒ ව්‍යාපාරය පිළිබඳව ඉටු කරනු ලැබූ කාර්යයන්ගෙන් " යන වචන වෙනුවට " ඒ ව්‍යාපාරය පිළිබඳව ඉටුකරනු ලැබූ කාර්යයන්ගෙන් හෝ ඒ ව්‍යාපාරය පවත්වාගෙන යාමෙහි ලා ඉටුකරනු ලැබූ සේවාවන් සඳහා " යන වචන ආදේශ කිරීමෙන්.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදයෙන් ප්‍රධාන පනතෙහි කරනු ලැබූ සංශෝධනය 1964 ජනවාරි 1 වන දින සිට වලංගුවූ ලෙස සැලකිය යුතු ය.

## ( ආ ) කොටස

චක්‍රලේඛ අංක 26

ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590,
කොළඹ,
1968 මැයි මස 5 වැනි දින.

### අත්තිකාරම් සඳහා මහ බැංකු පොළී අනුපාතික

( මුදල් නීති පනතේ 83 සහ 87 වැනි වගන්ති සම්බන්ධවයි. )

1. 1968 මැයි මස 6 වැනි දින සිට රජය විසින් ඔඩපිත හා රජය විසින් ඇප වූ සුරැකුම් පත් ඇපයට තබා මහ බැංකුවෙන් වෙළෙඳ බැංකු වලට දෙන අත්තිකාරම් සඳහා පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 5½ ක් විය යුතුය.

2. 1968 මැයි මස 6 වැනි දින සිට වාණිජ හා නිෂ්පාදන ණය සඳහා වූ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා මහ බැංකුවෙන් වෙළෙඳ බැංකු වලට දෙන අත්තිකාරම් සඳහා පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 5½ ක් විය යුතුය.

3. 1965 මැයි මස 27 වැනි දින හා අංක 20 දරන චක්‍රලේඛය මෙයින් ඉවත් කරගනු ලැබේ.

කේ. ගුණරත්නම්
වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරී,
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

චක්‍රලේඛ අංකය : 27

ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590,
කොළඹ 1.
1968 මැයි 30 වැනි දින.

වෙළෙඳ බැංකු ණය

1962 දෙසැම්බර් මස 28 වැනි දින හා අංක 17 දරන චක්‍රලේඛයේ පළමු වැනි ඡේදයේ අගට පහත සඳහන් වැකිය එක් කිරීමෙන් එකී චක්‍රලේඛය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" එසේ වුවද, නිශ්චල දේපළ ( වතු හැර ) මිල දී ගැනීම සඳහා වන බැංකු ණය කෙරෙහි පනවා ඇති සීමාව ලිහිල් කිරීමට අවකාශ ඇතැයි සෑහීමකට පත් විය හැකි වන අවස්ථාවන්හි දී, අනුග්‍රාහකයෙකු වෙනුවෙන් වෙළෙඳ බැංකුවක් විසින් කැරෙන ඉල්ලීමක් උඩ, එවැනි ලිහිල් සැලැසීම ගැන සලකා බැලීමට මහ බැංකුව කැමති වනු ඇත. "

කේ. ගුණරත්නම්

වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරි,
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩබ්ලිව්. තෙන්නකෝන්

අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

චක්‍රලේඛ අංක 28

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1968 අගෝස්තු 14 වැනි දින.

## විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිළට ගැනීම සඳහා විනිමය අනුපාතික

1. ලංකාවේ වෙළෙඳ බැංකු වෙතින්, විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිලට ගැනීම සඳහා මහ බැංකුවේ අනුපාතිකයන් පහත සඳහන් පරිදි වෙයි :

| ව්‍යවහාර මුදල් | | මහ බැංකුවේ මිළට ගැනුම් අනුපාතිකය | |
|---|---|---|---|
| | | රු. ශ. | |
| ඕස්ට්‍රේලියානු ඩොලර් | ( ඩො. 1/- ) | 6.55 | බැගින් |
| ඕස්ට්‍රියානු ෂිලිං | ( ෂි. 100/- ) | 22.40 | ,, |
| කැනේඩියානු ඩොලර් | ( ඩො. 1/- ) | 5.40 | ,, |
| හොංකොං ඩොලර් | ( ඩො. 10/- ) | 9.60 | ,, |
| ඉතාලි ලීරා | ( ලීරා 1000/- ) | 9.30 | ,, |
| මැලේසියානු ඩොලර් | ( ඩො. 10/- ) | 19.05 | ,, |
| නෙදර්ලන්ත ෆ්ලෝරින් | ( ෆ්ලෝ. 10/- ) | 16.10 | ,, |
| සිංගප්පූරු ඩොලර් | ( ඩො. 10/- ) | 19.05 | ,, |
| ස්විස් ෆ්‍රෑන්ක් | ( ෆ්‍රෑ. 10/- ) | 13.35 | ,, |
| එ. රා. පවුම් | ( පවුම් 1/- ) | 14.05 | ,, |
| එ. ජ. ඩොලර් | ( ඩො. 1/- ) | 5.85 | ,, |

2. ඉහත 1 වැනි ඡේදයේ සඳහන් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු වෙළෙඳ බැංකු විසින් මිලට ගැනීමේදී පහත සඳහන් අනුපාතිකයන් අදාල වේ.

| ව්‍යවහාර මුදල් | | වෙළෙඳ බැංකුවල මිළට ගැනුම් අවම අනුපාතිකය | |
|---|---|---|---|
| | | රු. ශ. | |
| ඕස්ට්‍රේලියානු ඩොලර් | ( ඩො. 1/- ) | 6.50 | බැගින් |
| ඕස්ට්‍රියානු ෂිලිං | ( ෂිලිං 100/- ) | 22.35 | ,, |
| කැනේඩියානු ඩොලර් | ( ඩො. 1/- ) | 5.35 | ,, |
| හොංකොං ඩොලර් | ( ඩො. 10/- ) | 9.55 | ,, |
| ඉතාලි ලීරා | ( ලීරා 1000/- ) | 9.25 | ,, |
| මැලේසියානු ඩොලර් | ( ඩො. 10/- ) | 19.00 | ,, |
| නෙදර්ලන්ත ෆ්ලෝරින් | ( ෆ්ලෝ. 10/- ) | 16.05 | ,, |
| සිංගප්පූරු ඩොලර් | ( ඩො. 10/- ) | 19.00 | ,, |
| ස්විස් ෆ්‍රෑන්ක් | ( ෆ්‍රෑ. 10/- ) | 13.30 | ,, |
| එ. රා. පවුම් | ( පවුම් 1/- ) | 14.00 | ,, |
| එ. ජා. ඩොලර් | ( ඩො. 1/- ) | 5.80 | ,, |

කේ. ගුණරත්නම්
ප්‍රධාන ගණකාධිකාරී

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.

චක්‍රලේඛ අංක 28

සංශෝධනය 28. 8. 68

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1968 අගෝස්තු 28 වැනිද.

## විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිළට ගැනීම සඳහා විනිමය අනුපාතික

1. ලංකාවේ වෙළෙඳ බැංකු වෙතින්, විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිලට ගැනීම සඳහා මහ බැංකුවේ අනුපාතිකයන් පහත සඳහන් පරිදි වෙයි.

| ව්‍යවහාර මුදල් | | මහ බැංකුවේ මිළට ගැනුම් අනුපාතිකය රු. ශ. | |
|---|---|---|---|
| ඕස්ට්‍රෙලියානු ඩොලර් | ( ඩො. 1/– ) | 6.55 | බැගින් |
| ඔස්ට්‍රියානු ෂිලිං | ( ෂිලිං 100/– ) | 22.40 | ,, |
| කැනේඩියානු ඩොලර් | ( ඩො. 1/– ) | 5.40 | ,, |
| ඩොයිට්ෂ්ව් මාක් — ( බටහිර ජර්මනිය ) | ( ඩො.මා 10/– ) | 14.55 | ,, |
| හොංකොං ඩොලර් | ( ඩො. 10/– ) | 9.60 | ,, |
| ඉතාලි ලීරා | ( ලීරා 1000/– ) | 9.30 | ,, |
| මැලේසියානු ඩොලර් | ( ඩො. 10/– ) | 19.05 | ,, |
| නෙදර්ලන්ත ෆ්ලෝරින් | ( ෆ්ලෝ. 10/– ) | 16.10 | ,, |
| සිංගප්පූරු ඩොලර් | ( ඩො. 10/– ) | 19.05 | ,, |
| ස්විස් ෆ්‍රෑන්ක් | ( ෆ්‍රෑ. 10/– ) | 13.35 | ,, |
| එ. රා. පවුම් | ( පවුම් 1/– ) | 14.05 | ,, |
| එ. ජා. ඩොලර් | ( ඩො. 1/– ) | 5.85 | ,, |

2. ඉහත 1 වැනි ඡෙදයේ සඳහන් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු වෙළෙඳ බැංකු විසින් මිළට ගැනීමේදී පහත සඳහන් අනුපාතිකයන් අදල වේ.

| ව්‍යවහාර මුදල් | | වෙළෙඳ බැංකුවල මිළට ගැනුම් අවම අනුපාතිකය රු. ශ. | |
|---|---|---|---|
| ඕස්ට්‍රෙලියානු ඩොලර් | ( ඩො. 1/– ) | 6.50 | බැගින් |
| ඔස්ට්‍රියානු ෂිලිං | ( ෂිලිං 100/– ) | 22.35 | ,, |
| කැනේඩියානු ඩොලර් | ( ඩො. 1/– ) | 5.35 | ,, |
| ඩොයිට්ෂ්ව් මාක් — ( බටහිර ජර්මනිය ) | ( ඩො.මා. 10/– ) | 14.50 | ,, |
| හොංකොං ඩොලර් | ( ඩො. 10/– ) | 9.55 | ,, |
| ඉතාලි ලීරා | ( ලීරා 1000/– ) | 9.25 | ,, |
| මැලේසියානු ඩොලර් | ( ඩො. 10/– ) | 19.00 | ,, |
| නෙදර්ලන්ත ෆ්ලෝරින් | ( ෆ්ලෝ. 10/– ) | 16.05 | ,, |
| සිංගප්පූරු ඩොලර් | ( ඩො. 10/– ) | 19.00 | ,, |
| ස්විස් ෆ්‍රෑන්ක් | ( ෆ්‍රෑ. 10/– ) | 13.30 | ,, |
| එ. රා. පවුම් | ( පවුම් 1/– ) | 14.00 | ,, |
| එ. ජ. ඩොලර් | ( ඩො. 1/– ) | 5.80 | ,, |

කේ. ගුණරත්නම්
ප්‍රධාන ගණකාධිකාරි

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.

චක්‍රලේඛ අංක 28

( සංශෝධනය 18. 9. 68 )

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1968 සැප්තැම්බර් 18 වැනි දා.

**විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිළට ගැනීම සඳහා විනිමය අනුපාතික**

1. ලංකාවේ වෙළෙඳ බැංකු වෙතින්, විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිළට ගැනීම සඳහා මහ බැංකුවේ අනුපාතිකයන් පහත සඳහන් පරිදි වෙයි :—

| ව්‍යවහාර මුදල් | | මහ බැංකුවේ මිළට ගැනුම් අනුපාතිකය | |
|---|---|---|---|
| | | රු. ශ. | |
| ඔස්ට්‍රේලියානු ඩොලර් | ( ඩො. 1/- ) | 6.55 | බැගින් |
| ඔස්ට්‍රියානු ෂිලිං | ( ෂිලිං 100/- ) | 22.40 | ,, |
| කැනේඩියානු ඩොලර් | ( ඩො. 1/- ) | 5.40 | ,, |
| ඩොයිට්ෂ්ච් මාක් — ( බටහිර ජර්මනිය ) | ( ඩො.මා.10/- ) | 14.55 | ,, |
| ප්‍රංශ ප්‍රෑන්ක් | ( ප්‍රෑ. 10/- ) | 11.80 | ,, |
| හොංකොං ඩොලර් | ( ඩො. 10/- ) | 9.60 | ,, |
| ඉතාලි ලීරා | ( ලීරා 1000/- ) | 9.30 | ,, |
| මැලේසියානු ඩොලර් | ( ඩො. 10/- ) | 19.05 | ,, |
| නෙදර්ලන්ත ෆ්ලෝරින් | ( ෆ්ලෝ. 10/- ) | 16.10 | ,, |
| සිංගප්පූරු ඩොලර් | ( ඩො. 10/- ) | 19.05 | ,, |
| ස්විස් ප්‍රෑන්ක් | ( ප්‍රෑ. 10/- ) | 13.35 | ,, |
| එ. රා. පවුම් | ( පවුම් 1/- ) | 14.05 | ,, |
| එ. ජ. ඩොලර් | ( ඩො. 1/- ) | 5.85 | ,, |

2. ඉහත 1 වැනි ඡේදයේ සඳහන් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු වෙළෙඳ බැංකු විසින් මිළට ගැනීමේ දී පහත සඳහන් අනුපාතිකයන් අදාල වේ.

| ව්‍යවහාර මුදල් | | වෙළෙඳ බැංකුවල මිළට ගැනුම් අවම අනුපාතිකය | |
|---|---|---|---|
| | | රු. ශ. | |
| ඔස්ට්‍රේලියානු ඩොලර් | ( ඩො. 1/- ) | 6.50 | බැගින් |
| ඔස්ට්‍රියානු ෂිලිං | ( ෂිලිං 100/- ) | 22.35 | ,, |
| කැනේඩියානු ඩොලර් | ( ඩො. 1/- ) | 5.35 | ,, |
| ඩොයිට්ෂ්ච් මාක් — ( බටහිර ජර්මනිය ) | ( ඩො.මා.10/- ) | 14.50 | ,, |
| ප්‍රංශ ප්‍රෑන්ක් | ( ප්‍රෑ. 10/- ) | 11.75 | ,, |
| හොංකොං ඩොලර් | ( ඩො. 10/- ) | 9.55 | ,, |
| ඉතාලි ලීරා | ( ලීරා 1000/- ) | 9.25 | ,, |
| මැලේසියානු ඩොලර් | ( ඩො. 10/- ) | 19.00 | ,, |
| නෙදර්ලන්ත ෆ්ලෝරින් | ( ෆ්ලෝ. 10/- ) | 16.05 | ,, |
| සිංගප්පූරු ඩොලර් | ( ඩො. 10/- ) | 19.00 | ,, |
| ස්විස් ප්‍රෑන්ක් | ( ප්‍රෑ. 10/- ) | 13.30 | ,, |
| එ. රා. පවුම් | ( පවුම් 1/- ) | 14.00 | ,, |
| එ. ජ. ඩොලර් | ( ඩො. 1/- ) | 5.80 | ,, |

කේ. ගුණරත්නම්
ප්‍රධාන ගණකාධිකාරී

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.

චක්‍රලේඛ අංකය : 29

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ. 1.
1968 නොවැම්බර් මස 1 වැනි දින.

**ප්‍රතිමූල්‍යෝපජනය — මැදි හා දිගුකාලීන ණය සම්බන්ධ පොළී ප්‍රමාණයන්**

මුදල් නීති පණතේ 88 අ (1) (ආ) වගන්තිය ( 1963 අංක 11 දරන මුදල් පණතේ 67 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි ) සම්බන්ධවයි.

මහ බැංකුව විසින් ණය දෙන ආයතන වෙත දෙන ලද ප්‍රතිමූල්‍යෝපජන ණයවල පොළී ප්‍රමාණයන් මෙසේයි :—

(අ) මේ පහසුකම් ලබාගන්නා ණය දෙන ආයතන විසින් සිය ගනුදෙනුකරුවන් වෙත දෙනු ලබන හා මහ බැංකුව වෙතින් ප්‍රති මූල්‍යෝපජනයක් සෙවුන ණය වලට වර්ෂයකට 7% වඩා අය නොකරන්නේ නම් කෘෂිකර්මය හෝ කර්මාන්ත නගා සිටුවීමට හෝ දියුණු කිරීම සඳහා වන ණය සම්බන්ධයෙන් වර්ෂයකට 4% කි.

(ආ) තේ කර්මාන්ත ශාලා නවීකරණයට හා/ හෝ නව තේ කර්මාන්ත ශාලා ඉදි කිරීමට දෙන ලද හා ගෙවිය යුතු පොළියෙන් කොටසක් තේ පාලක විසින් ගෙවනු ලබන ණය වල පොළී ප්‍රමාණයන් මෙසේ යි :—

(1) මේ පහසුකම ලබාගන්නා ණය දෙන ආයතන විසින් දෙනු ලබන හා මහ බැංකුව වෙතින් ප්‍රති මූල්‍යෝපජනයක් සෙවුන ණය සඳහා වර්ෂයකට 8½%කට වඩා අය නොකරන්නේ නම්, එකී තේ කර්මාන්තශාලා නවීකරණයට හා/හෝ නව තේ කර්මාන්තශාලා ඉදි කිරීමට වැය වූ දේශීය වියදම් ආවරණය කිරීම් වස් දෙන ලද ප්‍රති මූල්‍යෝපජන ණය සම්බන්ධයෙන් වර්ෂයකට 5% කි.

(2) මේ පහසුකම ලබාගන්නා ණය දෙන ආයතන විසින් සිය ගනුදෙනුකරුවන් වෙත දෙනු ලබන හා මහ බැංකුව වෙතින් ප්‍රති මූල්‍යෝපජනයක් සෙවුන ණය සඳහා වර්ෂයකට 8½% කට වඩා අය නොකරන්නේ නම්, එකී තේ කර්මාන්ත ශාලා නවීකරණයට හා / හෝ නව තේ කර්මාන්ත ශාලා ඉදි කිරීමට වැය වූ විදේශ විනිමය වියදම් ආවරණය කිරීම් වස් දෙන ලද ප්‍රති මූල්‍යෝපජන ණය සම්බන්ධයෙන් වර්ෂයකට 7% කි.

(ඇ) වාණිජ, වෙළෙඳ හෝ ව්‍යාපාර කටයුතු නගා සිටුවීමට හෝ දියුණු කිරීමට දෙනු ලබන ණය සඳහා වන පොළී ප්‍රමාණය වර්ෂයකට 5½% කි.

1966 අප්‍රේල් 6 වැනි දින හා අංක. 23 දරන චක්‍ර ලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ.

කේ. ගුණරත්නම්
ප්‍රධාන ගණකාධිකාරි

ඩබ්ලිව්. තෙන්නකෝන්
අධිපති.